# සේවක අර්ථසාධක අරමුදල

# වාර්ෂික වාර්තාව

# 2016

ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන රුපියල් ට්‍රිලියන 1.8 ක් ඉක්මවූ වත්කමක් පාලනය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල, එහි වත්කම් පදනම 2016 වසරේ දී ද අඛණ්ඩ වර්ධනය තවදුරටත් පවත්වා ගන්නා ලදී. එසේම අරමුදල සිය සාමාජිකයන්ට සපයන සේවාවන් හි ගුණාත්මකභාවය ඉහළ නැංවීමට සහ සාමාජිකයන්ට සාධාරණ ප්‍රතිලාභයක් ලබා දීමට මෙන්ම අරමුදලේ සුරක්ෂිතභාවය තහවුරු කරගැනීමට සමත් විය. ඒ අනුව, අරමුදලේ ශුද්ධ වටිනාකම 2015 වසර අග වාර්තා වූ රුපියල් බිලියන 1,664.9 ට සාපේක්ෂව 2016 වසර අගදී රුපියල් බිලියන 1,841.5 ක් දක්වා සියයට 10.6 කින් වර්ධනය විය. වර්ෂය තුළදී, සේවක අර්ථසාධක අරමුදල එහි සුරක්ෂිතභාවය සහ වර්ධනය පවත්වා ගනිමින් එහි සාමාජිකයන්ට ඵලදායී සේවාවන් රැසක් සමග ඉහළම විශ්‍රාම ප්‍රතිලාභ සපයන ලදී.

සේවක අර්ථසාධක අරමුදල, අරමුදල් කළමනාකරණ කාර්යයන් සාර්ථක ලෙස මෙහෙයවමින් මෙතෙක් වාර්තා වූ වැඩිම ආයෝජන ආදායම් වාර්තාව වන රුපියල් බිලියන 193 ක ආදායමක් උපයා ගැනීමට 2016 වසරේදී සමත් විය. ඒ අනුව, අරමුදලේ මුළු ආයෝජන වටිනාකම රුපියල් බිලියන 1,772 ක් දක්වා ළඟා විය. එසේම කොටස් වෙළෙඳපළේ ඇති වූ අයහපත් වාතාවරණය සහ වෙළඳපළ පොලී අනුපාතවල පැවති ඉහළ උච්චාවචනය යටතේ වුවද සේවක අර්ථසාධක අරමුදලට සිය සාමාජිකයන් හට සියයට 10.5 ක ආකර්ෂණීය ප්‍රතිලාභ අනුපාතයක් ලබා දීමට හැකියාව ලැබී ඇත.

# පටුන

පිටුව

## 1 කොටස


දැක්ම හා මෙහෙවර 1
මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය 2
කම්කරු කොමසාරිස් ජනරාල්තුමියගේ පණිවිඩය 4
මූල්‍ය තොරතුරු 8
මෙහෙයුම් තොරතුරු 10
නියාමන රාමුව 12
ආර්ථික සමාලෝචනය 14
සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය 18


## 2 කොටස


මූල්‍ය ප්‍රකාශන

ආදායම් හා වියදම් ප්‍රකාශනය 29
විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය 30
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය 31
ලැබීම් හා ගෙවීම් ගිණුම 32
ආයෝජන ප්‍රකාශනය 33
හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයින්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය 34
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 35

මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

1. සංස්ථාපිත තොරතුරු 36
2. ගිණුම්කරණ පදනම 36
3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති 38
4. වාර්තා කරන දිනට ප්‍රකාශයට පත් කරන ලද නමුත් තවම භාවිතයට නොගත් නව ප්‍රමිතීන් 48
5. පොලී ආදායම් 50
6. ලාභාංශ ආදායම 50
7. මූල්‍ය වත්කම් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ/(පාඩු) 50
8. කල්පිරීම තෙක් තබාගෙන ඇති මූල්‍ය වත්කම් මත ක්‍රමක්ෂය ලාභ 51
9. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ලාභ/(පාඩු) 51
10. මූල්‍ය වත්කම් හානිකරණය 51
11. වෙනත් ආදායම් 52
12. මෙහෙයුම් වියදම් 52
13. ආදායම් බදු වියදම 52
14. විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස්වීම් මත ශුද්ධ ලාභය/(අලාභය) 52

15. දේපළ, පිරියත හා උපකරණ 53
16. අස්පෘශ්‍ය වත්කම් 56
17. ලාභ/අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම් 56
18. විකිණීමට ඇති මූල්‍ය වත්කම් 59
19. කල්පිරීම තෙක් තබාගත් මූල්‍ය වත්කම් 63
20. ණය හා ලැබිය යුතු මුදල් 69
21. වෙනත් ජංගම වත්කම් 69
22. මුදල් හා මුදල් සමාන වත්කම් 69
23. ණය හිමියෝ 70
24. වෙනත් ජංගම වගකීම් 70
25. සාමාජික ශේෂ 70
26. සංචිත 71
27. ලැබීම් 72
28. ගෙවීම් 73
29. ආයෝජනයන්හී වෙනස්වීම 74
30. මූල්‍ය උපකරණවල සාධාරණ අගය 76
31. මූල්‍ය අවදානම් කළමනාකරණ අරමුණු, ප්‍රතිපත්ති සහ ක්‍රියාවලිය 77
32. ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය 79

**විගණකාධිපති වාර්තාව** 82

## 3 කොටස

**සංඛ්‍යා සටහන්**

1. ආයෝජන, කල්පිරීම් හා ආයෝජන මත ප්‍රතිලාභ (1984-2016) 309
2. සාමාජික ශේෂ මත ප්‍රතිලාභ අනුපාතිකය (1984-2016) 310
3. සාමාජික ශේෂ, සාමාජික ශේෂ මත පොලී සහ සඵල පොලී අනුපාතිකය (1984-2016) 311
4. ආයෝජන කළඹ පිළිබඳ ප්‍රකාශනය (1984-2016) 312
5. සංක්ෂිප්ත මුදල් ප්‍රවාහය (මුදල් මණ්ඩලය) (1984-2016) 313
6. සංක්ෂිප්ත ආදායම් ප්‍රකාශනය (1994-2016) 314

# අපගේ දැක්ම

සමෘද්ධිමත් විශ්‍රාම දිවියක් සාමාජිකයන් වෙත ලබා දීමට හැකිවන අයුරින් කලාපයේ වඩාත් විශ්වාසදායී විශ්‍රාම අරමුදල බවට පත්වීම

# අපගේ මෙහෙවර

නව්‍ය හා විචක්ෂණශීලී කළමනාකරණය තුලින් ඉහළම විශ්‍රාම ප්‍රතිලාභයක් හා කාර්යක්ෂම සේවාවක් සාමාජිකයන් වෙත ලබාදීම



# මුදල් මණ්ඩලයේ සභාපති සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමන්ගේ පණිවිඩය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ./අරමුදල) 2016 වාර්ෂික වාර්තාව සඳහා මෙම පණිවුඩය මා ඉදිරිපත් කරන්නේ ඉමහත් සතුටිනි.

අරමුදලේ මුළු වත්කම් ප්‍රමාණය 2015 වසරේ දී වූ රුපියල් බිලියන 1,668 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 1,845 දක්වා සියයට 11 කින් වර්ධනය වූ බව සතුටින් සඳහන් කරන අතර එහි සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 16.9 සිට මිලියන 17.3 දක්වා වර්ධනය විය. තවද, ආකර්ෂණීය සාමාජික ප්‍රතිලාභ ලඟාකර දීමේ අරමුණ සාක්ෂාත් කරමින්, මෙම වසර තුළ සියයට 11.43 ක ආයෝජන මත ප්‍රතිලාභයක් වාර්තා කිරීමට අරමුදල සමත් විය. මෙමගින් අඛණ්ඩව 11 වන වසරටත් සංඛ්‍යා දෙකකින් යුත් ලාභාංශ අනුපාතිකයක් ප්‍රකාශයට පත් කිරීමට අරමුදලට හැකියාව ලැබුණි. මෙහි දී ඉහළ ප්‍රතිඵල අත්කර දීමේ අරමුදල සතු හැකියාව තවදුරටත් තහවුරු කරමින් 2016 වසර සඳහා සිය සාමාජිකයින්ට සියයට 10.5 ක ලාභාංශ අනුපාතයක් ලබාදීමට හැකි විය. අභියෝගාත්මක වෙළඳපොළක් තුළ එවන් ආකර්ෂණීය ලාභාංශ අනුපාතිකයක් අත්පත් කර ගැනීම සඳහා විචක්ෂණශීලී ආයෝජන කළමනාකරණය දායක විය.

සාමාජිකයන්ගේ අරමුදල් ආරක්ෂා කරමින් හා විචක්ෂණශීලී ආයෝජන සිදු කරමින්, සාමාජික බැඳියාවන් සුරක්ෂිත කරන අතර, මෙහෙයුම් ක්‍රියාකාරකම් හි කාර්යක්ෂමතාව වැඩි කිරීම මගින් ලබාගත් පිරිවැය ඉතිරි කිරීම තුළින් වැඩි ලාභාංශ ප්‍රතිශතයක් සාමාජිකයන් වෙත ප්‍රේෂණය කිරීමට හැකියාව ලැබුණි. නව ව්‍යාපෘතීන් සහ ක්‍රියාදාමයන් ක්‍රියාවට නැංවීම තුළින් සේ.අ.අ. සිය සාමාජිකයන් වෙත වඩාත් මිත්‍රශීලී සේවාවක් සැපයීමට නිරන්තරයෙන් අපේක්ෂා කරයි. ඒ අනුව, අරමුදලෙහි සාමාජිකයන්ට වඩාත් ගුණාත්මක සේවාවක් සැපයීමේ අදහසින් ව්‍යාපෘති කිහිපයක් 2016 වසරේ දී ක්‍රියාවට නංවන ලදී.

ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර 2015 වසරේ දී සාර්ථකව නිමාවට පත්වීමත් සමග වැදගත් සහ නිතර භාවිත කරන සෙසු ලිපිගොනු වාර්තා විද්‍යුත් ආකෘතියට පරිවර්තනය කිරීම සඳහා වන ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ II වන අදියර 2016 වසරේ දී ආරම්භ විය. ඒ අනුව, C3 පෝරම, නැවත ලියාපදිංචි කිරීමේ ලිපිගොනු හා කාර්ය පත්‍රිකා ඡායාස්ථගත කර විද්‍යුත් ලිපිගොනු කළමනාකරණ පද්ධතියට ඇතුලත් කිරීම මගින්, සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට තමන්ගේ පරිඝනකය හරහා ඕනෑම අවස්ථාවක ලිපිගොනුවලට ප්‍රවේශ වීමේ හැකියාව ලැබෙන අතර එමගින් වඩාත් වේගවත් සේවාවක් තම සාමාජිකයන් වෙත සැපයීමට හැකි වී ඇත.

මෙහෙයුම් ක්‍රියාකාරකම් හා ක්‍රියාවලි නවීකරණය කිරීම තුලින් සාමාජිකයන් වෙත උපරිම සේවාවක් ලබාදීම සඳහා අරමුදල නිරතුරුවම කටයුතු කරයි. එවන් ගුණාත්මක සේවාවක් සැපයීම සඳහා ඒකීය මධ්‍යගත දත්ත ගබඩාවක් පැවතීම මූලික පූර්ව අවශ්‍යතාවයක් බවට සේ.අ.අ. හඳුනාගෙන

ඇත. මෙය යථාර්තයක් කරගනු වස්, සේ.අ.අ. වත්මන් සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පතෙහි තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර ජාතික හැඳුනුම්පත් අංකය පාදක කරගත් දෝෂ රහිත සේ.අ.අ. දත්ත ගබඩාවක් ස්ථාපනය කිරීමට කටයුතු කරමින් සිටී. ඕනෑම ව්‍යාපෘතියක අරමුණ සාක්ෂාත් කර ගැනීමට හැකිවනුයේ එහි තත්‍ය අවශ්‍යතාවය මනාසේ ආමන්ත්‍රණය කර ඇති විට හා සහභාගිවන්නන් මනාසේ ඒ පිළිබඳව දැනුම්වත් වී ඇති විටය. එබැවින්, අදාළ සේවායෝජකයන්, සේවකයන්, සේවායෝජකයන්ගේ පරිපාලන කාර්ය මණ්ඩල සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන්ගේ සේ.අ.අ. හා අදාළ අවශ්‍යතාවයන් හඳුනාගැනීමට සහ ඔවුන් තුළ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීමට විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහන් මෙහෙයවන ලදී.

මාසික දායක මුදල් හා සාමාජික විස්තර ඉදිරිපත් කිරීමට ඩිජිටල් සේවා ආරම්භ කිරීමත් සමඟ සේ.අ.අ. එහි මෙහෙයුම් ක්‍රියාකාරකම් නවීකරණය කිරීමේ කටයුතු විද්‍යුත් පසුබිමක් යටතේ තවදුරටත් සිදු කරන ලදී. ඒ අනුව, සේවායෝජකයන්ට මෙම පහසුකම සඳහා වැඩි ප්‍රවේශයක් ලබාදීම සඳහා සේ.අ.අ. බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ සම්බන්ධ විය. මංගත බැංකු ගෙවීම් පහසුකම ඔස්සේ සාමාජික විස්තරවල වලංගුභාවය තත්කාලීනව තහවුරු කර ගැනීමට හා සාමාජික ගිණුම් යාවත්කාලීන කර ගැනීමට හැකිවීම මගින් සේ.අ.අ. ඇල්මැති පාර්ශ්වයන්ට ප්‍රතිලාභ රැසක් අත්කර දී ඇත. දායක මුදල් ගිණුම්ගත වීම වේගවත්වීම, මානුෂීය දෝෂ හා පරිපාලන පිරිවැය අවම වීම, ලේඛණ රහිත පරිසරය සහ ඉහළ විනිවිදභාවය යනාදිය මෙම ප්‍රතිලාභ අතර ප්‍රධාන වේ. පසුගිය වසර වලට සාපේක්ෂව එහි ප්‍රගමනය පිළිබිඹු කරමින් දැනට මාසික සේ.අ.අ. දායක මුදල් වලින් සියයට 80 ක් පමණ (ආසන්න වශයෙන් රුපියල් බිලියන 8) විද්‍යුත් මාධ්‍යයෙන් රැස්කර ගනු ලබයි.

සේ.අ.අ. සිය ආයෝජන ප්‍රතිපත්ති හා අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්හි ශක්තිමත්භාවය හා විශ්වාසනීයත්වය ඉහළ නැංවීම උදෙසා ඉහළ ප්‍රමඛතාවයක් ලබා දී ඇත. ඒ අනුව, ලෝක බැංකු අනුග්‍රහය යටතේ මූල්‍ය ක්ෂේත්‍ර නවීකරණ ව්‍යාපෘතිය තුළින් ආයෝජන උපාය මාර්ග, යටිතල පහසුකම් හා සම්බන්ධිත අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් සමාලෝචනය හා ප්‍රතිසංස්කරණය කිරීමේ ක්‍රියාවලිය අරමුදල විසින් දැනටමත් ආරම්භ කර ඇත. තවදුරටත්, ආසියානු සංවර්ධන බැංකුව (ADB), ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධනය කිරීමේ වැඩ සටහන යටතේ (ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයක් කිරීම සඳහා), සුදුසු සැලැස්මක් සකස් කිරීම, තෝරා ගැනීම්, සැකසීම් නිර්දේශ කිරීමට හා විස්තීර්ණ තොරතුරු සන්නිවේදන තාක්ෂණික විසඳුමක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයක් කිරීම සඳහා තාක්ෂණික සහය ලබා දෙයි. මෙම ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනයෙන්, අකාර්යක්ෂම ක්‍රියාවලි, කාර්ය ද්විකරණය ආදිය ඉවත් කිරීමට සහ සේ.අ.අ. මෙහෙයුම් කටයුතු සඳහා වැඩි වටිනාකමක් ලබාදිය හැකි නව්‍ය ක්‍රියාවලි හා පාලනයන් හඳුන්වා දීමට උපකාර වනු ඇතැයි අපේක්ෂා කරයි.

මිලියන 17 ඉක්මවන සාමාජිකයන්ගෙන් සැදුම්ලත් ශ්‍රී ලංකාවේ විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදල වන සේ.අ.අ. සිය සාමාජිකයන්හට විශිෂ්ට සේවාවක් සපයනු වස් මෙවැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා වඩාත් උත්සුක වේ. සේ.අ.අ. කාර්යමණ්ඩලයේ කැපවීම හා සහාය නොවන්නට මෙබඳු සුවිශේෂ ප්‍රතිඵලයක් සාක්ෂාත් කර ගැනීමට අසමත් වනු ඇත. ඒ අනුව, සාමාජිකයන්ට සේවා සැපයීම සඳහා දක්වන අඛණ්ඩ කැපවීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය හා කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය දක්වන දායකත්වය අගය කිරීමට මුදල් මණ්ඩලය වෙනුවෙන් මෙම අවස්ථාව උපයෝගී කර ගැනීමට මම කැමැත්තෙමි. තවද, සේ.අ.අ. සාමාජිකයන් සිය ආයු කාලය තුළ ඉපැයීම්වල ඉතිරිකිරීම් කළමනාකරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත තබා ඇති විශ්වාසය වෙනුවෙන් සියළුම සේ.අ.අ. සාමාජිකයන්හට මුදල් මණ්ඩලයේ ස්තුතිය පුද කිරීමට කැමැත්තෙමි. සේ.අ.අ. සාමාජිකයන්ගේ විශ්‍රාම දිවිය සුරක්ෂිත හා තෘප්තිමත් කිරීම උදෙසා අඛණ්ඩව කටයුතු කිරීමටද ඉහළ ප්‍රමුඛතාවය ලබාදෙන බවටද සඳහන් කරමි.

**ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි**

අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව
මුදල් මණ්ඩලයේ සභාපති.



# කම්කරු කොමසාරිස් ජනරාල්තුමියගේ පණිවිඩය

සුවහසක් වූ ශ්‍රී ලාංකීය ජනතාවගේ වෘත්තීයමය දිවියෙන් පසු ජීවිතය සුරක්ෂිත කරනු වස් 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත එළි දක්වනු ලැබීය. ශ්‍රී ලංකාව ආර්ථික සමෘද්ධිය කරා මෙහෙයවීමේ මහගු කාර්යයේ කොටස්කරුවන් ලෙස සිය ජීවිතය කැප කරන පුද්ගලික හා අර්ධරාජ්‍ය සේවකයන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ අභිමතාර්ථයෙන් පිහිටුවනු ලැබූ සේවක අර්ථසාධක අරමුදල මේ වන විට ශ්‍රී ලංකාවේ විශාලතම සමාජ ආරක්ෂණ අරමුදල බවට පත්ව ඇත.

කම්කරු දෙපාර්තමේන්තුවත් ශ්‍රී ලංකා මහ බැංකුවත් අත්වැල් බැඳ ගනිමින් සේවක අර්ථසාධක අරමුදලෙහි ප්‍රගමනය වෙනුවෙන් ඉටු කරන ලද කාර්යභාරය විදහා දැක්වෙන 2016 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය වෙත මාගේ ශුභාශිංසනය පිරිනමමි.

2016 වසර තුළදී ද සේවක අර්ථසාධක අරමුදල පරිපාලනමය සහ කළමනාකරණමය වශයෙන් සාර්ථකත්වයට පත් වූ අතර, විවිධ ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදී. 2015 වර්ෂයේදී ආරම්භ කරන ලද 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය තවදුරටත් ප්‍රාදේශීයව ව්‍යාප්ත කරනු වස් නැගෙනහිර, මධ්‍යම, උතුර, ඌව සහ බස්නාහිර කලාප II (කළුතර) යන කලාප කම්කරු කාර්යාල වලට 2016 වසර තුල දී විමධ්‍යගත කරන ලදී.

එසේම ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රියාවලිය වඩාත් පහසු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙන ඇඟිලි සළකුණු ලබා ගැනීමේ පහසුකම දිස්ත්‍රික් කාර්යාල 05 ක ස්ථාපනය කිරීමටද 2016 වසර තුළදී හැකි විය. සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් සාමාජිකයන් හට පවතින ගැටළු නිරාකරණය කිරීම සඳහා ජංගම සේවා, අත්පත්‍රිකා බෙදා දීම හා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, අරමුදලෙහි ප්‍රවර්ධනය උදෙසා රූපවාහිනී, ගුවන්විදුලි හා පුවත්පත් දැන්වීම් පල කිරීම තුළින් සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් මහජනතාව දැනුම්වත් කිරීමටද කටයුතු කරන ලදී. මෙම සියළු කාර්යයන් තුළින් මහජනතාව වෙත වඩාත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබා දීමට සේවක අර්ථසාධක අරමුදලට හැකි විය.

සැමට සමාජ සුරක්ෂණය හිමිකර දෙමින් ශ්‍රී ලාංකීය ජනතාවගේ ජීවන තත්ත්වය ඔප්නංවන්නට උර දෙන කම්කරු දෙපාර්තමේන්තු සේවක අර්ථසාධක අරමුදල් අංශයේ නිලධාරීන් හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ සියළුම නිලධාරීන් හට මාගේ කෘතඥතාවය පළ කරමි.

සේවක අර්ථසාධක අරමුදල් 2016 වාර්ෂික වාර්තාව අපගේ සේවාවන්හි ඉදිරි ප්‍රගමනය පිණිසත්, සේව්‍ය සේවක දෙපාර්ශවය, පරිපාලන

හා මූල්‍ය ආයතන වල නිලධාරීන්ටත්, ප්‍රතිපත්ති සම්පාදකයන්ටත්, ශිෂ්‍ය ප්‍රජාව ඇතුළු සියළුම පාර්ශවයන්ටත් අතිශය ප්‍රයෝජනවත් වාර්තාවක් වනු ඇතැයි අපේක්ෂා කරමි.

**එම්.ඩී.සී. අරමතුංග**

කම්කරු කොමසාරිස් ජනරාල්

# ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම - 2016.12.31 දිනට

## සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව

| නම | තනතුර | අංශය |
|---|---|---|
| ඩබ්.ඩී.එස්.සී. වැලිවත්ත මයා | කම්කරු කොමසාරිස් | |
| පී.එච්.පී.අයි. බණ්ඩාර මිය | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | ගෙවීම් |
| ඩී.එම්.එස්.යූ. දසනායක | සහකාර කම්කරු කොමසාරිස් | |
| ඩී.ඒ.එස්. විජේසුන්දර මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| බී.ඒ.එම්.ඒ. බාලසූරිය මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ටී.එම්. ලක්මාලි මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| බී. වසන්තන් මයා | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | අයකිරීම් |
| ආර්.එම්.ඒ. සුගන්ධිකා මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| එච්.ආර්.ජේ.ඩී. ගුණතිලක මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ආර්.එන්.ඒ.ජී.එස්. නවරත්න මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ඩබ්.ඒ.එන්.එම්. කරුණාරත්න මිය | සහකාර කම්කරු කොමසාරිස් | 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් |
| ඒ.ජී.ඩී.ටී.කේ. ජයසිංහ මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| ජේ.ඒ.එම්.ඕ. විජයරත්න මිය | සහකාර කම්කරු කොමසාරිස් | |
| එම්.එච්.ඩී.එල්.ඒ. විජේපාල මයා | නියෝජ්‍ය කම්කරු කොමසාරිස් | පරිගණක |
| එම්.එස්. ගුණතිලක මිය | සහකාර කම්කරු කොමසාරිස් | පාලන |
| ඒ.කේ. පේරුසිංහ මිය | සහකාර කම්කරු කොමසාරිස් | මියගිය සාමාජික ප්‍රතිලාභ ගෙවීම් |
| එල්.එච්. දිසානායක මිය | සහකාර කම්කරු කොමසාරිස් | මධ්‍යම ලිපිගොනු අංශය |
| පී.ඩබ්.එම්. රංජන මයා | සහකාර කම්කරු කොමසාරිස් | පරිගණක/සැපයුම් |

## සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව

| නම | තනතුර | අංශය |
|---|---|---|
| කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර මිය | අධිකාරී | අධිකාරී/සේ.අ.අ. කාර්යාලය |
| ඒ.පී.යූ. තිලකරත්න මයා | අතිරේක අධිකාරී | |
| ජේ.ඩී.එස්.ජේ. නානායක්කාර මයා | අතිරේක අධිකාරී | |
| එස්.ඒ.එල්. මුතුකුමාර මයා | නියෝජ්‍ය අධිකාරී | |
| එම්.ඩබ්.කේ.එස්. සිරිවර්ධන මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධ්‍යක්ෂක (ආයතනික සේවා) | |
| එස්.ඩී.එච්. ද එස්. ජීවකරත්න මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ආයතනික සේවා හා පරිපාලන අංශය |
| එම්.එස්. විදානගේ මයා | සහකාර අධිකාරී | |
| පී.ඩබ්. විමල් ශාන්ත මයා | සහකාර අධිකාරී | රැස්කිරීම් අංශය |
| ඩී.ඩී.අයි. බ්‍රැන්ඩිගම්පල මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| වී.කේ. දම්පහලගේ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | නැවත ලියාපදිංචි කිරීමේ අංශය |
| ඩබ්.ඒ.එස්.පී.අයි.ඒ. ජයවර්ධන මිය | සහකාර අධිකාරී | |

| | | |
|---|---|---|
| පී.බී.එන්.ඒ. සමරනායක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ජංගම දායක මුදල් අංශය |
| කේ.කේ.එම්. අමරතුංග මයා | සහකාර අධිකාරී | |
| ජී.පී.ඩී. කවිරත්න මිය | සහකාර අධිකාරී | |
| පී.කේ.ඩී.පී.එස්. දසනායක මිය | සහකාර අධිකාරී | |
| යූ.ඒ. ගුණවර්ධන මයා | සහකාර අධිකාරී | හිඟුම්ගත දායක මුදල් අංශය |
| එස්.එන්. විජේතුංග මයා | සහකාර අධිකාරී | |
| ඩබ්.ටී.කේ. පෙරේරා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | විද්‍යුත් රැස්කිරීමේ අංශය |
| එම්.වී.ඩබ්. ද සොයිසා මයා | සහකාර අධිකාරී | |
| ඩී.එල්. රෝහිණී මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | අරමුදල් කළමනාකරණ අංශය |
| බී.එච්.අයි.එස්. කුමාර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩබ්.ජී.ආර්. හර්ෂප්‍රිය මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| කේ.යූ.බී. තෙන්නකෝන් මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ආර්.ඒ.සී.සී. රූපසිංහ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩී.පී. උඩුගමකෝරාළ මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩබ්.ජී.ඒ.සී. ද සිල්වා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| යූ.පී. ජයසිංහ මයා | සහකාර අධිකාරී | |
| ටී. ජෙයරාජන් මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ආයෝජන අවදානම් කළමනාකරණ අංශය |
| එම්. දිසානායක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | හිඟුම් හා සැසඳීම් අංශය |
| ඊ.ටී.ඩබ්.ටී.ආර්.පී. උඩකුඹුර මිය | සහකාර අධිකාරී | |
| ඩබ්.ඒ.ඩබ්.එන්. වන්නිආරච්චි මයා | සහකාර අධිකාරී | |
| ඒ.කේ. චතුරංග මයා | කළමනාකරණ පුහුණු | |
| ඩබ්.ඒ.එන්.ඩී. ඩයස් මිය | කළමනාකරණ පුහුණු | |
| ඩී.වයි.එස්. මහගෙදරවත්ත මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | වාර්තා කළමනාකරණ අංශය |
| ඒ.ටී. උපසේන මයා | සහකාර අධිකාරී | |
| සී.පී. ජයවීර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | වාර්තා සංශෝධන අංශය |
| කේ.එම්.ජී.සී. බණ්ඩාර මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | |
| ඩබ්.ඒ.සී. විජේසිංහ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | නිවාස ණය අංශය |
| එස්. විජේසිංහ මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ප්‍රතිලාභ පාලන අංශය |
| එස්.ඒ. ජයවර්ධන මිය | සහකාර අධිකාරී | |
| පී.එච්.ඩී.ඒ. අත්තනායක මිය | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | ප්‍රතිලාභ ගෙවීම් අංශය |
| ජී.ජී.එන්.එම්. පෙරේරා මිය | සහකාර අධිකාරී | |
| එල්.එස්. ගමගේ මිය | සහකාර අධිකාරී | 30% ප්‍රතිලාභ ගෙවීම් අංශය |
| කේ.ඒ.එන්.එල්. රත්නසේකර මයා | ජ්‍යෙෂ්ඨ සහකාර අධිකාරී | මහජන සම්බන්ධතා, විමසීම් කවුළුව සහ ඇමතුම් මධ්‍යස්ථානය |

# මූල්‍ය තොරතුරු

**සංඛ්‍යා සටහන 1** — **මූල්‍ය තොරතුරු - 2016**

| | |
|---|---|
| අරමුදලේ වටිනාකම | රුපියල් බිලියන 1,841.5 |
| දායක මුදල් ලැබීම් | රුපියල් මිලියන 118,327 |
| ප්‍රතිලාභ ගෙවීම් | රුපියල් මිලියන 108,393 |
| ශුද්ධ දායක මුදල් | රුපියල් මිලියන 9,934 |
| දළ ආදායම | රුපියල් මිලියන 193,071 |
| මෙහෙයුම් වියදම් | රුපියල් මිලියන 1,487 |
| ආදායම් මත බදු | රුපියල් මිලියන 15,657 |
| ශුද්ධ ආදායම | රුපියල් මිලියන 175,927 |
| සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලිය | රුපියල් මිලියන 171,557 |
| සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද වාර්ෂික පොලී ප්‍රතිශතය | 10.50% |
| සාමාන්‍ය ආයෝජන මත වූ වාර්ෂික ප්‍රතිලාභ ප්‍රතිශතය | 11.43% |
| මෙහෙයුම් වියදම් මුළු ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.77% |

**රූප සටහන 1** — **අරමුදලේ වර්ධනය**




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| මුළු ශුද්ධ වත්කම් (රු.බි) | 1,144 | 1,300 | 1,487 | 1,665 | 1,841 |
| වර්ධන අනුපාතිකය (%) | 12.4 | 13.6 | 14.4 | 12.0 | 10.6 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 2** — **දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම් සහ ශුද්ධ දායක මුදල්**




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| දායක මුදල් (රු.බි) | 70.2 | 80.2 | 90.0 | 102.5 | 118.3 |
| ප්‍රතිලාභ ගෙවීම් (රු.බි) | 48.7 | 50.2 | 65.1 | 77.8 | 108.4 |
| ශුද්ධ දායක මුදල්(රු.බි) | 21.5 | 30.0 | 24.9 | 24.7 | 9.9 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 3 සාමාජික ගිණුම් සංඛ්‍යාව




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| දායක වන (මිලියන) | 2.3 | 2.4 | 2.4 | 2.6 | 2.6 |
| දායක නොවන (මිලියන) | 12.3 | 12.8 | 13.4 | 14.3 | 14.7 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 4 ආයෝජන කළඹෙහි සංයුතිය




| කාණ්ඩය | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| රජයේ සුරැකුම්පත් | 93.6 | 92.5 | 91.2 | 92.7 | 93.1 |
| කොටස් | 5.4 | 5.8 | 6.7 | 5.5 | 4.6 |
| ණයකර සහ වෙනත් | 1.0 | 1.7 | 2.1 | 1.8 | 2.3 |

රජයේ සුරැකුම්පත් — කොටස් — ණයකර සහ වෙනත්

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 5 සාමාන්‍ය ආයෝජන කළඹ මත ප්‍රතිලාභ




| | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|
| දළ ආයෝජන ආදායම (රු.බි.) | 121.4 | 136.3 | 163.2 | 171.5 | 192.9 |
| දළ ආයෝජන මත ප්‍රතිලාභ (%) | 11.6 | 11.5 | 12.1 | 11.3 | 11.4 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 6 සාමාජිකයන්ගේ අවසාන ශේෂ මත ගෙවූ පොලිය




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## රූප සටහන 7 සාමාජිකයන් සඳහා වූ සඵල ප්‍රතිලාභ අනුපාතය සහ වෙළෙඳපොළ පොලී අනුපාතික




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
වාර්ෂික වාර්තාව, ශ්‍රී ලංකා මහ බැංකුව

# මෙහෙයුම් තොරතුරු - 2016

**සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකා මහ බැංකුව**

- සියයට 10.5 ක වාර්ෂික පොළී ප්‍රතිශතයක් සාමාජිකයන්ට ගෙවන ලදී.
- සමස්ථ සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 17.3 ක් දක්වා වර්ධනය විය.
- දායක මුදල් ගෙවනු ලබන මුළු සාමාජික සංඛ්‍යාව මිලියන 2.6 ක් විය.
- අරමුදලේ වටිනාකම රුපියල් බිලියන 1,841 ක් දක්වා වර්ධනය විය.
- සාමාජිකයින් 187,149 දෙනෙකුට රුපියල් මිලියන 108,393 ක් විශ්‍රාම ප්‍රතිලාභ ලෙස ගෙවන ලදී.
- වසර තුළ, අර්ථලාභීන් 60,021 දෙනෙකුට රුපියල් බිලියන 33.7 ක් පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමය යටතේ ගෙවන ලදී.
- ණය දෙන ආයතනවලින් සේ.අ.අ. ශේෂයන් ඇපයට තබා නිවාස ණය ලබා ගැනීම පිණිස සාමාජිකයින් 12,780 ක් සඳහා ඇප සහතික නිකුත් කරන ලදී.
- වැදගත් සහ නිතර පරිශීලනයට අවශ්‍ය වන දෘඩ වාර්තා විද්‍යුත් වාර්තා බවට පත් කිරීමේ අරමුණින් ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර අරඹන ලදී.
- බදුල්ල, මිරිස්ස, කහවත්ත සහ පොළොන්නරුව යන ප්‍රදේශ ඇතුළත්ව විවිධ ප්‍රදේශයන්හි දෙපාර්තමේන්තුව ජංගම සේවාවන් දහයක් 2016 වසර තුළ දී පවත්වන ලදී.
- 2016 වසර ආරම්භයේ දී, ජාතික සංවර්ධන බැංකුව දායක මුදල් රැස්කිරීමේ නියෝජිත බැංකු අතරට එක්වන ලදී.
- 2016 වසර මැද භාගය වන විට, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. විසින් දැනට පවත්නා පද්ධතිය සමග දත්ත තහවුරු කිරීමේ පහසුකම ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව සිය මංගත සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් පද්ධතිය යලි දියත් කරන ලදී.
- විද්‍යුත් දායක මුදල් රැස්කිරීමේ ක්‍රමවේදය යටතේ 2015 වසර අවසාන වනවිට ලියාපදිංචිව සිටි 6,093 ක් වූ සේවායෝජකයන් සංඛ්‍යාව 2016 වසර අවසාන වනවිට 6,955 ක් දක්වා වර්ධනය විය.
- 2016 වසර අවසාන වන විට සාමාජිකයන් මිලියන 1.4 ක් ජාතික හැඳුනුම්පතේ සඳහන් නමින් ලියාපදිංචි වූ අතර, ජාතික හැඳුනුම්පත් අංකය ඒකීය හඳුනාගැනීමේ අංකය ලෙස එම සාමාජිකයන්හට පවරා ඇත.

# මෙහෙයුම් තොරතුරු - 2016

**සේවක අර්ථසාධක අරමුදල් අංශය - කම්කරු දෙපාර්තමේන්තුව**

- 2015 වසරේ දී ස්ථාපිත කරන ලද 30% ප්‍රතිලාභ ගෙවීම් අයදුම් කිරීමේ පහසුකම නැගෙනහිර, මධ්‍යම, උතුර, ඌව සහ බස්නාහිර කලාප II (කළුතර) කලාප කම්කරු කාර්යාල වලින් ද සිදු කළ හැකි පරිදි විමධ්‍යගත කිරීම.
- ඇඟිලි සළකුණු තබා ශේෂය ලබා ගත හැකි පහසුකම දිස්ත්‍රික් කම්කරු කාර්යාල 05 ක ස්ථාපිත කිරීම.
- සාමාජිකයන් හට පවතින ගැටලු නිරාකරණය කිරීම සඳහා ජංගම සේවා වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කිරීම, අත්පත්‍රිකා බෙදා දීම වැනි විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- රූපවාහිනී හා ගුවන් විදුලි මාධ්‍ය තුළ ප්‍රචාරණ දැන්වීම් පළ කිරීම තුළින් මහජනතාව දැනුම්වත් කිරීම.

# නියාමන රාමුව

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ./අරමුදල) යනු ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. විශ්‍රාම ප්‍රතිලාභ නොලබන පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවානියුක්තයින් වෙත අනිවාර්යය විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ යෝජනා ක්‍රමයක් ලෙස 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධාන වලට අනුව, අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස්තුමා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, කාර්යයන් හා වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත. පනත අනුව මුදල් මණ්ඩලය විසින් තමන් වෙත පැවරී ඇති බලතල, කාර්යයන් හා වගකීම ක්‍රියාත්මක කරනු ලබන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගිනි.

අරමුදලට ලැබිය යුතු අනිවාර්ය අවම මාසික දායක මුදල් ප්‍රමාණය සේවා නියුක්තිකයෙකුගේ දළ වැටුපෙන් සියයට 20 කි. සාමාජිකයාගේ දළ මාසික වැටුපෙන් සියයට 12 ක අවම ප්‍රතිශතයකට සමාන මුදලක් සේවායෝජකයා විසින් ද, සියයට 08 ක ප්‍රමාණයක් සේවකයා (සාමාජිකයා) විසින් ද දායකත්වය ලෙස දැරිය යුතු වේ. තම සේවානියුක්තිකයන් වෙනුවෙන් ගෙවිය යුතු දායක මුදල් සහ අදාළ තොරතුරු නියමිත කාලසීමාව තුළ එවීමට සේවායෝජකයා බැඳී සිටී. සේවක සංඛ්‍යාව 50 දෙනෙකුට වඩා අඩු සේවායෝජකයින් (''සී''කාණ්ඩය) තම දායක මුදල් හා අදාළ විස්තර (''සී'' පෝරමය) මාසිකව එවිය යුතු වන අතර, සේවක සංඛ්‍යාව 150 දෙනෙකුට වැඩි ආයතනවල සේවායෝජකයන් (''සී3''කාණ්ඩය) අදාළ තම දායක මුදල් මාසිකව සහ අදාළ විස්තර වාර්තා (''සී3'' පෝරම) අර්ධ වාර්ෂිකව එවිය යුතුය. නමුත් 2012 වසරේ දී සේවක අර්ථසාධක අරමුදල් පනතේ කරනු ලැබූ සංශෝධනය අනුව, අවම සේවක සංඛ්‍යාව 50 ක් හෝ ඊට වැඩි සියලූම සේවායෝජකයන් විසින් මාසික දායක මුදල් හා දායක මුදල් විස්තර විද්‍යුත් මාධ්‍යයන් තුළින් මාසිකව එවිය යුතුය.

අරමුදලෙහි සාමාජිකයන් විශ්‍රාම යන වයස සම්පූර්ණ කළ විට (පිරිමින් වයස 55 සම්පූර්ණ වීම හා කාන්තාවන් වයස 50 සම්පූර්ණ වීම) තම ප්‍රතිලාභ මුදල් ලබා ගැනීම සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබති. එයට අමතරව ස්ථිරව රට හැර යාම, පූර්ණ දුබලතාවයට පත්වීම, විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම (කාන්තාවන් සඳහා පමණි) සහ විශ්‍රාම වැටුප් ලබන රජයේ රැකියාවකට පිවිසීම යන හේතු ද ප්‍රතිලාභ සඳහා අයදුම් කිරීමට ඇති සුදුසුකම් වේ. මියගිය සාමාජිකයන්ගේ නීත්‍යානුකූල උරුමකරුවන් මියගිය සාමාජිකයාගේ ප්‍රතිලාභ ලබා ගැනීමට සුදුසුකම් ලබයි. විශ්‍රාම ප්‍රතිලාභ වලට අමතරව, තම සාමාජික ශේෂය ඇපයට තබා අනුමත ණය දෙන ආයතන පහකින් නිවාස ණය ලබා ගැනීමට ද අරමුදල මගින් පහසුකම් සපයා ඇත. තවද, 2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත අනුව නිවාස ඉදිකිරීම් හා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමේ අරමුණින් ගිණුම් ශේෂය රුපියල් 300,000 කට වැඩි සහ සේවා කාලය වසර 10 කට වැඩි සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් සියයට 30 ක් ආපසු ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත.

## කම්කරු කොමසාරිස්තුමාගේ කාර්යභාර්ය

සේවායෝජකයන් හා සේවානියුක්තිකයන් ලියාපදිංචි කිරීම.

පනතේ විධිවිධාන අනුව කටයුතු කිරීම සහතික කර ගැනීම පිණිස අවශ්‍ය විමර්ශන කටයුතු සිදු කිරීම සහ දායක මුදල් නිසි ලෙස ගෙවීම පැහැර හැරීම සම්බන්ධව නීතිමය කටයුතු ක්‍රියාත්මක කිරීම.

ප්‍රමාද වී ගෙවනු ලබන දායක මුදල් සම්බන්ධයෙන් සේවායෝජකයන්ගෙන් දඩ මුදල් අයකර ගැනීම.

ප්‍රතිලාභ හිමිකම් සඳහා වූ අයදුම්පත් භාර ගැනීම සහ එම අයදුම්පත්වලට අදාළව ප්‍රතිලාභ ගෙවීම් සම්බන්ධ තීරණ ලිපි මහ බැංකුවට නිකුත් කිරීම.

සාමාජිකයන්ගේ පෙර පැවති සාමාජික ගිණුම් ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් අනුමත කිරීම.

සාමාජිකයින්ට තම ගිණුම් ශේෂ ඇපයට තබා අනුමත ණය දෙන ආයතන වලින් නිවාස ණය ලබා ගැනීමට හැකිවන පරිදි අදාළ නිවාස ණය අයදුම්පත් අනුමත කිරීම.

## ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ කාර්යභාරය

සාමාජික දායක මුදල්, අධිභාර සහ ආදායම් රැස්කිරීම.

සාමාජික ගිණුම් පවත්වාගෙනයාම.

අරමුදලේ ආරක්ෂාව තහවුරු කරන අතරම, සාමාජිකයන්ට උපරිම ප්‍රතිලාභ අත්කර දීම අරමුණු කොට අරමුදල සතු අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වාර්ෂික පොලී අනුපාතිකය, කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් අනතුරුව සාමාජික ගිණුම්වලට බැර කිරීම.

අරමුදලේ වාර්ෂික ගිණුම් සැකසීම හා සාමාජිකයින් වෙත වාර්ෂික ගිණුම් ප්‍රකාශ නිකුත් කිරීම.

කම්කරු කොමසාරිස් විසින් ප්‍රතිලාභ ගෙවීම සඳහා නිකුත් කරනු ලබන තීරණ ලිපිවලට අනුව අදාල ප්‍රතිලාභ ගෙවීම.

නිවාස ණය ලබාගැනීම සඳහා අයදුම්කොට ඇති සාමාජිකයින් වෙනුවෙන් ගිණුම් ශේෂ සහතික අනුමත ණය දෙන ආයතනවලට නිකුත් කිරීම.

යම් ගිණුම් වර්ෂයක් අවසන් වී තෙමසක් ඇතුළත අරමුදලෙහි මූල්‍ය ප්‍රකාශන සහ ආයෝජන ප්‍රකාශන වැනි තොරතුරු ගරු කම්කරු හා කම්කරු සබඳතා ඇමතිවරයාටත්, ගරු මුදල් ඇමතිවරයාටත් ඉදිරිපත් කිරීම.

# 1. ආර්ථික සමාලෝචනය - 2016

## 1.1 ආර්ථික වර්ධනය සහ සාර්වආර්ථික තත්ත්වය

2016 වසරේ දී ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය, 2015 වසරේ දී වාර්තා වූ සියයට 4.8 ක වර්ධනය හා සැසඳීමේ දී සියයට 4.4 කින් වර්ධනය විය. 2016 වසරේ දී වාර්තා වූ දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 56.5 කට දායකත්වය ලබා දුන් සේවා ක්‍රියාකාරකම්, 2015 වසරේ දී වාර්තා වූ සියයට 5.7 ක වර්ධනයට සාපේක්ෂව සියයට 4.2 කින් වර්ධනය විය. සේවා ක්‍රියාකාරකම්වල වර්ධනයට විශේෂයෙන් මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය දායක විය. දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 26.8 ක දායකත්වය ලබා දුන් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල පසුගිය වසරේ පැවති සියයට 2.1 වර්ධනයට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 6.7 ක සැලකිය යුතු වර්ධනයක් වාර්තා විය. පසුගිය වසරේ දී අඩු කාර්යසාධනයක් වාර්තා කළ ඉදිකිරීම් අංශය යථාතත්වයට පත්වීම, කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා වැදගත් දායකත්වයක් සැපයූ අතර, වර්ෂය තුළ දී නිෂ්පාදන අංශය අඩු වේගයකින් වර්ධනය විය. කෘෂිකර්ම, වන හා ධීවර ක්‍රියාකාරකම්හි වර්ධනය පසුගිය වසරේ වාර්තා වූ සියයට 4.8 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 4.2 කින් සංකෝචනය වූ අතර, මෙය දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය සියයට 7.1 කට අඩු වීමට හේතු විය. අයහපත් කාලගුණ තත්ත්වයන්, කෘෂිකර්ම අංශයේ කාර්යසාධනය සඳහා අහිතකර ලෙස බලපාන ලදී.

රූප සටහන 8 මූර්ත ද.දේ.නි.යෙහි වාර්ෂික වර්ධනය




මූලාශ්‍රය : වාර්ෂික වාර්තාව ශ්‍රී ලංකා මහ බැංකුව

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) යන දර්ශක දෙකම මත පදනම්ව උද්ධමනය පළමු අර්ධ වර්ෂය තුළ වැඩිවීමක් පෙන්නුම් කළ නමුත් පාරිභෝගික භාණ්ඩවල ජාත්‍යන්තර මිල ගණන් අඩු වීම නිසා 2016 වසර අග වන විට එය ස්ථාවර අගයක්ව පැවතුණි. විදේශීය අංශයෙහි ක්‍රියාකාරීත්වය දෙස බැලීමේ දී අපනයන ඉපයීම සියයට 2.2 කින් අඛණ්ඩව දෙවන වසරේදීත් අඩු වූ අතර, ආනයන වියදම 2015 වසරේ දී සියයට 2.5 ක ප්‍රමාණයකින් වැඩි විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වෙළෙඳ හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 2015 වසරේ පැවති සියයට 10.4 ට සාපේක්ෂව සියයට 11.2 දක්වා ඉහළ ගියේය. වර්ෂය තුළ දී සේවා හා ද්විතීයික ආදායම් ගිණුම්වල අතිරික්තයක් පැවතිය ද, ඉහළ වෙළෙඳ හිඟය හා ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය හේතුවෙන් 2016 වසරේ බාහිර ජංගම ගිණුමේ හිඟය වැඩි වී ඇත. ඉහළ අගයකින් යුත් ආනයන, විදේශ ණය සේවා ගෙවීම් සහ රාජ්‍ය සුරැකුම්පත් වලින් විදේශ අරමුදල් ගලායාම් නිරූපනය කරමින්; 2016 වසරේ දී ශ්‍රී ලංකා රුපියලේ අගය ප්‍රධාන විදේශ මුදල් (ස්ටර්ලින් පවුම් හැර) වලට එරෙහිව අඩුවී ඇත. රාජ්‍ය ආදායම ඉහළ යාම සහ රාජ්‍ය වියදම තාර්කිකරණය කිරීම හේතුවෙන් 2015 වසරේ දී ද.දේ.නි. හි ප්‍රතිශතයක් ලෙස සියයට 7.6 ක් ව පැවති රාජ්‍ය මූල්‍ය අංශයේ, අයවැය හිඟය 2016 වසරේ දී සියයට 5.4 දක්වා පහළ ගියේය.

## 1.2 උද්ධමනය හා පොලී අනුපාතය

ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) මගින් මනිනු ලබන සාමාන්‍ය මිල මට්ටම 2016 පළමු අර්ධ වර්ෂය තුළ දී ඉහළ ගියත් නැවත එහි වාර්ෂික උපනතිය පදනම් කර ගෙන 2016 වර්ෂය අවසානයේ දී ක්‍රමයෙන් මන්දගාමීව සියයට 4.2 ක් විය. ඒ හා සමාන උපනතියක් අනුගමනය කරමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2016 වසර අවසානයේ දී සියයට 4.5 ට අඩු වීමට පෙර 2016 ජූලි මාසයේ දී සියයට 5.8 දක්වා වැඩි විය. වාර්ෂික සාමාන්‍ය මත පදනම්ව, ජාතික පාරිභෝගික

මිල දර්ශකය හා කොළඹ පාරිභෝගික මිල දර්ශකය යන දෙකම 2016 ජනවාරි සිට පිළිවෙලින් සියයට 2.9 සහ සියයට 2.1 සිට 2016 වර්ෂය අවසානයේ දී සියයට 4.0 දක්වා ඉහළ ගියේය. වර්ෂය තුළ උද්ධමනය ඉහළ යාමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආහාරවල මිල ගණන් ඉහළ යාම සහ රාජ්‍ය බදු වෙනස් කිරීම නිසා ඇති වූ බලපෑම විය. ඒ අතර, වාර්ෂික ජාතික පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ මූලික උද්ධමනය 2016 ජනවාරි පැවති සියයට 3.0 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් වනවිට සියයට 6.7 දක්වා ඉහළ යාමක් දක්නට ලැබුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය මත පදනම් වූ වාර්ෂික මූලික උද්ධමනය 2016 ජනවාරි මාසයේ දී පැවති සියයට 3.6 ට සාපේක්ෂව 2016 දෙසැම්බර් මාසයේ දී සියයට 5.8 දක්වා ඉහළ ගියේය.

**රූප සටහන 9** **වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය** (CCPI; 2013=100, NCPI; 2013=100 **පදනම මත**)




මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව/ ශ්‍රී ලංකා මහ බැංකුව

**රූප සටහන 10** **තෝරාගත් වෙළෙඳපොළ පොලී අනුපාතිකවල විචලනය**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකවල කරන ලද ගැළපීම හා දේශීය ද්‍රවශීලතා තත්ත්වයන්, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි වෙනස්වීම් මගින් පෙන්නුම් කරන ලදී. ඒ අනුව, දේශීය මුදල් වෙළෙඳපොළෙහි මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම සහ ද්‍රවශීලතා හිඟයක් පැවතීමත් සමඟ බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය 2016 දෙසැම්බර් අවසාන වනවිට සියයට 8.42 දක්වා පදනම් අංක 202 කින් වැඩි විය. ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය ද බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයේ වෙනස් වීම සමග අනුරූපී විය. ඒ අනුව, ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (එක් දින) 2015 වසර අවසානයේ වාර්තා වූ සියයට 6.40 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 8.44 ක් ව පැවතුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සිල්ලර පොලී අනුපාත සඳහා වන දැඩි මුදල් ප්‍රතිපත්තිය පෙන්නුම් කරමින් වාණිජ බැංකුවල තැන්පතු හා ණය පොලී අනුපාතික සාපේක්ෂ වශයෙන් 2016 වසරේ දී ඉහළ මට්ටමක පැවතුණි. වාණිජ බැංකු වෙතැති මහජනයා සතු සියලුම පොලී උපයන තැන්පතුවලට අදාළ පොලී අනුපාතිකවල හැසිරීම පෙන්නුම් කරනු ලබන බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය, 2015 වසරේ පැවති සියයට 6.20 ට සාපේක්ෂව 2016 වසර අවසාන වනවිට සියයට 8.17 ක් ව පැවතුණි. බරිත සාමාන්‍ය ණය අනුපාතිකය වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට සපයනු ලබන සියලුම ණය සහ අත්තිකාරම් මත පදනම්ව ගණනය කරනු ලබන අතර, 2015 වසරේ පැවති සියයට 11 ට සාපේක්ෂව 2016 වසර අවසානය වනවිට සියයට 13.20 දක්වා පදනම් අංක 220 කින් ඉහළ ගියේය. ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්තියේ බලපෑම පෙන්නුම් කරමින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2016 වසරේ අග භාගයට ළඟා වනවිට සීමා විය.

### 1.3 වැටුප් හා සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතිකය 2015 වසරේ දී වාර්තා වූ සියයට 4.7 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 4.4 දක්වා පහළ ගියේය. ස්ත්‍රී සහ පුරුෂ සේවා නියුක්ති අනුපාතිකය පහත වැටීම, සේවා වියුක්ති අනුපාතයේ සමස්ත පහළ යෑමට හේතු විය. සේවා නියුක්ත සංඛ්‍යාවේ ඉහළ යාම කාර්මික අංශයේ හා සේවා අංශයේ යන අංශ දෙකෙහිම දැකිය හැකි වූ අතර, කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්ත සංඛ්‍යාව අඩු විය. ඒ අනුව, කෘෂිකාර්මික

අංශය, මුළු සේවා නියුක්ත සංඛ්‍යාවෙන් සියයට 27.1 ක් වන අතර, කාර්මික අංශය හා සේවා අංශය පිළිවෙලින් මුළු සේවා නියුක්ත සංඛ්‍යාවෙන් සියයට 26.4 ක් සහ සියයට 46.5 ක් විය. කෙසේ වෙතත්, මෙම වසර තුළ දී පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය වර්ධනය වූ අතර, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය මෙන්ම විදේශ රැකියා සඳහා පිටත්ව යන්නන්ද අඩු විය.

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම සේවකයින්ගේ නාමික වැටුප 2016 වර්ෂය තුළ දී ඉහළ ගියේය. 2016 වසරේ දී සියලුම රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ඉහළ යාමට හේතු වූයේ අතුරු දීමනාවේ ක්‍රමික ඉහළ යාම රුපියල් 10,000 ට ළඟා වීම සහ මූලික වැටුපට ඇතුළත් කරන ලද අතුරු දීමනාව වේ. ජාතික අවම වැටුප පිළිබඳව සහ රජය විසින් දෙන ලද අයවැය සහනදායක දීමනා පිළිබඳව ජාතික මට්ටමින් හඳුන්වා දුන් ප්‍රධාන පනත් දෙකක් හේතුකොටගෙන විධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් වැඩි විය.

## 1.4 මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

සමස්ත ණය හා මුදල් අපේක්ෂිත මට්ටමට වඩා ඉහළ යාම හේතුවෙන් ඇති විය හැකි උද්ධමන පීඩනය සීමා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව 2016 වර්ෂයේ දී මුදල් ප්‍රතිපත්තිය දැඩි කළේය. 2016 ජනවාරි මස තුළ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් සඳහා වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 1.50 ක ප්‍රමාණයකින් සියයට 7.50 දක්වා ඉහළ දමන ලදී. තවද, 2016 පෙබරවාරි මස දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික වන, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) හා නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR) පිළිවෙලින් සියයට 6.50 ක් හා සියයට 8.0 ක් දක්වා පදනම් අංක 50 කින් ඉහළ දමන ලදී. එසේ වුවද, වෙළෙඳපොළ පොලී අනුපාතික ඉහළ ගියද පෞද්ගලික අංශය සඳහා වූ ණය සැපයුම අඛණ්ඩව වර්ධනය විය. ඒ අනුව, 2016 ජූලි මාසයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය (SDFR) හා නිත්‍ය ණය පහසුකම් අනුපාතය (SLFR) පිළිවෙලින් සියයට 7.0 ක් හා සියයට 8.50 ක් දක්වා පදනම් අංක 50 කින් ඉහළ දමමින් ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ස්ථාවරය දෙවන වරටත් දැඩි කරන ලදී.

2016 වසරේ දී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය, අයවැය හිඟය හා අයවැය හිඟය මූල්‍යනය සඳහා ණය ලබා ගැනීම තවදුරටත් අඩු කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ශක්තිමත් කර ගැනීම කෙරෙහි යොමු විය. රජයේ ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය යටතේ බදු ක්‍රමය අනුකූල කිරීම හා සරල කිරීම, බදු පදනම පුළුල් කිරීම, බදු නිදහස් කිරීම හා බදු සහන වඩාත් තාර්කීකරණය කිරීම සහ බදු පරිපාලනය වඩා ශක්තිමත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. රාජ්‍ය ආදායම් වැඩි වීම සහ සමස්ත රාජ්‍ය වියදම අඩු වීම 2015 වසරේ ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 7.6 ක් ව පැවති අයවැය හිඟය 2016 වසරේ දී ද.දේ.නි. යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 5.4 දක්වා අඩු කිරීමට හේතු විය. 2016 වසරේ දී මධ්‍යම රජයේ ණය පසුගිය වසරට සාපේක්ෂව අඩු වුවත්, නාමික දළ දේශීය නිෂ්පාදිතයෙහි අඩු වර්ධනය හේතු කොට ගෙන ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස මධ්‍යම රජයේ ණය සියයට 79.3 දක්වා වැඩි වී ඇත. 2016 වසරේ දී අයවැය හිඟය විශාල වශයෙන් පියවා ගන්නා ලද්දේ විදේශීය මූලාශ්‍ර වලිනි. ඒ අනුව, වසර තුළ සිදු කළ ශුද්ධ විදේශීය මූල්‍යනය වසරේ සමස්ත මූල්‍ය අවශ්‍යතාවයෙන් සියයට 61.2 (රුපියල් බිලියන 391.9) වූ අතර, ශුද්ධ දේශීය මූල්‍යනය සියයට 38.8 ක් (රුපියල් බිලියන 248.4) විය. විදේශීය මූල්‍යනය මත වැඩිතර විශ්වාසය තැබීම හේතුවෙන්, දේශීය බැංකු මෙන්ම බැංකු නොවන මූලාශ්‍රයන් මාර්ගයෙන් සිදු කරනු ලැබූ මූල්‍යනය පසුගිය වසරට සාපේක්ෂව 2016 වසරේ දී සැලකිය යුතු ලෙස අඩු වී ඇත. 2016 වසරේ දී දේශීය බැංකු අංශයෙන් සිදු කළ මූල්‍යනය, සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනයෙන් සියයට 56.3 වූ අතර, බැංකු නොවන අංශයෙන් සිදු කළ මූල්‍යනය, සියයට 43.7 ක් විය.

## 1.5 රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළ හා ඵලදා අනුපාතිකයේ වෙනස්වීම්

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැඩි මුදල් ප්‍රතිපත්තිය පෙන්නුම් කරමින්, අරමුදල් සඳහා රජයේ ඉල්ලුම වැඩි වීම හා ප්‍රාථමික වෙළෙඳපොළේ රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ඵලදා අනුපාතය වැඩි වීම 2016 වසරේ දී දක්නට ලැබුණි. රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය ක්‍රියාත්මක වීම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම් සැපයීම ආරම්භ වීම හා රාජ්‍ය

සුරැකුම්පත් වෙළෙඳපොළට විදේශීය අරමුදල් ගලාඒම හේතුවෙන්, 2016 පළමු කාර්තුව තුළ ඉහළ යාමේ උපනතියක් පෙන්වන ලද ප්‍රාථමික වෙළෙඳපොළ ඵලදා අනුපාතිකය අප්‍රේල් මාසයේ සිට ස්ථාවර වීම ආරම්භ විය. ඒ අනුව, 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී දින 91, දින 182 සහ දින 364 යන භාණ්ඩාගාර බිල්පත් සඳහා වූ ඵලදා අනුපාතික පිළිවෙලින් සියයට 8.72, සියයට 9.63 සහ සියයට 10.17 දක්වා පදනම් අංක 227 කින්, 280 කින් සහ 287 කින් ඉහළ ගියේය. ප්‍රාථමික වෙළෙඳපොළ, භාණ්ඩාගාර බිල්පත්වල ඵලදා අනුපාතිකය පෙන්වන ලද උපනතියට සමාන උපනතියක් දීර්ඝ පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතිකය මගින් ද පෙන්වන ලදී. ඒ අනුව, පස් අවුරුදු පරිණත කාලසීමාවක් ඇති භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතිකය 2015 වසර අග පැවති සියයට 9.79 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 11.76 ට වැඩි වූ අතර, වසර දහයක පරිණත කාලයක් සහිත භාණ්ඩාගාර බැඳුම්කර මත වූ හරිත සාමාන්‍ය ඵලදා අනුපාතය 2015 වසරේ පැවති සියයට 10.94 සිට සියයට 12.11 දක්වා 2016 වසරේ දී ඉහළ ගියේය. ප්‍රාථමික වෙළෙඳපොළ වෙනස්වීම් වලට අනුකූල වෙමින්, ද්විතියික වෙළෙඳපොළ රාජ්‍ය සුරැකුම්පත් සඳහා වූ ඵලදා අනුපාතිකය ද, 2016 වසරේ දී ඉහළ ගියේය.

**රූප සටහන 11 — ද්විතියික වෙළෙඳපොළ ඵලදා හැසිරීම**




මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව

# 2. සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රගති සමාලෝචනය - 2016

## 2. හැඳින්වීම

2016 වසර අවසානයේ දී, අරමුදලෙහි මුළු ශුද්ධ වටිනාකම රුපියල් බිලියන 1,841.5 ක් ලෙස වාර්තා වූ අතර, මෙය 2015 වසර අවසානයේදී වාර්තා වූ රුපියල් බිලියන 1,664.9 හා සැසඳීමේ දී සියයට 10.6 ක වර්ධනයකි. 2016 වසර අවසන් වනවිට මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව මිලියන 17.3 ක් විය. එය 2015 වසර අවසානයේ වාර්තා වූ මිලියන 16.9 හා සසඳන විට සියයට 2.4 ක වර්ධනයකි. සක්‍රීය සාමාජික ගිණුම් ප්‍රමාණය 2015 වසරට අනුරූපව 2016 වසර අවසානයේ දී මිලියන 2.6 ක් වූ අතර, අක්‍රීය සාමාජික ගිණුම් සංඛ්‍යාව 2015 වසර අවසානයේ වාර්තා වූ මිලියන 14.3 ට සාපේක්ෂව 2016 වසර අග දී මිලියන 14.7 දක්වා වර්ධනය විය. ඒ අතර, දායක සේවායෝජකයින් සංඛ්‍යාව 2015 වසර අවසානයේ වාර්තා වූ 72,578 ට සාපේක්ෂව, 2016 වසර අවසානයේ දී 73,482 දක්වා සියයට 1.2 කින් වර්ධනය විය.

### 2.1 සාමාජික දායකත්ව හා අරමුදල් ප්‍රතිලාභ ගෙවීම

2016 වසරේ දායක මුදල් ලැබීම් 2015 වසරේ දී පැවති රුපියල් බිලියන 102.5 සිට රුපියල් බිලියන 118.3 දක්වා සියයට 15.4 කින් වර්ධනය විය. අරමුදලින් ප්‍රතිලාභ ලබාගත් මුළු සේවක සංඛ්‍යාව 2015 වසරේ දී වාර්තා වූ 127,106 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 47.1 කින් 187,027 දක්වා වැඩි වී ඇත. 2016 වසරේ දී සාමාජිකයන්ට හා ඔවුන්ගේ උරුමකරුවන්ට ගෙවන ලද ප්‍රතිලාභ සියයට 30 ප්‍රතිලාභ ගෙවීම් ද ඇතුළත්ව රුපියල් බිලියන 108.4 ක් වූ අතර, එය 2015 වසරේ ගෙවූ රුපියල් බිලියන 77.8 ට සාපේක්ෂව සියයට 39.3 ක වර්ධනයකි. ඒ අනුව,

**සංඛ්‍යා සටහන 2** **සේ.අ.අ. ප්‍රතිලාභ ගෙවීම් - 2016**

| ප්‍රතිලාභ ගෙවීම් සඳහා ඉවහල් වූ හේතුව | ප්‍රතිලාභ ගෙවීම් ඉල්ලුම්පත් ගණන | | ප්‍රතිලාභ ගෙවීම් වල මුළු එකතුව (අ) | |
|---|---|---|---|---|
| | ගණන | % | අගය (රු.බි.) | % |
| විශ්‍රාමික දිවියට එළඹීම | 87,373 | 46.72 | 58.91 | 54.74 |
| සියයට 30 ප්‍රතිලාභ | 60,021 | 32.09 | 33.66 | 31.27 |
| විවාහ හේතුවෙන් රැකියාවෙන් ඉවත්වීම | 22,816 | 12.20 | 5.89 | 5.48 |
| සංක්‍රමණය | 1,782 | 0.95 | 2.77 | 2.58 |
| වෛද්‍ය හේතූන් | 996 | 0.53 | 0.64 | 0.60 |
| සාමාජිකයාගේ මරණය | 4,565 | 2.44 | 2.43 | 2.26 |
| විශ්‍රාම වැටුප් ලැබෙන රැකියාවකට සම්බන්ධ වීම | 9,373 | 5.01 | 3.20 | 2.98 |
| වෙනත් | 101 | 0.05 | 0.11 | 0.11 |
| **එකතුව** | **187,027** | **100** | **107.63** | **100** |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) කොටස් ගෙවීම්, හිමිකම් නොපෑ ප්‍රතිලාභ හා රඳවාගනු ලැබූ ප්‍රතිලාභ හැර පළමු ප්‍රතිලාභ ගෙවීම් පමණක් මෙහි ඇතුළත් වේ.

ශුද්ධ දායක මුදල් (දළ දායක මුදල් ලැබීම් වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු) පසුගිය වසරේ වාර්තා වූ රුපියල් බිලියන 24.7 සිට රුපියල් බිලියන 9.9 දක්වා සියයට 60 ක අඩු වීමක් පෙන්නුම් කරන ලදී.

පසුගිය වසරවලට වෙනස්ව, 2016 වසර තුළ දී ශුද්ධ දායක මුදල්වල අඩුවීම සඳහා ප්‍රධාන ලෙස බලපාන කරුණ වූයේ නිවාස සහ වෛද්‍ය අවශ්‍යතා වෙනුවෙන් සියයට 30 ප්‍රතිලාභ ගෙවීම් පහසුකම් යටතේ ප්‍රතිලාභ ලබාගැනීම ඉහළ යාමයි. මුළු සියයට 30 ප්‍රතිලාභ ගෙවීම රුපියල් බිලියන 33.7 ක් වූ අතර අනෙකුත් මුළු ප්‍රතිලාභ ගෙවීම රුපියල් බිලියන 74.7 ක් විය. 2016 වසර අවසාන වන විට සියයට 30 ප්‍රතිලාභ ගෙවීම්වල සමස්ත වටිනාකම රුපියල් බිලියන 42.2 ක් විය. විශ්‍රාම දිවියට එළඹීම හේතුවෙන් සාමාජිකයන් සඳහා රුපියල් බිලියන 58.9 ක ප්‍රතිලාභ 2016 වසරේ දී ගෙවූ අතර, එය 2015 වසරේ ගෙවූ රුපියල් බිලියන 46.7 ට සාපේක්ෂව සියයට 26.2 ක වැඩි වීමකි. විවාහය හේතුවෙන් රැකියාවෙන් ඉවත් වූ සාමාජිකාවන් සඳහා ප්‍රතිලාභ ගෙවීම් රුපියල් බිලියන 5.4 ක් ලෙස 2015 වසරේ දී වාර්තා වූ අගයට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් බිලියන 5.9 දක්වා සියයට 9.1 කින් ඉහළ ගොස් ඇත. සංඛ්‍යා සටහන 02 හි දැක්වෙන පරිදි ගෙවූ ප්‍රතිලාභ වලින් වැඩි කොටසක් විශ්‍රාමික දිවියට එළඹි සාමාජිකයන් සඳහා වූ අතර, දෙවැනි වැඩිම ප්‍රතිලාභ ගෙවීම් සිදුවී ඇත්තේ සියයට 30 ප්‍රතිලාභ සඳහාය.

## 2.2 සේ.අ.අරමුදලේ ආයෝජන කළඹ

2016 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රුපියල් බිලියන 1,772.2 (පොත් අගය) ලෙස වාර්තා වූ අතර, එය 2015 වසරේ පැවති රුපියල් බිලියන 1,604.2 ට සාපේක්ෂව සියයට 10.5 ක වර්ධනයකි (රූප සටහන 12).

2016 වසරේ දී ආයෝජන කළඹෙහි වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ රුපියල් බිලියන 175.9 ක් වූ ශුද්ධ ආදායම සහ රුපියල් බිලියන 9.9 ක් වූ ශුද්ධ සාමාජික දායකත්වය වේ. සමස්ථ ආයෝජන කළඹ පිළිබඳව සලකා බැලීමේ දී, රජයේ සුරැකුම්පත් හි ආයෝජන සංකේන්ද්‍රණය වීම, 2015 වසරේ දී පැවති මුළු ආයෝජනවලින්

රූප සටහන 12 ආයෝජන කළඹෙහි සංයුතිය 2012 - 2016




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

සියයට 92.7 සිට 2016 වසර අග වන විට දී සියයට 93.1 දක්වා ඉහළ යාම තුළින් පෙන්නුම් කරයි. එහෙත්, ව්‍යාපාර කොටස්වල ආයෝජන 2015 වසරේ දී පැවති සියයට 5.5 සිට 2016 වසරේ දී සියයට 4.6 දක්වා පහත වැටුණි. තවද, සාංගමික ණයකරවල සියයට 1.9 ක් ආයෝජනය කළ අතර, ඉතිරි සියයට 0.4 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා රාජ්‍ය සුරැකුම්පත්වලින් ආවරණය වන ප්‍රතිවිකිණීමේ ගිවිසුම් (Reverse Repo) වැනි ඉහළ ද්‍රවශීලතාවයක් සහිත කෙටිකාලීන වත්කම්වල ආයෝජනය කර තිබුණි.

### 2.2.1 රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ

භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් හා රුපියල් සුරැකුම්පත් වලින් සමන්විත රජයේ සුරැකුම්පත් ආයෝජන කළඹ 2015 වසර අවසානයේ දී පැවති රුපියල් බිලියන 1,487 සිට 2016 වසර අවසානයේ දී රුපියල් බිලියන 1,650 දක්වා සියයට 11 කින් වර්ධනය විය.

සේවක අර්ථසාධක අරමුදල, 2016 වසරේ දී රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹෙන් රුපියල් බිලියන 161.7 ක පොලී ආදායමක් උපයාගෙන ඇත. රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹෙන් ක්‍රමක්ෂය ලාභ ලෙස රුපියල් බිලියන 28.17 ක් ද රාජ්‍ය සුරැකුම්පත් විකිණීමෙන් ලද ප්‍රාග්ධන ලාභ වශයෙන් රුපියල් මිලියන 612 ක් ද උපයා ගෙන ඇත. ඒ අනුව, අරමුදලේ මුළු දළ ආදායමෙන් සියයට 98.6 ක් වන රාජ්‍ය සුරැකුම්පත් තුළින්, අරමුදල විසින් ආයෝජනය මත රුපියල් බිලියන 190.5 ක ආදායමක් උපයා ඇති අතර, මෙය 2015 වසරට සාපේක්ෂව සියයට 13.9 ක වැඩි වීමකි. රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන

**සංඛ්‍යා සටහන 3** **රජයේ සුරැකුම්පත් කළඹෙහි කල්පිරීම් ආකෘතිය - 2016 වසර අවසානයට**

| කල්පිරීම | කල්පිරීමේ වටිනාකම (රුපියල් බිලියන) | දායකත්වය (%) | බරිත සාමාන්‍ය ප්‍රතිලාභය (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 63.90 | 3.57 | 11.11 |
| වසර 1-2 | 77.42 | 4.33 | 10.77 |
| වසර 2-5 | 293.05 | 16.39 | 10.99 |
| වසර 5 ට වැඩි | 1,353.29 | 75.70 | 11.26 |
| **එකතුව** | **1,787.66** | **100.00** | **11.19** |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

කළඹෙහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය 2016 වසර අවසානයේ දී සියයට 11.19 ක් විය. සංඛ්‍යා සටහන 3 මගින් දක්වන පරිදි ආයෝජනය කරන ලද රාජ්‍ය සුරැකුම්පත් තුළින් සියයට 24.3 ක් ඉදිරි වසර 5 ක කාලය තුළ පරිණත වීමට නියමිතය.

### 2.2.2 සමාගම් කොටස් කළඹ

සමාගම් කොටස් කළඹ, ලැයිස්තුගත හා ලැයිස්තුගත නොකළ කොටස් වලින් සමන්විත වන අතර, එය 2015 වසරේ වූ රුපියල් බිලියන 87.6 ක වටිනාකමට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් බිලියන 80.8 දක්වා රුපියල් බිලියන 6.8 (සියයට 7.76) කින් අඩු වී ඇත. සේ.අ.අ. මගින් විධිමත් ලෙස විවිධාංගීකරණය කරන ලද විකිණීම සඳහා තබාගෙන ඇති ආයෝජන කළඹක් පවත්වාගෙන යන අතර, එහි බැංකු, මූල්‍ය හා රක්ෂණ විවිධාංගීකරණ සමාගම්, ඉදිකිරීම් හා ඉංජිනේරු, බලශක්ති, හෝටල් සහ සංචාරක සහ විදුලි සන්දේශ යන ක්ෂේත්‍රයන් යටතේ කොටස්

**රූප සටහන 13** **2016 වසර අවසානයේ පැවති ලැයිස්තුගත කොටස් ආයෝජන කළඹේ ආංශික සංයුතිය**




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

වෙළෙඳපොළ තුළ ලැයිස්තුගත ප්‍රමුඛ සමාගම්හි කොටස් අඩංගු වේ (රූප සටහන 13). සමාගම් කොටස් ආයෝජන කළඹ තුළින් ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ ලෙස 2015 වසරේ දී උපයා ගන්නා ලද රුපියල් බිලියන 4.1 ට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් බිලියන 4.7 ක් උපයා ගත් බව වාර්තා විය. 2016 වසරේ දී, වෙළෙඳපොළ මිල පහත වැටීම හේතුවෙන් ලැයිස්තුගත සමාගම් 6 ක් සඳහා රුපියල් බිලියන 5.2 ක හානිකරණ අලාභයක් වාර්තා කරන ලදී.

### 2.2.3 සාංගමික ණය කළඹ

සේ.අ.අ. සාංගමික ණයකර, සුරැකුම් සහතික, උකස් සුරැකුම් ආදී සාංගමික ණය උපකරණයන්හි ආයෝජනය කර ඇත. 2016 වසරේ දී අරමුදල, ඉහළ ආයෝජන ශ්‍රේණියක් සහිත කොළඹ කොටස් වෙළඳපොළ ලැයිස්තුගත සාංගමික ණයකර නිකුත් කිරීම් 13 ක රුපියල් බිලියන 13.7 ක මුදලක් ආයෝජනය කරන ලදී. සාංගමික ණය කළඹ 2016 දෙසැම්බර් 31 දින වනවිට රුපියල් බිලියන 38.2 ක් වූ අතර, එය මුළු අරමුදලෙන් සියයට 2.2 ක් විය. සාංගමික ණය කළඹෙන් උපයන ලද පොලී ආදායම රුපියල් මිලියන 3,049 ක් වන අතර, සාමාන්‍ය ආයෝජන කළඹ මත වූ වාර්ෂික ප්‍රතිලාභ අනුපාතය වසර තුළ දී සියයට 9.57 ක් විය.

### 2.2.4 ප්‍රතිවිකුණුම් ගනුදෙනු

අරමුදලේ ද්‍රවශීලතාව කළමනාකරණය සඳහා දෛනික අතිරේක අරමුදල් රාජ්‍ය සුරැකුම්පත්

ඇප මත ප්‍රති විකුණුම්වල ආයෝජනය කරනු ලබයි. 2015 වසරේ දී ඉපැයූ රුපියල් මිලියන 435.5 ට සාපේක්ෂව, 2016 වසරේ දී අරමුදල රුපියල් මිලියන 738.4 ක පොලී ආදායමක් ප්‍රති විකුණුම් ගනුදෙනු මගින් උපයා ගන්නා ලදී.

### 2.2.5 අරමුදලේ ආදායම

අරමුදල විසින් රුපියල් බිලියන 192.9 ක ආදායමක් 2016 වසරේ දී උපයා ගත් අතර, එය පෙර වසරට සාපේක්ෂව සියයට 12.5 ක වර්ධනයකි (සංඛ්‍යා සටහන 4). පොලී ආදායම, අරමුදලේ ප්‍රධානතම ආදායම වූ අතර (මුළු ආදායමෙන් සියයට 85.8), එය 2015 වසරේ වූ රුපියල් බිලියන 143.1 සිට 2016 වසරේ දී රුපියල් බිලියන 165.5 දක්වා සියයට 15.7 කින් වර්ධනය විය. තවද, ව්‍යාපාර කොටස් මගින් ලැබුණු ලාභාංශ හා ප්‍රාග්ධන ලාභ 2015 වසරේ වූ රුපියල් මිලියන 3,671 සිට 2016 වසරේ දී රුපියල් මිලියන 3,873 ක් දක්වා සියයට 16 කින් වර්ධනය විය. වට්ටම් කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර මගින් ලැබූ ක්‍රමක්ෂය ලාභ 2015 වසරේ වූ රුපියල් බිලියන 26.6 ට සාපේක්ෂව 2016 වසරේ දී සියයට 5.9 කින් වර්ධනය වී, රුපියල් බිලියන 28.2 ක් විය (සංඛ්‍යා සටහන 4).

## 2.3 අරමුදලේ මෙහෙයුම් වියදම්

2015 වසරේ දී රුපියල් මිලියන 1,190.6 සිට 2016 වසරේ දී රුපියල් මිලියන 1,487.2 ක් දක්වා සියයට 25 කින් මෙහෙයුම් වියදම් වර්ධනයට වෙනත් වියදම්වල ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා ඇත. ඒ අනුව, දළ ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් මුළු මෙහෙයුම් වියදම 2015 වසරේ දී පැවැති සියයට 0.69, 2016 වසරේ දී සියයට 0.77 විය. අරමුදල් කළමනාකරුවන් සියයට 1 සිට සියයට 2 දක්වා වූ කළමනාකරණ ගාස්තු අය කරන වාතාවරණයක් තුළ, දළ ආදායමෙන් සියයට 1 ක අඩු මට්ටමක මෙහෙයුම් වියදම් පවත්වාගන යාම සුවිශේෂී ජයග්‍රහණයකි (සංඛ්‍යා සටහන 5).

## 2.4 බදු වියදම්

2006 අංක 10 දරන ආදායම් බදු පනතේ 35 වන වගන්තිය යටතේ සේ.අ.අ. විසින් ආදායම් බදු ලෙස සියයට 10 ක් ගෙවීමට බැඳී සිටී. 2016 වසරේ දී, සේ.අ.අ. රුපියල් මිලියන 15,657 ක් ආදායම් බදු වියදමක් දරා ඇති අතර, එය 2015 වසරේ ගෙවූ රුපියල් මිලියන 13,727 ට සාපේක්ෂව සියයට 14.1 ක වර්ධනයකි.

**සංඛ්‍යා සටහන 4** **ආයෝජන ආදායම**

| ආදායම් මූලාශ්‍රය | 2015 | | 2016 | |
|---|---|---|---|---|
| | වටිනාකම (රුපියල් මිලියන) | ප්‍රතිශතය (%) | වටිනාකම (රුපියල් මිලියන) | ප්‍රතිශතය (%) |
| පොලිය | 143,055 | 83.4 | 165,485 | 85.8 |
| ක්‍රමක්ෂය ලැබීම් | 26,591 | 15.5 | 28,171 | 14.6 |
| රජයේ සුරැකුම්පත් මගින් ලැබූ ප්‍රාග්ධන ලාභ | 1,171 | 0.7 | 612 | 0.3 |
| වෙළඳපොළ මිලට අගය කිරීමෙන් ලැබූ ලාභ/අලාභ | (394) | (0.2) | (842) | (0.4) |
| සමාගම් කොටස් මගින් ලැබූ ප්‍රාග්ධන ලාභ | 553 | 0.3 | 452 | 0.2 |
| ලාභාංශ | 3,512 | 2.0 | 4,263 | 2.2 |
| මූල්‍ය ආයෝජන හානිකරණය | (2,957) | (1.7) | (5,232) | (2.7) |
| **එකතුව** | **171,531** | **100.0** | **192,909** | **100.0** |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 5**

**මෙහෙයුම් වියදම්**

| අයිතමය | ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය | | | කම්කරු දෙපාර්තමේන්තුව | | |
|---|---|---|---|---|---|---|
| | 2015 (රුපියල් මිලියන) | 2016 (රුපියල් මිලියන) | වෙනස (%) | 2015 (රුපියල් මිලියන) | 2016 (රුපියල් මිලියන) | වෙනස (%) |
| සේවක වියදම් | 406 | 478 | 17.73 | 343 | 383 | 11.66 |
| පරිපාලන වියදම් | 232 | 231 | (0.43) | 165 | 172 | 4.24 |
| වෙනත් වියදම් | 33 | 212 | 542.4 | 12 | 11 | 8.33 |
| **එකතුව** | **671** | **921** | **37.3** | **520** | **566** | **8.85** |
| මුළු වියදම්, දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස | 0.39 | 0.48 | | 0.48 | 0.29 | |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.5 සාමාජික ගිණුම් ශේෂ හා ගෙවූ පොලිය

2016 වසරේ දී සියළු සාමාජික ගිණුම් ශේෂයන් 2015 වසරට සාපේක්ෂව සියයට 11.4 ක අගයකින් ඉහළ දමමින්, රුපියල් බිලියන 171.6 ක මුදලක් සාමාජිකයන් අතර පොලී ලෙස බෙදා

**රූප සටහන 14** **සාමාජික ශේෂ සහ ගෙවූ පොලිය**




මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

දුන් අතර, සාමාජික ගිණුම් ශේෂ 2015 වසරේ පැවති රුපියල් බිලියන 1,625.5 ට සාපේක්ෂව 2016 වසරේ දී රුපියල් බිලියන 1,810.6 ක් දක්වා වර්ධනය විය. මෑත වසර වලදී පොලී අනුපාත වෙනස්වන වාතාවරණයක් පැවතිය ද 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර තුළ දී ද පෙර වසර මෙන්ම වසර අවසානයේ පැවති සාමාජික ශේෂ මත සියයට 10.5 ක පොලී අනුපාතයක් ප්‍රකාශ කිරීමට අරමුදලට හැකි විය.

## 2.6 අවදානම් කළමනාකරණය

### 2.6.1 විශ්ලේෂණය

සේ.අ.අ. එහි ප්‍රමාණය අනුව වෙළෙඳපොළ මත ඉහළ බලපෑමක් ඇති කල හැකි ශ්‍රී ලාංකික මූල්‍ය ක්ෂේත්‍රයේ වැදගත් කොටස්කරුවෙකි. එමගින් පෞද්ගලික හා අර්ධ රාජ්‍ය සේවකයන් සඳහා උපරිම විශ්‍රාම ප්‍රතිලාභයක් ලබා දීම සඳහා ඔවුන්ගේ දිගුකාලීන විශ්‍රාමික ඉතුරුම් කළමනාකරණය කරනු ලබන අතර, රටේ සමස්ථ මූල්‍ය පද්ධතියේ අභිවෘද්ධිය සඳහා ද සහයෝගය දක්වනු ලබයි. ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය සහ ආයෝජන වෙළෙඳ මාර්ගෝපදේශයෙහි අර්ථසාධක අරමුදල විසින් දැරීමට සූදානම් අවදානම් මට්ටම නිර්වචනය කරන අතර, ආයෝජන සඳහා අරමුදල් වෙන් කිරීම් පදනම එමගින් සකසා ගනු ලබයි. අරමුදලේ අවදානම් අභිරුචිය ඇතුළත අරමුදල් ආයෝජනය කර ඇති බව නිශ්චය කර ගැනීම සඳහා, ආයෝජන කළඹ තුළ අරමුදල් වෙන් කිරීම නිරතුරුව සමාලෝචනයකරනු ලබයි. අරමුදල හා සම්බන්ධිත වැදගත් අවදානම් වන්නේ ද්‍රවශීලතා අවදානම, වෙළෙඳපොළ අවදානම, ණය නොගෙවා පැහැර හැරීමේ අවදානම සහ මෙහෙයුම් අවදානමයි.

### 2.6.2 ද්‍රවශීලතා අවදානම

සාමාජිකයන් විසින් මාසිකව එවනු ලබන දායක මුදල්, ප්‍රතිලාභ ගෙවීම හා සේ.අ.අ. හි අනෙකුත්

වියදම් පියවීමට සාමාන්‍යයෙන් ප්‍රමාණවත් වේ. ඒ අනුව, අතිරේක ද්‍රවශීලතාවයන් සහ අරමුදල් අවශ්‍යතා සඳහා කල්පිරීමට පෙර ආයෝජන අත්හිටුවීම අවශ්‍ය නොවේ. එම නිසා සේ.අ.අ. විසින් අනිවාර්ය ගෙවීම් සිදුකරන අතරතුර එහි මූල්‍ය තත්ත්වය දෛනිකව ඇගයීමට ලක් කරනු ලබයි. තවද, අරමුදල විසින් විවිධ පරිණත කාල සහිත උපකරණයන්හි ආයෝජනයන් සහ වෙළෙඳපොළ තුළ ඉතා ඉහළ ද්‍රවශීලතාවයක් සහිත උපකරණවල ආයෝජනයන් සිදුකර තිබෙන නිසා ඕනෑම මොහොතක ක්ෂණිකව පැන නගින ද්‍රවශීලතා ගැටළු වලට ද මුහුණ දීමේ හැකියාවක් තිබේ. එම නිසා අරමුදලේ ද්‍රවශීලතා අවදානම ඉතා අවම මට්ටමක පවතින බව සැලකිය හැකිය.

### 2.6.3 වෙළෙඳපොළ අවදානම

වෙළෙඳපොළ අවදානම යනු පොලී අනුපාත, විදේශ විනිමය හා කොටස් මිලෙහි හැසිරීම නිසා ආයෝජන කළඹෙහි හා මූල්‍ය උපකරණයන්හි වෙළෙඳපොළ අගය වෙනස් වීමෙන් සිදු විය හැකි අලාභයන් වේ. අරමුදල විසින් මුහුණපාන වෙළෙඳපොළ අවදානම මූලික වශයෙන් පොලී අනුපාත අවදානම සහ කොටස් මිල අවදානම හේතුවෙන් පැන නගී. වෙළෙඳපොළෙහි ඇති විවිධ පරිණත කාල සහිත සුරැකුම්පත් සියල්ලක්ම පාහේ තෝරා ගැනීම මගින්, අරමුදලේ පොලී අනුපාත අවදානම කළමනාකරණය කරනු ලබයි. රාජ්‍ය සුරැකුම්පත්, කල්පිරීම තෙක් තබා ගැනීමේ උපාය මාර්ගය යොදා ගැනීම හේතුවෙන් එම ආයෝජන කළඹ සඳහා නිරාවරණය වන පොලී අනුපාතික අවදානම අවම මට්ටමක පවතී. කොටස් මිල අවදානම යනු කොටස් මිල පහත වැටීම හේතුවෙන් සිදුවන කොටස් ප්‍රාග්ධනයේ වටිනාකම අඩුවීම වේ. ප්‍රාග්ධන වෙළෙඳපොළේ ශක්තිමත් අංශයන්හි කොටස් ආයෝජනය කිරීම තුළින් සහ ඵලදායී ලෙස විවිධාංගීකරණය කිරීම තුළින් කොටස් වෙළෙඳපොළ අවදානම අවම කර ගත හැකිය.

### 2.6.4 ණය නොගෙවා පැහැර හැරීමේ අවදානම

ආයෝජනයෙන් සියයට 93 ක් ම පැහැර හැරීමේ අවදානමක් නොමැති රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති හෙයින් අරමුදලේ ණය නොගෙවා පැහැර හැරීමේ අවදානම ඉතා අඩුය. තවද, සාංගමික ණය උපකරණවල ආයෝජනයේ දී අනුමත ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් ඉහළ ණය ශ්‍රේණිගත කිරීමක් ලබා දී තිබෙන ණය උපකරණවල ආයෝජනය කර තිබේ. ප්‍රමාණවත් රාජ්‍ය සුරැකුම්පත් මගින් අරමුදලේ සියළුම ප්‍රති විකුණුම් ආයෝජන සුරක්ෂිත කොට සේවක අර්ථසාධක අරමුදලේ භාරකාර ගිණුමේ පවත්වාගෙන යනු ලබයි. ඒ අනුව, රාජ්‍ය සුරැකුම්පත් මත වැඩි අවදානයක් යොමු කිරීම තුළින් අරමුදලේ ණය අවදානම ඉතා අඩු බව සැළකිය හැකිය.

### 2.6.5 මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු ප්‍රමාණවත් නොවූ හෝ අසාර්ථක අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගල හා පද්ධති හෝ බාහිර සිදුවීම් මගින් ඇති විය හැකි අලාභයන් නිසා ඇතිවන අවදානමයි. අඩු හස්තමය (Manual) මැදිහත් වීමකින්, සැලකිය යුතු මෙහෙයුම් කාර්යක්ෂමතාවයක් හා දත්ත වල නිවැරදිතාවයක් පවත්වාගෙන යාමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සාමාජිකයන්ගේ ගිණුම්, ගනුදෙනු වර්තා කිරීම, සමස්ත ක්‍රියාවලිය ඒකාබද්ධ කරමින් කේන්ද්‍රගත කර ඇත. තවද, සේ.අ.අ. අත්‍යාවශ්‍ය අභ්‍යන්තර පාලනයන් වන අභ්‍යන්තර විගණනය, කාර්යයන් වෙන්කර කටයුතු කිරීම, බලතල සීමා කිරීම් වැනි දෑ එහි සියලු මෙහෙයුම් කටයුතු සඳහා ස්ථාපිත කර ඇත. තවද අරමුදලේ පාර්ශවකරුවන්ගෙන් සිදුවිය හැකි යම් අඩුපාඩු හා අක්‍රමිතා වැළැක්වීම සඳහා ද මෙම ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කර ඇත.

### 2.6.6 රාජ්‍ය සුරැකුම්පත්වල අභ්‍යන්තර පාලනයන්

සේ.අ. අරමුදලේ ආයෝජන කමිටුව විසින් දෛනිකව නිරීක්ෂණය කරනු ලබන වෙළෙඳපොළ තත්ත්වයන් මත, රාජ්‍ය සුරැකුම්පත් සහ අනෙකුත් මූල්‍ය උපකරණවල ආයෝජනය සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදේ. තවද, ද්විතීය වෙළෙඳපොළ ක්‍රියාකාරකම්වල අවශ්‍යතාව හැකිතාක් අවම කරමින් ප්‍රාථමික වෙන්දේසි තුළින් රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය සිදු කිරීම තහවුරු කිරීමට අවශ්‍ය සියළුම ක්‍රියාමාර්යන් සේ.අ.අ. විසින් ගෙන තිබේ.

## 2.7 නිවාස ණය පහසුකම

නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව හා සමූපකාර ග්‍රාමීය බැංකුව යනාදී සහභාගිත්ව ණය දෙන ආයතන වලින් සාමාජිකයන්ට නිවාස ණයක් ලබා ගැනීමේ අරමුණින් 1988 වසරේ දී හඳුන්වා දුන් නිවාස ණය ක්‍රමය 2016 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක විය. මෙම ක්‍රමය යටතේ සේ.අ. අරමුදල මගින් මෙම වසර තුළ දී රුපියල් මිලියන 5,414 ක් වූ නිවාස ණය සඳහා අනුමැතිය ලබා ගැනීමට සාමාජික ශේෂ සහතිකපත් 12,780 ක ප්‍රමාණයක් ණය ලබා දෙන ආයතන වෙත ලබා දෙන ලදී. තවද, 2016 වසරේ දී, 2015 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් මිලියන 2,541 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම්වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතනවලට ප්‍රේෂණය කරන ලදී.

**සංඛ්‍යා සටහන 6** **නිවාස ණය පහසුකම**

| වසර | නිකුත් කළ සහතිකපත් (ගණන) | සේ.අ.අ. මගින් සහතික කරන ලද ණය (රුපියල් මිලියන) | ණය නිකුත් කරන ආයතන වලට ගෙවූ මුදල (රුපියල් මිලියන) |
|---|---|---|---|
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 | 11,234 | 3,973 | 2,019 |
| 2013 | 16,268 | 6,914 | 2,178 |
| 2014 | 17,786 | 8,021 | 2,394 |
| 2015 | 13,132 | 5,489 | 2,522 |
| 2016 | 12,780 | 5,414 | 2,541 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 2.8 නීතිය බලගැන්වීම

සේ.අ.අ පනතට අනුව, කම්කරු දෙපාර්තමේන්තුවට අරමුදලේ සාමාන්‍ය පරිපාලනයේ වගකීම හා නීතිය බලාත්මක කිරීමේ වගකීම පැවරී ඇත. ඒ අනුව, 2016 වසරේ දී දිස්ත්‍රික් කම්කරු කාර්යාල හා උප කාර්යාල විසින් නව සේවායෝජකයන් 7,134 දෙනෙක් හා නව සේවානියුක්තිකයන් 34,264 දෙනෙක්, සියලු පළාත් ආවරණය කරමින්, ලියාපදිංචි කර ඇත. 2016 වසරේ ලියාපදිංචි වූ සේවායෝජකයන්ගෙන් සියයට 50 කට වැඩි සේවායෝජකයන් පිරිසක් බස්නාහිර පළාතට අයත් වූ අතර, උතුරු සහ නැගෙනහිර පළාත් වලින් ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන් ගණන සියයට 6.5 ක් විය.

පනතේ විධිවිධානවලට අනුකූලව, සේවක දායක මුදල් නොගෙවන සේවායෝජකයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවට බලය ලබා දී ඇත. ඒ අනුව, දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල විසින් පිළිවෙලින් රුපියල් මිලියන 4,464 ක් හා රුපියල් මිලියන 3,454 ක් පියවා ගැනීම සඳහා මුල් නිවේදන 10,074 ක් ද, රතු නිවේදන 6,508 ක් ද නිකුත් කර ඇත. තවද, ගෙවීම් පැහැර හරින ලද ආයතනවලින් රතු නිවේදන ලබා දින 28 ක් ඇතුළත හිඟ මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වූ ආයතන 2,622 කට එරෙහිව සිදු කළ නඩු පැවරීම තුළින් රුපියල් මිලියන 855 ක් අයකර ගෙන ඇත.

## 2.9 සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

සේ.අ.අ. සාමාජිකයන්ට කාර්යක්ෂම සේවයක් සැපයීමේ අරමුණින් සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි (ජා.හැ.ප.) තොරතුරු සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කර, ජාතික හැඳුනුම්පත් අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය (UID) ලෙස භාවිතා කිරීමට හැකි වන ආකාරයේ විශේෂ ව්‍යාපෘතියක් දියත් කරන ලදී. මෙමගින් ආයතන දෙකටම පොදුවේ භාවිතා කළ හැකි සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවක් (MCD) සකස් කරන ලදී.

**සංඛ්‍යා සටහන 7** **නීතිය බලගැන්වීම**

| විස්තරය | | වසර 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම් | සේවායෝජකයන් | 9,799 | 6,822 | 7,213 | 6,736 | 7,134 |
| | සේවානියුක්තිකයන් | 412,255 | 448,398 | 296,056 | 48,007 | 34,264 |
| පළාත් අනුව සේවායෝජකයන් ලියාපදිංචි කිරීම (ලියාපදිංචි වූ මුළු සේවායෝජකයන්ගේ ප්‍රතිශතයක් ලෙස) | බස්නාහිර | 37 | 46 | 65 | 50 | 50 |
| | උතුරු සහ නැගෙනහිර | 24 | 10 | 3 | 7 | 6.5 |
| | අනෙකුත් | 39 | 44 | 32 | 43 | 43.5 |
| මුල් නිවේදන | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 13,134 | 12,807 | 12,132 | 9,015 | 10,074 |
| | පියවා ගත් මුදල (රු.මි.) | 4,604 | 5,100 | 6,280 | 4,018 | 4,464 |
| රතු නිවේදන | නිකුත් කර ඇති නිවේදන සංඛ්‍යාව | 7,874 | 8,411 | 13,578 | 5,670 | 6,508 |
| | පියවා ගත් මුදල (රු.මි.) | 2,792 | 6,132 | 1,121 | 2,864 | 3,454 |
| නඩු පැවරීම් | නඩු සංඛ්‍යාව | 2,991 | 2,744 | 3,397 | 6,458 | 2,622 |
| | අයකරගත් මුදල (රු.මි.) | 2,991 | 2,442 | 6,126 | 1,308 | 855 |

මූලාශ්‍රය : සේවක අර්ථසාධක අරමුදල් අංශය, කම්කරු දෙපාර්තමේන්තුව

2016 වසර අවසාන වනවිට මිලියන 1.8 කට ආසන්න සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමානයේ දායක මුදල ගෙවනු ලබන) සාමාජිකයන් නැවත ලියාපදිංචි කිරීම සිදු කර ඇත. ඒ අතුරින් සියයට 82 ක් (ගිණුම් මිලියන 1.4) පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබා දී ඇති අතර, සෙසු සාමාජිකයන්ගේ තොරතුරු තහවුරු කෙරෙමින් පවතී.

සේ.අ.අ. ට සම්බන්ධ වන නව සාමාජිකයන් තත්කාලීනව ජාතික හැඳුනුම්පත් තොරතුරු යටතේ ලියාපදිංචි කිරීම 2010 නොවැම්බර් මාසයේ සිට ආරම්භ කරන ලදී. ඒ අනුව, මාසිකව පළමු වරට දායක මුදල් ලැබෙන සාමාජිකයින්ගේ ජාතික හැඳුනුම්පත් තොරතුරු රැස්කර ගැනීම සඳහා මාසික නිරීක්ෂණ ක්‍රියාවලියක් ද පවත්වා ගෙන යනු ලබයි.

දැනට සිටින සාමාජිකයන් ලියාපදිංචිය හා නව සාමාජිකයන් ලියාපදිංචිය 69,326 වූ අතර, 2016 වර්ෂයේ දී සාමාජික කේන්ද්‍රීය දත්ත ගබඩාවට (Member Centric Database) මාරු කරන ලද මුළු ලියාපදිංචි සංඛ්‍යාව 76,386 කි.

## 2.10 විද්‍යුත් දත්ත භාවිතයෙන් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ක්‍රමය

සේ.අ.අ. විසින් හඳුන්වා දෙන ලද විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමය හරහා සේවායෝජකයන්ට සිය සේවානියුක්තිකයන්ගේ සේ.අ.අ. දායක මුදල් විස්තර විද්‍යුත් මාධ්‍යයෙන් එවීමටත්, පහසු ක්‍රමවේදයන් භාවිතයෙන් අදාළ දායක මුදල් ගෙවීමත්, 2012 වසර වන තෙක් ස්වේච්ඡා පදනම යටතේ ක්‍රියාත්මක වූ අතර, තම කාර්යයන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීම එහි අරමුණ විය. මෙම ක්‍රමවේදය මගින් පසුගිය වර්ෂයේ ප්‍රසාරණය වූ කාර්යයන් තවදුරටත් කඩිනමින් සිදුකිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදලට සහය වූ අතර, සේවායෝජකයන්ට ද ඔවුන්ගේ ස්වයංක්‍රීය කරන ලද වැටුප් පද්ධති හරහා තම සේ.අ.අ. දායක මුදල් ගෙවීම් සහ වාර්තා මාසිකව ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා ඇත. ඒ අනුව, 2012 අංක 02 දරණ සේ.අ.අ. සංශෝධන පනත යටතේ සේවානියුක්තිකයින් 50 ට වැඩි සේවායෝජකයන් වෙනුවෙන් විද්‍යුත්

දත්ත ක්‍රියාදාමය අනිවාර්ය කරන ලදී. ඊට අදාළ ගැසට් නිවේදනය 2013 මැයි මස නිකුත් කරන ලද අතර, අදාළ නියෝගයන් 2015 මාර්තු මස 03 වන දින පාර්ලිමේන්තුවේ දී සම්මත විය.

විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමය හඳුන්වා දෙනු ලැබූ මුල් අවස්ථාවේ දී, විද්‍යුත් දත්ත වාර්තා ඊ-තැපැල හරහා එවීමටත් අදාළ දායක මුදල් ගෙවීම් චෙක්පත් භාවිතයෙන් සිදු කිරීමටත් පහසුකම් සලසා තිබුණි. 2011 වසරේ දී සේ.අ.අ. සහ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් සමග ඒකාබද්ධ වෙමින් මාර්ගගත ගෙවුම් ක්‍රමයක් හඳුන්වා දෙන ලද අතර, ඒ හරහා සේවායෝජකයන් වන සිය ගනුදෙනුකරුවන්ට විද්‍යුත් දත්ත වාර්තා එවීම සහ අදාළ දායක මුදල් ගෙවීම මාර්ගගතව සිදු කිරීමට පහසුකම් සලසා දෙන ලදී. අනතුරුව, වසර 2012 සහ 2013 කාලය තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු වන ලංකා බැංකුව, මහජන බැංකුව, සම්පත් බැංකුව පී.එල්.සී. සහ හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. ද සිය මාර්ගගත ගෙවුම් පද්ධතීන් හරහා සේ.අ.අ. දායක මුදල් ගෙවීමේ පහසුකම සිය ගනුදෙනුකරුවන්ට ලබා දෙමින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ නියෝජිත බැංකු අතරට එක්වන ලදී.

සේ.අ.අ. විසින් 2016 වසරේ දී මාර්ගගත බැංකු පද්ධතිය, ස්වයංක්‍රීයව සාමාජික දත්ත යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් ලෙස තවදුරටත් වැඩි දියුණු කළ අතර, එමගින් සේවායෝජකයන්ට ඔවුන්ගේ සේවකයන්ගේ මාසික විද්‍යුත් දත්ත ගොනුවන් හි ඇති සාමාජික දත්ත මාර්ගගතව සත්‍යාපනය කිරීමට ද හැකියාව ලැබී ඇත. මෙම වැඩි දියුණු කරන ලද ක්‍රියාදාමය, අඩු හස්තමය මැදිහත් වීමකින් යුතුව සාමාජික ගිණුම් යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය වඩාත් වේගවත් කරන ලදී. 2016 වසර අවසානයේ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. සහ ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී. ද සිය ගනුදෙනුකරුවන්ට මෙම නව ක්‍රමය මගින් සේ.අ.අ. ගෙවීමේ පහසුව සලසා ඇත. ඒ අනුව, විද්‍යුත් දත්ත භාවිතයෙන් ගණුදෙනුකරුවන්ට පහසුකම් සැපයීමට සේ.අ.අ. බලපත්‍රලාභී වාණිජ බැංකු 6ක් සමග දැනටමත් එක්වී ඇත. තවදුරටත්, මාර්ගගත බැංකු ක්‍රමය හරහා සේ.අ.අ. ප්‍රතිලාභ සපයන බැංකුවලට, නව ක්‍රමයට මාරු වීමත්, දැනට සම්බන්ධ නොවූ අනෙකුත් වාණිජ බැංකු මෙම ක්‍රමයට සම්බන්ධ කරගැනීම උදෙසාත් විධි විධාන සලසනු ලැබීය. ඉහත සඳහන් කළ බැංකුවල ගිණුම් පවත්වා නොගන්නා සේවායෝජකයින්ට චෙක්පත් භාවිතයෙන් ගෙවීම් කටයුතු කිරීමට විකල්ප ගෙවීම් ක්‍රමයක් ලෙස අන්තර් බැංකු ගෙවුම් පද්ධතිය හා සම්බන්ධ සෘජු හර කිරීමේ ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

ඒ අනුව, 2016 වසර අවසාන වනවිට විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය යටතේ ලියාපදිංචිව සිටි සේවායෝජකයින් සංඛ්‍යාව 6,955 දක්වා සියයට 14 ක පමණ ප්‍රමාණයකින් සැළකිය යුතු ලෙස 2015 ට සාපේක්ෂව වර්ධනය වී ඇත. මෙම සේවායෝජකයන් මිලියන 2.4 ක් වූ සක්‍රීය සාමාජිකයන්ගෙන් සියයට 76 ක් සහ රුපියල් බිලියන 118 ක් වූ 2016 වසරේ මුළු එකතු කර ගැනීම් වලින් සියයට 80 ක් පමණ ප්‍රමාණයක් ආවරණය කර ඇත. තවදුරටත්, සේ.අ.අ. සේවායෝජකයන් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදයට සම්බන්ධ කර ගැනීම සඳහා අඛණ්ඩව දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වාගෙන ගිය අතර, වසර තුළ දී විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය හා සම්බන්ධ වූ සේවායෝජකයන්ට අවශ්‍ය තොරතුරු සහ උපදෙස් සපයනු ලැබීය.

## 2.11 පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ වැඩසටහන

2012 අංක 02 දරන සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනත හා ඉන් පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙන් සම්මත වූ නියෝගවලට අනුව, සුදුසුකම්ලාභී සාමාජිකයන් හට තම ගිණුමේ ශේෂයෙන් සියයට 30 කට නොවැඩි ප්‍රතිලාභ නිදහස් කිරීමේ වැඩසටහන 2015 ජූලි මස සිට ආරම්භ කරන ලදී.

වසර 10කට වඩා වැඩි කාලයක් සඳහා අරමුදලට ප්‍රතිලාභ ගෙවා ඇති සහ රුපියල් 300,000 කට වැඩි මුදලක් තම පෞද්ගලික ගිණුමේ බැරව පවතින දැනට සේවා නියුක්ත සාමාජිකයන් නිවාස හා වෛද්‍ය අවශ්‍යතා වෙනුවෙන් පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම් ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

මෙම වැඩසටහන සඳහා ඉහළ ඉල්ලුමක් ඇති අතර, 2016 වසර තුළදී 60,000කට අධික අර්ථලාභීන් පිරිසකට රුපියල් බිලියන 33.7 ක් ප්‍රතිලාභ වශයෙන් ගෙවන ලදී. 2016 වසර අවසානයේ දී, මෙම වැඩසටහන යටතේ

70,000කට අධික සුදුසුකම්ලත් සාමාජිකයන් හට රුපියල් බිලියන 41 ක් ගෙවන ලදී.

## 2.12 ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය

සේවක අර්ථසාධක අරමුදල් ක්‍රියාවලිය තුළ හැකිතාක් දුරට කඩදාසි වලින් අවම වූ පරිසරයක් ස්ථාපනය කර අරමුදලේ සමස්ථ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව 2013 වසරේ දී ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියරය 2015 වසරේ දී සාර්ථකව නිම කිරීම හරහා සේවක අර්ථසාධක අරමුදලෙහි සාම්ප්‍රදායික ලේඛනගත පරිසරය විද්‍යුත් වාර්තාකරණ පරිසරයක් බවට පරිවර්තනය කර ඇත. ප්‍රධාන ලිපිගොනු, ඩී-වාර්තා සහ නැවත ලියාපදිංචි කිරීමේ වාර්තා ආදී ලිපි ලේඛන පරිලෝකනය කර වාර්තා කළමනාකරණ පද්ධතියට ආගත කරනු ලැබේ.

විද්‍යුත් වාර්තා කළමනාකරණ පද්ධතිය මගින් වාර්තා පරිශීලන කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම හරහා උපරිම ලෙස එකවර 298 දෙනෙකුට පමණ වාර්තා පරිශීලනය කිරීමේ හැකියාව ලබාදී ඇත. වාර්තාවන් ලබා ගැනීමේ/ආගත කිරීමේ වේගය වැඩි කර ඇති අතර වාර්තා ගබඩා කිරීම සඳහා වෙන් කර ඇති ඉඩකඩ වර්ග අඩි 4,000 සිට වර්ග අඩි 8 දක්වා අඩු කර ඇත. සාම්ප්‍රදායික වාර්තාකරණ ක්‍රියාවලිය විද්‍යුත් ලියවිලි සහිත පරිසරයක් බවට පරිවර්තනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ලිපිලේඛන පවත්වා ගැනීම සහ යාවත්කාලීන කිරීම සඳහා අවම සේවක මැදිහත්වීමක් පැවතීම, ගබඩා සඳහා ගෙවන කුලිය අඩුවීම සහ වාර්තා පවත්වා ගැනීම හා සෙවීම සඳහා යන කාලය ඉතුරුවීම හේතුකොට ගෙන සැලකිය යුතු පිරිවැය ඉතිරියක් සිදුවී ඇත. තවදුරටත්, ඕනෑම ස්ථානයක සිට ප්‍රධාන ලිපිගොනුවලට ප්‍රවේශ වීමට හැකි නිසා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවලට ද සේවක අර්ථසාධක අරමුදලේ සේවාවන් විමධ්‍යගත කිරීමට විද්‍යුත් වාර්තා කළමනාකරණ පද්ධතිය මගින් හැකියාව සලසා ඇත.

ව්‍යාපෘතියේ පළමු අදියර ක්‍රියාත්මක කිරීම තුළින් ඇති වූ කාර්යක්ෂමතා හා ප්‍රතිලාභ සලකාගෙන, වැදගත් හා නිතර පරිශීලනයට අවශ්‍ය වන දෘඪ වාර්තා ද විද්‍යුත් වාර්තා බවට පරිවර්තනය කිරීමේ අරමුණින් ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර 2016 වසර අගදී අරඹන ලදී. ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියරේදී විද්‍යුත් වාර්තා බවට පරිවර්තනය කිරීමට අපේක්ෂිත වාර්තාවන් ලෙස සැලකෙන්නේ: 2013, 2014 සහ 2015 කාලච්ඡේදයන්ට අදාල සේවක ප්‍රතිලාභ එකතු කර ගැනීම සඳහා යොදා ගන්නා ''සී'' සහ ''සී3'' වාර්තා; 2002 සිට 2015 දක්වා වන (2013 වසර හැර) ප්‍රතිලාභ ගෙවීමේ වැඩ වාර්තා; 1974 සිට 2009 දක්වා වන කේවල සේව්‍ය ලෙජර; 2010 වසරේ සිට වාර්තා සංශෝධනයට අදාල වන ලිපිලේඛන සහ 2014 වසරට අදාල වන නැවත ලියාපදිංචි කිරීමේ වාර්තා වේ.

ලේඛන ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර 2017 වසර අගදී නිම කිරීමට යෝජිතය.

## 2.13 මහජනතාව දැනුම්වත් කිරීම

වැරදි වලින් තොර දත්ත ගොනුවක් නිර්මාණය කිරීම සඳහා සාමාජික ගිණුම්වල සිදුවන වැරදි අවම කිරීම, සාමාජිකයන්ට හා සේවායෝජකයන්ට පහසුව සැලසෙන සේවාවන් සැපයීම සහ සාමාජිකයන්ගේ/සේවායෝජකයන්ගේ විමසීම් අවම කිරීම සඳහා මහජනතාව දැනුම්වත් කිරීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුව තුළ ප්‍රමුඛතාවය දෙනු ලබයි. ඒ අනුව, ඉහත අරමුණ ළඟා කර ගැනීමේ ප්‍රධාන පියවරක් වශයෙන් 2016 වසර තුළ දී ජංගම සේවාවන් කිහිපයක් සංවිධානය කරන ලදී. බදුල්ල, හම්බන්තොට, රත්නපුර හා පොළොන්නරුව යන දිස්ත්‍රික්ක ඇතුළත්ව විවිධ ප්‍රදේශයන්හි සේ.අ.අ. දෙපාර්තමේන්තුව ජංගම සේවාවන් දහයක් 2016 වසර තුළ දී පවත්වන ලදී. කම්කරු දෙපාර්තමේන්තුව සහ අනෙකුත් රාජ්‍ය ආයතන වන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සහ අදාළ ප්‍රදේශවල දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගේ ද, පොලිස් දෙපාර්තමේන්තුවේ ද සහභාගිත්වය ඇතිව මෙම ජංගම සේවාවන් පවත්වන ලදී.

තවද, සාමාජික පහසුව සැලසෙන අයුරින් සේ.අ.අ. අදාල සේවාවන් සැපයීමට සහයෝගය දැක්වීමක් වශයෙන් සේ.අ.අ. වසර තුළ දී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය කරමින්, ජාතික

සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ලද ජංගම සේවාවන් අටක් සඳහා සහභාගී විය.

ජංගම සේවාවන් ඔස්සේ සේ.අ.අ. සාමාජිකයන්ට හා මහජනතාවට සපයන සේවාවන් ලෙසඃ සාමාජිකයන් සඳහා සේ.අ. අරමුදල් ප්‍රකාශන නිකුත් කිරීම, සාමාජික තොරතුරු හා ගිණුම් සංශෝධනය කිරීම, සාමාජික තොරතුරු නැවත ලියාපදිංචි කිරීම, අන්තර්ජාලය යටතේ සාමාජික ගිණුම් ශේෂ විමසීම් සහ විද්‍යුත් දත්ත සේවාවන් සඳහා සාමාජිකයින් දිරිමත් කිරීම, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සේ.අ.අ. සාමාජිකයන්ට ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීම සහ අනෙකුත් අදාළ සේවාවන් ලබාදීම, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සේ.අ.අ. සාමාජිකයින්ට උප්පැන්න සහතික/අනුමාන වයස් සහතික/ අවලංගු වාර්තා සහ අදාළ සේවාවන් ලබා දීම සහ සමස්ත සේ.අ.අ. ක්‍රියා පිළිවෙල පිළිබඳ උපදෙස් ලබා දීම ඇතුළත් වේ.

ජංගම සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නංවා ගැනීමේ අරමුණින් සෑම ජංගම සේවාවකට ප්‍රථම අදාළ සේවායෝජකයන්, කළමනාකරුවන් හා අනෙකුත් පරිපාලන/මානව සම්පත් මාණ්ඩලික නිලධාරීන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම සිදු කෙරිණි.

ඊට අමතරව, පෝස්ටර්, අත් පත්‍රිකා, වීඩියෝ පට සහ විවිධ ඉදිරිපත් කිරීම් වැනි සන්නිවේදන මාධ්‍යයන් ඔස්සේ දැනුම්වත් කිරීමේ ක්‍රියාකාරකම් ජංගම සේවාවන්ට සමගාමීව සේවායෝජකයන්, සේවකයන් හා අනෙකුත් පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් සිදු කෙරුණි.

# සේවක අර්ථසාධක අරමුදල
# ආදායම් හා වියදම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2016 | | | 2015 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය | කම්කරු දෙපාර්තමේන්තුව | එකතුව | එකතුව |
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| පොලී ආදායම් | 5 | 165,485,417 | - | 165,485,417 | 143,055,071 |
| ලාභාංශ ආදායම් | 6 | 4,262,609 | - | 4,262,609 | 3,512,418 |
| මූල්‍ය වත්කම් මත උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ | 7 | 1,063,965 | - | 1,063,965 | 1,724,310 |
| කල්පිරීම තෙක් තබාගෙන ඇති මූල්‍ය වත්කම් මත ක්‍රමක්ෂය ලාභ | 8 | 28,170,893 | - | 28,170,893 | 26,590,827 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය උපකරණ මත ශුද්ධ අලාභ | 9 | (842,114) | - | (842,114) | (393,998) |
| මූල්‍ය වත්කම් හානිකරණය | 10 | (5,231,637) | - | (5,231,637) | (2,956,641) |
| **ආයෝජන ආදායම්** | | **192,909,133** | **-** | **192,909,133** | **171,531,987** |
| වෙනත් ආදායම් | 11 | 157,176 | 5,087 | 162,263 | 323,310 |
| **දළ ආදායම** | | **193,066,309** | **5,087** | **193,071,396** | **171,855,297** |
| මෙහෙයුම් වියදම් | 12 | (921,007) | (566,233) | (1,487,240) | (1,190,616) |
| **ආදායම් බදු පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)** | | **192,145,302** | **(561,146)** | **191,584,156** | **170,664,681** |
| ආදායම් බදු වියදම | 13 | (15,657,191) | - | (15,657,191) | (13,727,402) |
| **වසරේ මෙහෙයුම් ලාභය/(අලාභය)** | | **176,488,111** | **(561,146)** | **175,926,965** | **156,937,279** |
| ඉදිරියට ගෙන එන ලද රඳවා ගත් ලාභ | | | | 215,575 | 311,297 |
| **බෙදාහැරීම සඳහා ඇති ලාභය** | | | | **176,142,540** | **157,248,576** |
| ලාභ බෙදාහැරීම | | | | | |
| අඩු කළා : වර්ෂය තුළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලී | | | | (4,645,766) | (2,833,014) |
| එකතු/(අඩු) කළා : ලාභ සම කිරීමේ සංචිත අරමුදලෙන්/(අරමුදලට) මාරු කිරීම | | | | 250,000 | |
| 2016.12.31 දිනට සාමාජික ශේෂ මත පොලිය - 10.50% (2015 - 10.50%) | | | | (171,557,433) | (154,199,987) |
| **ඉදිරි වර්ෂය සඳහා ඉදිරියට ගෙනයන ලද ශේෂය** | | | | **189,341** | **215,575** |

පිටු අංක 36 සිට 81 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වගකීමට බැඳේ.
මුදල් මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශන අනුමත කරන ලදී.

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

| | |
|---|---|
| ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි | කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර |
| අධිපති | අධිකාරී |
| ශ්‍රී ලංකා මහ බැංකුව | සේවක අර්ථසාධක අරමුදල |

දිනය : 2017 පෙබරවාරි 20

# සේවක අර්ථසාධක අරමුදල
# විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2016<br>රු.000 | 2015<br>රු.000 |
|---|---|---|---|
| වර්ෂය තුළ ලාභය | | 175,926,965 | 156,937,279 |
| **වෙනත් විස්තීර්ණ ආදායම්** | | | |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම මත ශුද්ධ අලාභය | 14 | (8,180,733) | (8,013,908) |
| **කාලපරිච්ඡේදය සඳහා වූ මුළු විස්තීර්ණ ආදායම** | | **167,746,232** | **148,923,371** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

| | |
|---|---|
| ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි | කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර |
| අධිපති | අධිකාරී |
| ශ්‍රී ලංකා මහ බැංකුව | සේවක අර්ථසාධක අරමුදල |

දිනය : 2017 පෙබරවාරි 20

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනට | සටහන | 2016<br>රු.000 | 2015<br>රු.000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| දේපළ පිරියත හා උපකරණ | 15 | 276,675 | 273,948 |
| අස්පෘශ්‍ය වත්කම් | 16 | 1,261 | 864 |
| මූල්‍ය වත්කම් - ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | 17 | 14,222,501 | 3,703,036 |
| මූල්‍ය වත්කම් - විකිණීමට ඇති | 18 | 162,552,422 | 135,047,349 |
| මූල්‍ය වත්කම් - කල්පිරීම තෙක් තබාගත් | 19 | 1,592,691,816 | 1,461,390,601 |
| මූල්‍ය වත්කම් - ණය සහ ලැබිය යුතු දෑ | 20 | 2,745,000 | 4,100,000 |
| තොගය | | 9,286 | 34,587 |
| ලැබිය යුතු පොලී | | 54,435,170 | 47,992,397 |
| ලැබිය යුතු දායක මුදල් | | 10,794,640 | 8,988,745 |
| වෙනත් ජංගම වත්කම් | 21 | 2,976,568 | 2,910,820 |
| මුදල් හා මුදල් සමාන දෑ | 22 | 4,385,242 | 3,691,577 |
| | | **1,845,090,581** | **1,668,133,924** |
| **වගකීම්** | | | |
| ණයහිමියෝ | 23 | 1,980 | 3,961 |
| උපචිත වියදම් | | 185,065 | 396,657 |
| වෙනත් ජංගම වගකීම් | 24 | 3,406,489 | 2,880,889 |
| | | **3,593,534** | **3,281,507** |
| **මුළු ශුද්ධ වත්කම්** | | **1,841,497,047** | **1,664,852,417** |
| නියෝජනය කරනු ලබන්නේ, | | | |
| සාමාජික ශේෂ | 25 | 1,810,594,518 | 1,625,492,921 |
| | | **1,810,594,518** | **1,625,492,921** |
| සංචිත | 26 | 30,713,188 | 39,143,921 |
| රඳවාගත් ලාභ | | 189,341 | 215,575 |
| | | **30,902,529** | **39,359,496** |
| **අරමුදලේ මුළු ශුද්ධ වටිනාකම** | | **1,841,497,047** | **1,664,852,417** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2017 පෙබරවාරි 20

# සේවක අර්ථසාධක අරමුදල
# ලැබීම් හා ගෙවීම් ගිණුම

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | සටහන | 2016 | | | 2015 |
|---|---|---|---|---|---|
| | | මුදල් මණ්ඩලය රු.000 | කම්කරු දෙපාර්තමේන්තුව රු.000 | එකතුව රු.000 | එකතුව රු.000 |
| වසරේ ආරම්භක මුදල් ශේෂය | | 3,691,577 | 27,382 | 3,718,959 | 2,618,713 |
| මුළු ලැබීම් | 27 | 332,451,661 | 616,189 | 333,067,850 | 311,790,946 |
| මුළු ගෙවීම් | 28 | (331,757,996) | (576,057) | (332,334,053) | (310,690,700) |
| **වසර අවසාන මුදල් ශේෂය** | | **4,385,242** | **67,514** | **4,452,756** | **3,718,959** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරී
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2017 පෙබරවාරි 20

# සේවක අර්ථසාධක අරමුදල
# ආයෝජන ප්‍රකාශනය

| ආයෝජන කාණ්ඩය | සටහන | මුහුණත අගය රු.000 | පිරිවැය රු.000 | ක්‍රමක්ෂය අගය රු.000 | වෙළෙඳපොළ අගය රු.000 | පොත් අගය රු.000 |
|---|---|---|---|---|---|---|
| *2016 දෙසැම්බර් 31 දිනට* | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 17,18,19 | 1,737,219,190 | 1,569,333,652 | 1,619,623,282 | 1,498,488,396 | 1,611,629,158 |
| භාණ්ඩාගාර බිල්පත් | 18 | 41,056,824 | 37,980,948 | 38,424,111 | 38,815,227 | 38,815,227 |
| සාංගමික ණයකර | 17,18,19 | 34,343,590 | 34,343,794 | 34,343,709 | 34,058,321 | 34,339,359 |
| භාරකාර සහතිකපත් | 19 | 4,499,810 | 3,397,594 | 3,832,592 | 3,832,592 | 3,832,592 |
| ලැයිස්තුගත කොටස් | 17,18 | - | 69,603,701 | 69,603,701 | 70,579,779 | 70,579,779 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 18 | - | 10,270,625 | 10,270,625 | 10,270,625 | 10,270,625 |
| ප්‍රති විකුණුම් | 20 | 2,745,000 | 2,745,000 | 2,745,000 | 2,745,000 | 2,745,000 |
| | | **1,819,864,415** | **1,727,675,314** | **1,778,843,021** | **1,658,789,940** | **1,772,211,740** |
| *2015 දෙසැම්බර් 31 දිනට* | | | | | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 17,18,19 | 1,612,461,341 | 1,442,536,353 | 1,487,297,477 | 1,562,120,452 | 1,487,004,275 |
| සාංගමික ණයකර | 17,18,19 | 22,479,263 | 22,479,466 | 22,593,481 | 22,593,481 | 22,593,481 |
| භාරකාර සහතිකපත් | 19 | 3,346,402 | 2,475,227 | 2,929,796 | 2,929,796 | 2,929,796 |
| ලැයිස්තුගත කොටස් | 17,18 | - | 73,302,843 | 73,302,843 | 77,342,809 | 77,342,809 |
| ලැයිස්තුගත නොකළ කොටස් | 18 | - | 10,270,625 | 10,270,625 | 10,270,625 | 10,270,625 |
| ප්‍රති විකුණුම් | 20 | 4,100,000 | 4,100,000 | 4,100,000 | 4,100,000 | 4,100,000 |
| | | **1,642,387,006** | **1,555,164,515** | **1,600,494,222** | **1,679,357,164** | **1,604,240,986** |

මුදල් මණ්ඩලය වෙනුවෙන්,

ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

කේ.එන්.එන්. මල්කාන්ති බණ්ඩාර
අධිකාරි
සේවක අර්ථසාධක අරමුදල

දිනය : 2017 පෙබරවාරි 20

## සේවක අර්ථසාධක අරමුදල
## හිමිකම් ප්‍රාග්ධනයේ / සාමාජිකයන්ගේ ධනයේ වෙනස්වීමේ ප්‍රකාශනය

| විස්තරය | සාමාජික ශේෂය රු.000 | ගොඩනැගිලි සංචිත අරමුදල රු.000 | තාක්ෂණ ප්‍රවර්ධන සංචිත අරමුදල රු.000 | ලාභ සම කිරීමේ සංචිත අරමුදල රු.000 | පොදු සංචිත අරමුදල රු.000 | ආයෝජන ප්‍රත්‍යාගණන සංචිත රු.000 | රඳවාගත් ලාභ රු.000 | එකතුව රු.000 |
|---|---|---|---|---|---|---|---|---|
| **2015.01.01 දිනට ශේෂය** | 1,445,462,269 | 3,157,000 | 350,000 | 18,100,000 | 6,650,000 | 12,900,829 | 311,297 | 1,486,931,395 |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම | - | - | - | - | - | (8,013,908) | - | (8,013,908) |
| 2015 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 156,937,279 | 156,937,279 |
| 2015 වසරේ ශුද්ධ දායක මුදල් | 25,830,665 | - | - | - | - | - | - | 25,830,665 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2015 | - | - | - | - | - | - | (2,833,014) | (2,833,014) |
| සාමාජික පොලී (2015 : 10.50%) | 154,199,987 | - | - | - | - | - | (154,199,987) | - |
| ගෙවිය යුතු ලාභාංශ | - | - | - | 6,000,000 | - | - | - | 6,000,000 |
| රඳවාගත් ලාභයට මාරු කිරීම් | - | - | - | - | - | - | - | - |
| **2015.12.31 දිනට ශේෂය** | **1,625,492,921** | **3,157,000** | **350,000** | **24,100,000** | **6,650,000** | **4,886,921** | **215,575** | **1,664,852,417** |
| විකිණීමට ඇති මූල්‍ය වත්කම්වල සාධාරණ අගයේ ශුද්ධ වෙනස් වීම | - | - | - | - | - | (8,180,733) | - | (8,180,733) |
| 2016 වසරේ ශුද්ධ ලාභය | - | - | - | - | - | - | 175,926,965 | 175,926,965 |
| 2016 වසරේ ශුද්ධ දායක මුදල් | 13,544,164 | - | - | - | - | - | - | 13,544,164 |
| ප්‍රතිලාභ මත සාමාජික පොලී ගෙවීම - 2016 | - | - | - | - | - | - | (4,645,766) | (4,645,766) |
| ගෙවිය යුතු සාමාජික පොලී (2016 : 10.50%) | 171,557,433 | - | - | - | - | - | (171,557,433) | - |
| ලාභ සම කිරීමේ සංචිතයට මාරු කිරීම | - | - | - | (250,000) | - | - | 250,000 | - |
| **2016.12.31 දිනට ශේෂය** | **1,810,594,518** | **3,157,000** | **350,000** | **23,850,000** | **6,650,000** | **(3,293,812)** | **189,341** | **1,841,497,047** |

# සේවක අර්ථසාධක අරමුදල
# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | 2016<br>රු.000 | 2015<br>රු.000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | |
| ආයෝජන මගින් ලද පොලී | 158,387,150 | 136,306,455 |
| කොටස් සුරැකුම්පත් වලින් ලද ලාභාංශ | 2,817,019 | 3,234,815 |
| අධිභාර සහ වෙනත් ආදායම් | 153,281 | 327,431 |
| වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් අයකර ගැනීම් | 1,088,846 | 36 |
| වෙනත් මෙහෙයුම් වියදම් | (1,069,243) | (747,547) |
| අත්තිකාරම් ගෙවීම් | (9,574) | (5,948) |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | (2,927,373) | (2,648,346) |
| **මෙහෙයුම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **158,440,106** | **136,466,896** |
| | | |
| බදු ගෙවීම් | (7,869,247) | (15,293,504) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්** | **150,570,859** | **121,173,392** |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල්** | | |
| මූල්‍ය වත්කම්වල ආයෝජන | (826,843,887) | (665,266,272) |
| ආයෝජන කල්පිරීම් | 615,601,139 | 452,074,473 |
| මූල්‍ය ආයෝජන තුළින් උත්පාදනය කරන ලද මුදල් | 51,531,146 | 68,113,346 |
| දේපළ පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම | (48,329) | (290,337) |
| ඉදිකෙරෙමින් පවතින වත්කම් | - | 370,000 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා ශුද්ධ මුදල් භාවිතය** | **(159,759,931)** | **(144,998,790)** |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් තුළින් ලද මුදල්** | | |
| ලද දායක මුදල් | 118,326,507 | 102,453,320 |
| පොදු තැන්පතු | 16,723 | 246,853 |
| සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම් | (108,392,979) | (77,768,589) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද මුදල්** | **9,950,251** | **24,931,584** |
| | | |
| **මුදල් හා මුදල් සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්** | **761,179** | **1,106,186** |
| | | |
| වර්ෂය ආරම්භක දිනට මුදල් හා මුදල් සමාන දෑ | 3,691,577 | 2,612,773 |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ - ගැළපුම් වලට පෙර** | **4,452,756** | **3,718,959** |
| ගැළපීම් : | | |
| කම්කරු දෙපාර්තමේන්තුවේ වර්ෂ අවසාන මුදල් ශේෂය | (67,514) | (27,382) |
| **වර්ෂය අවසාන දිනට මුදල් හා මුදල් සමාන දෑ (සටහන අ)** | **4,385,242** | **3,691,577** |
| | | |
| සටහන අ | | |
| දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ විශ්ලේෂණය | | |
| අතැති මුදල් | 4 | 20 |
| බැංකුවේ ඇති මුදල් | 3,941,838 | 3,691,557 |
| මාර්ගස්ථ මුදල් | 443,400 | - |
| | **4,385,242** | **3,691,577** |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

### 1.1. වාර්තාකරණ ආයතනය

සේවක අර්ථසාධක අරමුදල (''සේ.අ.අ.'' හෝ ''අරමුදල'') යනු 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා ඇති කරන ලද අනිවාර්ය දායකත්ව විශ්‍රාම වැඩසටහනකි. අරමුදලේ පොදු පරිපාලක ලෙස කම්කරු කොමසාරිස්වරයා කටයුතු කරන අතර, අරමුදලේ භාරකරු ලෙස කටයුතු කිරීමට අදාළ බලතල, යුතුකම් හා වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ. පනත මගින් මුදල් මණ්ඩලයට පවරා ඇති බලතල, යුතුකම් හා කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව පහසුකම් සපයනු ලබයි.

## 2. ගිණුම්කරණ පදනම

### 2.1. අනුකූලතාව පිළිබඳ ප්‍රකාශනය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය මගින් පනවා ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සහ 1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ අවශ්‍යතා වලට අනුකූලව පිළියෙල කර ඇත.

1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ 5 (1) (ඌ) සහ (එ) වගන්ති යටතේ, මුදල් මණ්ඩලය විසින් අරමුදලට අදාළ පොදු ගිණුම් පවත්වාගෙන යාම සහ පහත සඳහන් මූල්‍ය ප්‍රකාශන වාර්ෂිකව පිළියෙල කළ යුතු වේ.

අ) ආදායම් හා වියදම් ප්‍රකාශනය,

ආ) වත්කම් හා වගකීම් ප්‍රකාශනය,

ඇ) ලැබීම් හා ගෙවීම් ප්‍රකාශනය හා

ඈ) එක් එක් ආයෝජනයේ මුහුණත වටිනාකම, මිලදී ගත් පිරිවැය හා වෙළෙඳපොළ වටිනාකම දක්වමින් ආයෝජන ප්‍රකාශනය.

### 2.2. මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

1958 අංක 15 දරණ සේ.අ.අ. පනතේ ප්‍රතිපාදන වලට අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ හා ඉදිපරිත් කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතු වේ.

### 2.3. මුදල් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුමැතිය

2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2017 පෙබරවාරි 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය බලය පවරන ලදී.

### 2.4. පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මගින් හඳුනාගත් සාධාරණ අගයට අගය කරන ලද මූල්‍ය වත්කම් හැර මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

### 2.5. කෘත්‍යයාත්මක හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල

අරමුදලේ කෘත්‍යයාත්මක හා ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල වන ශ්‍රී ලංකා රුපියල් වලින් අරමුදලේ මූල්‍ය වාර්තා ඉදිරිපත් කර ඇත.

### 2.6. ප්‍රමාණාත්මකභාවය, හිලව් කිරීම සහ වටැයීම භාවිතය

#### ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

එක සමාන අයිතමවල එක් එක් ප්‍රමාණාත්මක සමූහය මූල්‍ය ප්‍රකාශනවල වෙනම ඉදිරිපත් කර ඇත. ප්‍රමාණාත්මක නොවන අයිතම හැර වෙනස් ස්වරූප අයිතම හෝ කාර්යයන් වෙනම ඉදිරිපත් කර ඇත.

#### හිලව් කිරීම/අනුලම්බ ගැනීම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් අවශ්‍ය වන හෝ අවසර ලබා දෙන විට හැර මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් හා වගකීම් සහ ආදායම් හා වියදම් හිලව් කර නොමැත.

#### වටැයීම

වෙනත් විදියකින් සඳහන් කර නොමැති විට මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වටිනාකම් ආසන්නතම රුපියල් දහස් වලට වටයා ඇත.

### 2.7. විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන භාවිතය

අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන මුදල් මණ්ඩලය විසින් සිදු කර ඇති අතර, වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම්, වියදම් අගයන් සහ අසම්භාව්‍ය වගකීම්, තීන්දු සාධාරණ යැයි පිළිගත හැකි අපේක්ෂාවන් ඇතුළුව අතීත අත්දැකීම් හා අනෙකුත් සාධක මත අසම්භාව්‍ය වගකීම්, විනිශ්චයන් හා ඇස්තමේන්තු පදනම් වේ. මේ නිසා සත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, විනිශ්චයන් හා ඇස්තමේන්තු වලින් වෙනස් විය හැක. ඇස්තමේන්තු හා

බලපවත්වන උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කරන අතර, ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ දී යොදා ගන්නා ලද පහත සඳහන් වැදගත් ගිණුම්කරණ ඇස්තමේන්තු හා උපකල්පන කළමනාකාරීත්වය විසින් සලකා බලන ලදී.

**අඛණ්ඩ පැවැත්ම**

කළමනාකාරීත්වය විසින් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කරන ලද තක්සේරු කිරීමක දී නුදුරු අනාගතයක් සඳහා අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල නියැලීමට අරමුදල සතුව සම්පත් පවතින බවට තහවුරු විය. එම නිසා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩ පැවැත්ම මත පදනම්ව පිළියෙල කරනු ලැබේ.

මීට අමතරව පහත සඳහන් අනාවරණයන් සඳහා විශේෂිත ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු හා උපකල්පන යොදා ගන්නා ලදී.

- මූල්‍ය සාධන පත්‍ර අගය කිරීම
- වත්කම් හානිකරණය
- දේපළ පිරියත හා උපකරණ ක්ෂය කිරීම
- වගකීම් සඳහා වෙන්කිරීම

### 2.8. ශේෂ පත්‍ර දිනට පසු සිදුවීම හා අසම්භාව්‍ය වගකීම්

මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී වාර්තා කරන දිනට පසුව සිදු වූ සියලුම ප්‍රමාණාත්මක සිදුවීම් සලකා ඇත. හඳුනාගත් සියලුම වගකීම් සඳහා වෙන්කිරීම් හා අදාළ අනාවරණයන් සිදු කර ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 3.1. ආදායම් හා වියදම් හඳුනාගැනීම

අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒම භව්‍ය වන විට හා එම ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස මැනීමට හැකි වන විට අයභාරය හඳුනා ගැනේ. ආදායම් හා වියදම් ප්‍රකාශනයේ වියදම් හඳුනාගනු ලබන්නේ නිශ්චිත ආදායම් අයිතමයක ඉපයීම සහ දරන ලද පිරිවැය අතර ඍජු සම්බන්ධතාව මත වේ. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශය විසින් අරමුදල කළමනාකරණය වෙනුවෙන් දරණ ලද සියලුම වියදම් අරමුදලෙහි වියදම ලෙස අය කරනු ලබයි.

### 3.1.1. පොලී ආදායම

ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ සත්‍ය ගැනුම් මිලෙන් හානිකරණ අලාභ අඩු කළ අගය මත වූ සඵල පොලී අනුපාතික ක්‍රමය යොදා ගනිමින් උපචිත පදනම මත පදනම් වූ සියලුම පොලී දරන මූල්‍ය සාධන පත්‍ර සඳහා පොලී ආදායම හඳුනා ගනු ලැබේ. පොලී ආදායම තුළ පොලී අනුපාතික ආදායම් හා උපකරණවල වට්ටම් හා අධිමිල මත ක්‍රමක්ෂය මත වන ඕනෑම ලාභ හෝ අලාභ ඇතුළත්ය.

### 3.1.2. ලාභාංශ

අරමුදලට ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ලාභාංශ ආදායම හඳුනාගෙන ඇත. ලාභාංශ ආදායම ඉදිරිපත් කර ඇත්තේ නැවත අයකරගත නොහැකි රඳවා ගැනීමේ බදු සහිතවය.

### 3.1.3. වෙළෙඳාම සඳහා තබාගෙන ඇති ආයෝජන විකිණීම මත ලාභ

රාජ්‍ය සුරැකුම්පත්, ප්‍රකාශිත කොටස් සහ ලැයිස්තුගත ණයකර විකිණීම තුළින් උපලබ්ධි වූ වෙළෙඳ ලාභ, වෙළෙඳාම සඳහා තබා ගෙන ඇති ආයෝජන විකිණීමෙන් ලද ලාභ තුළ අන්තර්ගත වන අතර, ඒවා ආදායම් හා වියදම් ප්‍රකාශනයේ ඍජු ආදායම් තුළ ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට දක්වන මූල්‍ය වත්කම් විකිණීම තුළින් ලද ආදායම් ලෙස ඉදිරිපත් කර ඇත.

### 3.1.4. විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන ඉවත් කිරීමෙන් ලද ලාභ

විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන ඉවත් කිරීමෙන් ලද ලාභ තුළ අන්තර්ගත වන්නේ විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කරන ලද ස්කන්ධ සුරැකුම්පත් වලින් උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ වන අතර, එය ආදායම් සහ වියදම් පිළිබඳ ප්‍රකාශනයේ ඍජු ආදායම් තුළ විකිණීම සඳහා ඇති මූල්‍ය ආයෝජන විකිණීම ලෙස ඉදිරිපත් කර ඇත.

### 3.1.5. වෙළෙඳාම සඳහා තබාගෙන ඇති මූල්‍ය ආයෝජන සාධාරණ තක්සේරු කිරීමෙන් ලද ලාභ

රාජ්‍ය සුරැකුම්පත්, ප්‍රකාශිත කොටස් හා ලැයිස්තුගත ණයකර සාධාරණ අගයට තක්සේරු කිරීම මත වන උපලබ්ධි නොවූ ලාභ විකිණීම සඳහා තබා ගෙන ඇති මූල්‍ය ආයෝජන සාධාරණ අගයට තක්සේරු කිරීමේ වෙනස්වීම් වල සමන්විත වන අතර, එය ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළ වෙළෙඳාම සඳහා තබාගෙන ඇති මූල්‍ය ආයෝජන සාධාරණට අගයට තක්සේරු කිරීම මත ලාභ හෝ අලාභ ලෙස ඉදිරිපත් කෙරේ.

**3.1.6. සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම් තුළ අන්තර්ගත වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ සේ.අ.අ. අංශයේ සියලුම කාර්ය මණ්ඩල සඳහා වැය වූ වියදම් වේ. අරමුදල විසින් වෙන්වූ විශ්‍රාම අරමුදලක් හෝ වෙනත් පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලසුම් පවත්වාගෙන නොයයි.

**3.1.7. ආදායම් බදු**

ආදායම් බදු ගණනය කරනු ලබන්නේ ආයෝජන ආදායම් මත ගෙවිය යුතු බදු ප්‍රමාණය මතය. අරමුදලේ ආදායම් බදු වගකීම පොලී, ලාභාංශ හා ශුද්ධ අධිභාර ලෙස ලැබෙන දළ ආදායමෙන් 10% ක් වේ. දේශීය ආදායම් බදු පනතට අනුව භාණ්ඩාගාර බිල්පත්, භාණ්ඩාගාර බැඳුම්කර සහ කොටස් ආයෝජනයෙන් ලැබෙන ප්‍රාග්ධන ලාභ බදු වගකීමෙන් නිදහස් කොට ඇත.

සේවක අර්ථසාධක අරමුදල 2006.09.01 දින සිට භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත් ආයෝජන කළඹ, බදු පසු බර තැබූ සාමාන්‍ය පිරිවැයට අගය කරන බැවින් ක්‍රමක්ෂය ලාභ ද බදු පසු ශුද්ධ අගය මත සටහන් වේ.

ඒ අනුව ක්‍රමක්ෂය ලාභ හා බදු වියදම පිළිබඳ සාධාරණ අදහසක් ලබා ගැනීම සඳහා වසර තුළ ඉපැයූ ආදායම මත රඳවා ගැනීමේ බදු වියදම ක්‍රමක්ෂය ලාභ ගිණුමට නැවත එකතු කර ඇත.

**3.2. වත්කම්**

**3.2.1. මූල්‍ය උපකරණ - මූලික හඳුනාගැනීම, වර්ගීකරණය සහ පසුව අගය කිරීම**

**3.2.1.1. මූලික හඳුනාගැනීමේ දිනය**

අරමුදල, මූල්‍ය උපකරණයක් හා සම්බන්ධ ගිවිසුමක එක් පාර්ශවකරුවකු බවට පත් වූ විට පමණක් මූල්‍ය වත්කමක් හඳුනා ගනු ලබයි.

**3.2.1.2. මූල්‍ය උපකරණ මූලිකව හඳුනා ගැනීම**

මූල්‍ය උපකරණ වර්ගීකරණයේ දී ඒවායේ මූලික හඳුනාගැනීම, මූල්‍ය උපකරණවල අරමුණ, ලක්ෂණ හා මිලදී ගැනීමේ දී ඇති කළමනාකාරීත්වයේ අදහස මත තීරණය වේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක - 39 ''මූල්‍ය උපකරණ හඳුනා ගැනීම හා වර්ගීකරණය'' අනුව ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් හා

වගකීම් හැර අනෙකුත් සියලුම මූල්‍ය උපකරණ මූලිකව අගය කිරීම, ඒවායේ සාධාරණ අගය සහ අත්පත් කර ගැනීමේ දී හෝ නිකුත් කිරීමේ දී සෘජුව දරන ලද හුවමාරු පිරිවැය සහිතව මූලිකවම හඳුනා ගැනීම සිදු කරයි. ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වල හුවමාරු පිරිවැය ආදායම් හා වියදම් ප්‍රකාශනය තුළින් හඳුනා ගනු ලබයි.

### 3.2.1.3. පළමු දින ලාභ හෝ අලාභ

ගනුදෙනු පිරිවැය ඒ හා සමාන වෙනත් සාධන පත්‍රයක නිරීක්ෂණය කළ හැකි වර්තමාන වෙළෙඳපොළ ගනුදෙනුවල සාධාරණ අගයෙන් වෙනස් වන විට හෝ නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොළ සාධක පමණක් ඇතුළත් වන තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රම යොදා ගන්නා විට අරමුදල මගින් ගනුදෙනු පිරිවැය හා සාධාරණ අගය අතර වෙනස (පළමු දින ලාභ හෝ අලාභ) උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන මගින් ලාභ/අලාභ ලෙස හඳුනාගනු ලබයි. නිරීක්ෂණය කළ නොහැකි දත්ත භාවිතා කර සාධාරණ අගය තීරණය කරන අවස්ථාවල දී, යෙදවුම් නිරීක්ෂණය කළ හැකි නම් හෝ සාධන පත්‍ර හඳුනා නොගන්නා විට පමණක් ගනුදෙනු මිල හා ආකෘති අගය අතර වෙනස ලාභ හෝ අලාභ තුළ හඳුනා ගනී.

### 3.2.1.4. මූල්‍ය වත්කම් වර්ගීකරණය සහ පසුකාලීනව මිනුම් කිරීම

අරමුදල විසින් මූල්‍ය වත්කම් පහත සඳහන් කාණ්ඩයන්ගෙන් එකකට වර්ගීකරණය කරන ලබයි.

i) ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් හා වගකීම් කාණ්ඩය අනු කොටස් දෙකකි.

විකිණීම සඳහා ළඟ තබාගෙන ඇති මූල්‍ය වත්කම් හා වගකීම් : කෙටිකාලීනව විකිණීමේ හෝ/හා නැවත මිලදී ගැනීමේ අරමුණු සහිතව මූල්‍ය වත්කම් හා වගකීම් අත්පත් කර ගෙන ඇත්නම් ඒවා විකිණීම සඳහා ළඟ තබා ගෙන ඇති මූල්‍ය වත්කම් හා වගකීම් ලෙස වර්ගීකරණය කරනු ලබයි. මෙම වර්ගීකරණයට හිමිකම්, ණයකර සහ අනෙකුත් පොලී දරන ආයෝජන ඇතුළත් වේ. මෙම වත්කම් මූලික වශයෙන් අත්පත් කරගෙන ඇත්තේ කෙටිකාලීන මිල වෙනස්වීම් වලින් සිදුවන ලාභ ඉපයීමේ පරමාර්ථයෙන්ය.

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම් ලෙස නම් කර ඇති මූල්‍ය උපකරණවල මූලික හඳුනාගැනීම : මෙම මූල්‍ය වත්කම් හා වගකීම් අරමුදලේ අවදානම් කළමනාකරණය හා ආයෝජන උපාය මාර්ගය සම්බන්ධ සවිස්තර

ලේඛනයට අනුකූලව මූල්‍ය වත්කම් සමූහය, මූල්‍ය වගකීම් හෝ ඒ දෙකම කළමනාකරණය කර සාධාරණ ඇගැයීමේ පදනමක් මත එහි කාර්යසාධනය ඇගයීමට භාජනය කර ඇත.

ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් පසුව අගය කරනු ලබන්නේ වෙළෙඳපොළ වටිනාකමක් අඟවනු ලබන සාධාරණ අගයටය. වෙළෙඳපොළ අගයන්ගේ වෙනස්වීම් සුරැකුම්පත්වල වටිනාකම ඉහළ හෝ පහළ යාමක් ලෙස හඳුනා ගන්නා අතර, එමගින් වන ශුද්ධ ලාභය සහ අලාභය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනා ගනු ලැබේ.

ii) ණය හා ලැබිය යුතු මුදල්

ණය හා ලැබිය යුතු මුදල් යනු සක්‍රීය වෙළෙඳපොළ මිල ප්‍රකාශ නොවන ස්ථාවර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත අරමුදල මගින් වහාම හෝ කෙටිකාලීනව විකිණීමට අරමුණක් නොමැති ව්‍යුත්පන්න උපකරණ වේ. නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් (ප්‍රති විකුණුම්) ද ණය හා ලැබිය යුතු මුදල් ලෙස වර්ගීකරණය කෙරේ.

ණය හා ලැබිය යුතු මුදල් පසුව අගය කිරීම කරනුයේ සඵල පොලී ක්‍රමය යටතේ ක්‍රමක්ෂය පිරිවැයටය (යම් හානිකරණ අලාභයක් වෙතොත් එය අඩු කිරීමෙන් අනතුරුවය). හානිකරණය හෝ පොත් වලින් ඉවත් කිරීමක් මත වන ලාභ හා අලාභ ආදායම් ප්‍රකාශනයේ ගළපනු ලැබේ.

iii) කල්පිරීම තෙක් තබාගෙන ඇති මූල්‍ය වත්කම්

අරමුදලට කල්පිරෙන තුරු තබා ගැනීමට ධනාත්මක අපේක්ෂාවක් සහ හැකියාවක් ඇති ස්ථිර හෝ නිශ්චය කළ හැකි ගෙවීම් සහ ස්ථිර කල්පිරීමක් ඇති, ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් ලෙස හඳුනාගත නොහැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල්පිරීම තෙක් තබාගෙන ඇති මූල්‍ය වත්කම් වේ.

කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන පසුව අගය කරනු ලබන්නේ සඵල පොලී අනුපාතිකය භාවිතයෙන් (යම් හානිකරණ අඩු කළ පසු) ක්‍රමක්ෂය කරන ලද පිරිවැය මත වේ. මෙම ආයෝජන අත්පත් කර ගැනීමේ දී වන අධිමිල සහ වට්ටම්, සඵල පොලී අනුපාතය ගණනයේ දී යොදා ගනු ලැබේ. කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන හානිකරණය හෝ පොත් වලින් ඉවත් කිරීමක් මත වන ලාභ හා අලාභ, ආදායම් ප්‍රකාශනයේ දී ගළපනු ලැබේ.

කල්පිරීමට පෙර සැලකිය යුතු නොවන ප්‍රමාණයකට වඩා වැඩි කල්පිරෙන තෙක් තබාගෙන ඇති ආයෝජන ප්‍රමාණයක් විකුණා හෝ නැවත වර්ගීකරණය කර ඇත්නම්, සියලුම කල්පිරීම තෙක් තබාගෙන ඇති ආයෝජන, විකිණීම සඳහා ඇති ආයෝජන ලෙස නැවත වර්ගීකරණය කළ යුතු අතර, අරමුදල මගින් ආයෝජන

සුරැකුම්පත් කල්පිරීම තෙක් තබා ගෙන ඇති ලෙස වර්ගීකරණය කිරීම ප්‍රවර්තන හා ඉදිරි වර්ෂ දෙකක් සඳහා වළක්වනු ලබයි.

iv) විකිණීමට ඇති මූල්‍ය වත්කම්

වෙනත් වර්ගීකරණයන් යටතේ හඳුනාගත නොහැකි ව්‍යුත්පන්න නොවන ආයෝජන විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස හඳුනා ගැනේ. විකිණීමට ඇති මූල්‍ය වත්කම් තුළ රාජ්‍ය සුරැකුම්පත්, ස්කන්ධ සුරැකුම්පත් සහ ණය සුරැකුම්පත්, අන්තර්ගත වේ. විකිණීම සඳහා ඇති වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සාධාරණ අගය මත තවදුරටත් අගය කරනු ලැබේ. මෙම වත්කම්හි සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගන්නා අතර, එම වත්කම් විකුණන තෙක් හෝ හානිකරණය වන තෙක් ප්‍රත්‍යාගණන සංචිත වශයෙන් සාමාජිකයන්ගේ හිමිකමට සමුච්චිත කරනු ලැබේ. සාධාරණ අගය විශ්වාසනීය ලෙස ගණනය කළ නොහැකි ලැයිස්තුගත නොවන හිමිකම් සුරැකුම් පිරිවැය මත රැගෙන යනු ලැබේ. ආයෝජන ආදායම සඵල පොලී ක්‍රමය තුළින් ලාභය හෝ අලාභයට හඳුනා ගැනේ. ලාභාංශ ආදායම එය ලැබීමට හිමිකම් ලැබූ විට ලාභය හෝ අලාභයට හඳුනා ගැනේ. හානිකරණ අලාභ, ව්‍යාපාරයේ ලාභය හෝ අලාභයට හඳුනාගැනේ. මෙම ආයෝජනය විකුණූ විට හිමිකම් තුළට සමුච්චනය වන ලාභය හෝ අලාභය, ව්‍යාපාරයේ ලාභය හෝ අලාභය තුළට හඳුනා ගනී.

**3.2.1.5. මූල්‍ය වත්කම් හානිකරණය**

සෑම ශේෂ පත්‍ර දිනයකදීම මූල්‍ය වත්කමක් හානිකරණය වූවා ද යන්න පිළිබඳ කිසියම් ප්‍රමාණාත්මක සාක්ෂි තිබේ දැයි තක්සේරු කළ යුතුය. හානිකරණ අලාභ හඳුනා ගනු ලබන්නේ මූල්‍ය වත්කම්වල මූලික හඳුනා ගැනීමෙන් පසු සිදු වූ (පාඩු ගෙනදෙන) එක් සිද්ධියක් හෝ සිද්ධීන් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස හානිකරණය සිදු වූ බවට සාක්ෂි තිබේ නම් හා එම සිද්ධිය හෝ සිද්ධීන් තුළින් මූල්‍ය වත්කමක ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහවලට බලපෑමක් වේ නම් පමණි.

නිකුත් කරන්නාගේ සැලකිය යුතු තරමේ මූල්‍ය දුෂ්කරතා, පැහැර හැරීම් වැනි ගිවිසුම් කඩකිරීමත්, බුන්වත් වීම් සහ අනෙකුත් මූල්‍ය ආපදා වැනි නිශ්චිත තොරතුරු මෙන්ම සුරැකුම්පතෙහි පිරිවැය ආවරණය කරගත නොහැකි වන අන්දමේ වෙළෙඳපොළ තත්ත්වයෙහි සැලකිය යුතු වෙනස්වීම් පිළිබඳව තොරතුරු ද සුරැකුම්පත් හානිකරණය වූ බවට විෂය මූලික සාක්ෂි වේ. වත්කමක සාධාරණ අගය සැලකිය යුතු ලෙස හෝ දිගින් දිගට එහි පිරිවැයට වඩා පහත වැටීමක් ද හානිකරණය සඳහා වූ විෂය මූලික සාක්ෂියක් වේ. සැලකිය යුතු වෙනස්කම් යන්න ඇගයීමේ දී මූලික හඳුනා ගැනීමේ දී වත්කමෙහි මුල් පිරිවැය, එහි සාධාරණ අගයෙහි පහළ යාම සමඟ සසඳා බැලේ. දිගින් දිගටම පහළ යාම ඇගයීමේ දී වත්කමේ මූලික හඳුනා ගැනීමේ දී එහි මුල් පිරිවැයට වඩා සාධාරණ අගය පහළ ගිය කාලය සැලකිල්ලට ගනු ලැබේ.

### 3.2.1.6. හඳුනාගත් මූල්‍ය වත්කම් ඉවත් කිරීම

වත්කම් වලින් ජනිත වන මුදල් ප්‍රවාහයන් සඳහා වූ ගිවිසුම්ගත අයිතිය කල් ඉකුත් වීමෙන් හෝ අරමුදල විසින් මූල්‍ය වත්කම්වල මුදල් ප්‍රවාහ ලබා ගැනීමට ඇති ගිවිසුම්ගත අයිතිය පැවරීම මගින් හෝ එමෙන්ම,

- ප්‍රමාණාත්මක ලෙස අයිතියට අදාළ සියලුම අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම හෝ
- අරමුදල ප්‍රමාණාත්මක ලෙස සියලුම අවදානම් සහ ප්‍රතිලාභ රඳවා නොගැනීම හෝ පැවරීම ද නොකළ ද පාලනය රඳවා නොගත් විට ද වත්කම් ඉවත් කිරීම සිදු වේ.

මූල්‍ය වගකීමක් හඳුනා නොගැනීම සිදු කරනු ලබන්නේ ගිවිසුමේ නිශ්චය කර ඇති බැඳීම ක්‍රියාත්මක කිරීමෙන්, අවලංගු කිරීමෙන් හෝ කල් ඉකුත්වීමෙන් පසුවය.

### 3.2.1.7. මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් වන අතර, ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වන්නේ හඳුනාගත් අගයන් හිලව් කිරීම සඳහා ශුද්ධ අගය මත නිරවුල් කිරීමේ අදහසක් හෝ වත්කම් උපලබ්ධි කිරීම හා වගකීම් නිරවුල් කිරීම සමාන්තරව සිදු කිරීම බලාත්මක කරන නීතිමය අයිතියක් ඇති නම් පමණි.

## 3.2.2. දේපළ, පිරියත හා උපකරණ

**හඳුනාගැනීම**

වත්කම් හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදලට ගලා ඒමේ සම්භාවිතාවයක් පවතින විට හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විට දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම සිදු වේ.

**මැනීම**

ආරම්භයේ දී සියලුම දේපළ පිරියත හා උපකරණ එහි පිරිවැයට අගය කරනු ලැබේ. වත්කම් අත්පත් කර ගැනීමට සෘජුව දායක වන වියදම් හා පසුව දරන පිරිවැය (''අපරාපරීය පිරිවැය'' යටතේ පැහැදිලි කර ඇති ආකාරයට), පිරිවැයට ඇතුළත් වේ. උපකරණයක ක්‍රියාකාරීත්වයට අවශ්‍යව මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

**පිරිවැය ආකෘතිය**

පිරිවැයට, ශුද්ධ සමුච්චිත ක්ෂය වීම් හා සමුච්චිත හානිකරණ අලාභ වලට දේපළ, පිරියත හා උපකරණ දක්වා ඇත. වත්කමක ධාරණ අගය, ඇස්තමේන්තුගත අයකර ගත හැකි

වටිනාකමට වඩා වැඩි වන විට ධාරණ අගය අයකර ගත හැකි අගය දක්වා කපා හරිනු ලබයි (කරුණාකර 3.2.6 දරණ මූල්‍ය නොවන වත්කම් හානිකරණය සටහන බලන්න).

**පසුකාලීන පිරිවැය**

දේපළ, පිරියත හා උපකරණවල සැලකිය යුතු කොටසක් නිරන්තරයෙන් ප්‍රතිස්ථාපනය කළ යුතු විටදී, අරමුදල විසින් ප්‍රතිස්ථාපනය කළ කොටස් පොත් වලින් ඉවත් කරන අතර, නව කොටස එයට සම්බන්ධ ආයු කාලය අනුව හඳුනා ගෙන ඒ අනුව ක්ෂය කරනු ලැබේ. ඉදිරියට යන අළුත්වැඩියා හා නඩත්තු වියදම් ඒවා දරණ ආකාරය අනුව ලාභය හෝ අලාභයට අය කරනු ලැබේ.

**ඉවත් කිරීම**

දේපළ, පිරියත හා උපකරණ අයිතිමයක් විකිණීම, ප්‍රතිස්ථාපනය කිරීම හෝ එය භාවිතයෙන් අපේක්ෂිත අනාගත ප්‍රතිලාභ නොමැති නම් ඉවත් කරනු ලැබේ. වත්කමක් ඉවත් කිරීම මත හඳුනාගත් කුමන හෝ ලාභයක් හෝ අලාභයක් එම වත්කම ඉවත් කළ කාලපරිච්ඡේදයේ ලාභ හෝ අලාභ තුළ ඇතුළත් වේ.

**ක්ෂය**

වත්කමෙහි ඇස්තමේන්තුගත සඵල ජීවකාලය පුරා සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම සිදු කරයි. වත්කමක් ක්ෂය කිරීම ආරම්භ කරන්නේ එම වත්කම ප්‍රයෝජනය සඳහා භාවිතා කළ හැකි විට දී හෝ තමන් විසින්ම ඉදිකළ වත්කමක් සම්බන්ධයෙන් වන විට එම වත්කම් සම්පූර්ණ කළ විට හා භාවිතය සඳහා සූදානම් අවස්ථාවේ සිටය. වත්කමක් ක්ෂය කිරීම නතර කරන්නේ එම වත්කම විකිණීම සඳහා ඇති ලෙස වර්ගීකරණය කළ දිනය හෝ වත්කම හඳුනා නොගත් දිනය යන දෙකෙන් මුල් එක වේ.

වත්කම් සඳහා ඇස්තමේන්තුගත ක්ෂය අනුපාතයන් පහත පරිදි වේ.

| **වත්කම් වර්ගය** | **ක්ෂය අනුපාතය** |
|---|---|
| ගොඩනැගිලි | 02% |
| පිරියත හා යන්ත්‍රෝපකරණ | 25% |
| කාර්යාල උපකරණ | 25% |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | 10% |
| මෝටර් රථ | 20% |
| පරිගණක උපාංග | 50% |
| වෙනත් | 20% |

අවශේෂ වටිනාකම්, ඵලදායී ජීවකාල සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදය එක් එක් මූල්‍ය වර්ෂයේ දී සමාලෝචනය කරන අතර, අවශ්‍ය විටදී ගැළපීම් සිදු කරනු ලැබේ.

**ඉදිකෙරෙමින් පවතින වත්කම්**

ඉදිකෙරෙමින් පවතින වත්කම් ණය ගැනුම් පිරිවැය ඇතුළත්ව, සමුච්චිත හානිකරණ අලාභ අඩු කළ පිරිවැයට දක්වනු ලැබේ. වත්කම් ඉදිකිරීම අවසන් වූ පසු හා භාවිතයට ගැනීමට හැකි තත්ත්වයට පත් වූ විට දේපළ, පිරියත හා උපකරණවල අදාළ වත්කම් වර්ගයට මාරු කරනු ලැබේ. උදා: කළමනාකරණය විසින් අදහස් කළ ආකාරයට මෙහෙයුම් කටයුතු කළ හැකි වන පරිදි වත්කමේ පිහිටීම සහ තත්ත්වය පැවතීම.

**3.2.3. අස්පෘශ්‍ය වත්කම්**

පරිගණක දෘඩාංගයන්හි අවශ්‍යම කොටසක් නොවන පරිගණක මෘදුකාංග අස්පෘෂ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලබන අතර, ඒවා පිරිවැයට හඳුනාගනු ලබයි. මූලික හඳුනාගැනීමෙන් පසුව ඒවා පිරිවැයෙන් වසර 02 ක ඵලදායී ජීව කාලය මත පදනම් වූ සමුච්චිත ක්‍රමක්ෂය අඩු කළ අගයට ඉදිරියට ගෙන යනු ලබයි.

**3.2.4. තොගය**

තොග පවත්වාගෙන යනු ලබන්නේ බර තැබූ සාමාන්‍ය පිරිවැයට වේ. මන්දගාමීව සංචලනය වන තොග සඳහා දීමනා වෙන් කරනු ලබයි.

**3.2.5. ලැබිය යුතු මුදල්**

හානිකරණ සඳහා වෙන් කිරීම් සිදු කිරීමෙන් පසු අපේක්ෂිත උපලබ්ධි කරගත හැකි අගයට ලැබිය යුතු දෑ දක්වා ඇත. සියලුම ලැබිය යුතු දෑ ඒවායේ අරමුණුගත සාක්ෂි සලකා බැලීමෙන් විශේෂිත වූ හානිකරණයන් සඳහා තක්සේරු කර ඇත.

**3.2.6. මූල්‍ය වත්කම් හානිකරණය**

| | 11.40 | - | - | - | - | - | - | - | 1,745 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,745 |
| | 11.50 | - | - | - | - | - | - | - | - | - | - | 2,450 | - | - | - | - | - | 1,850 | - | - | - | - | - | 4,300 |
| | 13.00 | - | - | - | - | - | - | - | - | - | - | - | 350 | - | - | - | - | - | - | - | - | - | - | 350 |
| | | | | | | | | | | | | | | | | | | | | | | | - | |
| | | | | | | | | | | | | | | | | | | | | | | | - | |
| | | - | 500 | - | 500 | - | 1,000 | - | 1,745 | - | 3,000 | 3,250 | 350 | 350 | - | - | - | 1,850 | - | - | - | - | - | 12,545 |
| උප එකතුව | | 57,993 | 111,429 | 84,184 | 95,121 | 40,890 | 89,513 | 113,390 | 34,984 | 96,674 | 166,765 | 21,200 | 86,403 | 53,550 | 96,042 | 139,085 | 75,158 | 52,823 | 26,700 | 30,676 | 78,263 | 4,770 | - | 1,555,614 |
| සාංගමික ණයකර | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| කල්පිරීම තෙක් තබා ගෙන ඇති ආයෝජන | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| ලංකා බැංකුව | | - | 576 | - | - | 1,142 | - | 134 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,852 |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | | 100 | 144 | - | 200 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 444 |
| කොමර්ෂල් බැංකුව | | - | - | - | - | 2,000 | - | - | - | - | 1,685 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 3,685 |
| ඩී.එෆ්.සී.සී. බැංකුව | | - | - | - | - | - | - | 1,000 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,000 |
| ඩී.එෆ්.සී.සී. වර්ධන බැංකු ණයකර | | - | - | - | 500 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 500 |
| හේලීස් පී.එල්.සී. | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| එච්.ඩී.එෆ්.සී. බැංකු ණයකර | | 66 | - | - | 110 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 176 |
| හේමාස් හෝල්ඩින්ග්ස් පී.එල්.සී. | | - | - | 82 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 82 |
| හැටන් නැෂනල් බැංකු ණයකර | | - | 317 | 1,500 | - | 2,445 | - | 1,000 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 5,261 |
| ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පී.එල්.සී. | | - | - | - | 2,000 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2,000 |
| ලංකා ඔරික්ස් ලීසිං සමාගම පී.එල්.සී. | | - | - | 100 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 100 |
| ලයන් බෲවරි | | 40 | 53 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 93 |
| එම්.බී.එස්.එල්. | | - | 282 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 282 |
| ජාතික සංවර්ධන බැංකුව පී.එල්.සී. | | - | 261 | - | 2,000 | - | - | 375 | - | 500 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 3,136 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | - | - | - | - | 1,500 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,500 |
| නවලෝක හොස්පිට්ල්ස් | | - | 115 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 115 |
| නේෂන්ස් ට්‍රස්ට් බැංකු ණයකර | | - | 549 | - | - | 1,200 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,749 |
| පැන්ඒෂියා බැංකින් කෝපරේෂන් ඩී.සී. | | 250 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 250 |
| පීපල්ස් ලීසිං සහ ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | | 160 | 139 | - | - | 1,000 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 1,298 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | | - | - | - | 500 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 500 |

# සේවක අර්ථසාධක අරමුදල
# මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්

(සම්බන්ධයි...)

## 32. ආයෝජන කළඹෙහි කල්පිරීම පිළිබඳ වර්ගීකරණය

2016 දෙසැම්බර් 31 දිනට

(රු.මිලියන)

| ආයෝජන කාණ්ඩය | අනුපාතය | 2017 | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 | 2025 | 2026 | 2028 | 2029 | 2030 | 2032 | 2033 | 2034 | 2035 | 2041 | 2043 | 2044 | 2045 | නිශ්චිත නොවූ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| රිචඩ් පීරිස් සහ සමාගම | | 36 | 81 | 100 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 217 |
| සම්පත් බැංකු ණයකර | | 14 | 422 | 1,800 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2,236 |
| සෙලාන් බැංකුව | | - | 100 | - | 1,800 | 1,000 | - | 1,000 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 3,900 |
| සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී.එල්.සී. | | 123 | 94 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 217 |
| සියපත ෆයිනෑන්ස් | | - | - | 500 | - | 200 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 700 |
| එස්.එම්.අයි.බී. බැංකු ණයකර | | - | - | - | 110 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 110 |
| | | 788 | 3,133 | 4,082 | 7,220 | 10,487 | - | 3,509 | - | 500 | 1,685 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 31,404 |
| විකිණීමට ඇති ආයෝජන | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| සෙන්ට්‍රල් ෆිනෑන්ස් සමාගම පී.එල්.සී. | | 18 | 39 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 58 |
| හේලිස් පී.එල්.සී. | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| හැටන් නැෂනල් බැංකු ණයකර | | - | - | 500 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 500 |
| එල්.බී. ෆිනෑන්ස් පී.එල්.සී. | | - | 221 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 221 |
| නේෂන් ට්‍රස්ට් බැංකුව පී.එල්.සී. | | - | 549 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 549 |
| පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී. | | - | - | 459 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 459 |
| රිචඩ් පීරිස් සහ සමාගම | | 36 | 81 | 100 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 217 |
| සම්පත් බැංකු ණයකර | | - | 422 | 200 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 622 |
| සෙලාන් බැංකු ණයකර | | - | - | - | 200 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 200 |
| සිංගර් ශ්‍රී ලංකා | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| | | 54 | 1,312 | 1,259 | 200 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2,825 |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | | | | | | | | | | | | | | | | | | | | | | | | |
| නවලෝක හොස්පිට්ල්ස් පී.එල්.සී. | | - | 115 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 115 |
| | | - | 115 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 115 |
| උප එකතුව | | 842 | 4,559 | 5,341 | 7,420 | 10,487 | - | 3,509 | - | 500 | 1,685 | - | - | - | - | - | - | - | - | - | - | - | - | 34,343 |
| භාණ්ඩාගාර බිල්පත් | | 41,057 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 41,057 |
| භාරකාර සහතිකපත් | | 1,397 | 1,896 | 807 | 424 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 4,524 |
| | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| ලැයිස්තුගත කොටස් | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | |
| ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2,615 | 2,615 |
| විකිණීමට ඇති ආයෝජන | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 67,965 | 67,965 |
| උප එකතුව | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 70,580 | 116,161 |
| ලැයිස්තුගත නොවූ කොටස් | | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 10,271 | 10,271 |
| ප්‍රති විකුණුම් | | 2,745 | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | - | 2,745 |
| | | | | | | | | | | | | | | | | | | | | | | | | - |
| මුළු එකතුව | | 104,034 | 117,884 | 90,333 | 102,965 | 51,377 | 89,513 | 116,899 | 34,984 | 97,174 | 168,450 | 21,200 | 86,403 | 53,550 | 96,042 | 139,085 | 75,158 | 52,823 | 26,700 | 30,676 | 78,263 | 4,770 | 80,851 | 1,719,134 |

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல. / My No. } එල්/ඩබ්/බී/ඊපීඑෆ්/එෆ්ඒ/2016 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2018 ජනවාරි 28 දින


ගරු අමාත්‍යතුමා,

කම්කරු, වෘත්තීය සමිති සබඳතා හා සබරගමුව සංවර්ධන අමාත්‍යාංශය.

**සේවක අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

සේවක අර්ථසාධක අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6 (3) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බව මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 වගන්තිය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ එකතුව රු. 229,358,373 ක් වූ ස්ථාවර වත්කම් පැවතියද ඒවායේ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 පරිදි ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

අරමුදලේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව අස්පෘශ්‍ය වත්කම් වසර 2 ක් තුළදී ක්‍රමක්ෂය කළ යුතු වුවත්, ඊට පටහැනිව එම වත්කම් වසර 4 ක් පුරා ක්‍රමක්ෂය කර තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරනු ලබන ජංගම නොවන වත්කම් ඒවායේ ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන ක්‍රමානුකූල පදනමකට ක්ෂය කිරීම

වෙනුවට දෙපාර්තමේන්තුවේ වැය විෂය අංක 221-2-4-2003 යටතේ 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වාහන අළුත්වැඩියා කිරීම් වෙනුවෙන් දරන ලද මුළු අයහාර වියදමෙන් සියයට 20 බැගින් ක්ෂය ගණනය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාහන සඳහා ක්ෂය ප්‍රමාණය රු.1,620,832 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) බැංකු ගිණුම් 04 කට අදාලව 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළ යාවත්කාලීන නොකල මුදල් තැන්පතු රු.16,021,950 ක් හා ලැබීම් වවුචර් ඌනතාවය රු.12,555,622 ක් ඇතුළුව එකතුව රු. 517,935,339 ක් වූ ගනුදෙනු නිවැරදි කිරීමට හෝ නිරාකරණය කිරීම සඳහා අදාල පියවර නොගෙන දිගින් දිගටම බැංකු සැසඳුම් ප්‍රකාශයන්හි දක්වා තිබුණි.

(ඇ) 2016 වර්ෂයට අදාල ගිණුම්ගත බැඳීම් වෙනුවෙන් 2017 වර්ෂයේදී රු. 5,190,718 ක් ගෙවීම්කර තිබුණද 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල රු. 2,341,937 ක් පමණක් වෙන් කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම හා උපචිත වියදම් රු. 2,848,781 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව එකතුව රු.728,984,200 ක්වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ සහ පරිගණක හා මෘදුකාංගවලට අදාළ ඉදිරිපත් කරන ලද ශේෂය උපලේඛනයේ ශේෂය සමඟ සැසඳීමේදී රු. 287,276,341 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| | ගිණුම් විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | (රු) | |
| (අ) | බැංකු ගිණුම් 2 ක ශේෂය | 6,810,422 | i. බැංකු සැසඳුම් ප්‍රකාශ<br>ii.බැංකු සහතික |
| (ආ) | ලැබිය යුතු ශේෂ මෙහෙවර පියස | 427,147,000 | ශේෂ තහවුරු කිරීම් |
| (ඇ) | කම්කරු කොමසාරිස් ජනරාල් - අග්‍රිමය | 480,290,000 | |
| (ඈ) | වාහන | 100,395,770 | විස්තරාත්මක උපලේඛන |
| (ඉ) | සමුච්චිත ක්ෂය - වාහන | 58,490,743 | |

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 395 (ආ) හා (ඇ) | අරමුදලට අයත් බැංකු ගිණුමකට අදාළව 2016 දෙසැම්බර් 31 දිනට මුදල් පොත අනුව හා බැංකු ශේෂ තහවුරුව අතර රු. 1,423,861,794 ක වෙනසක් පැවතුණි. එම ශේෂයන් සැසඳීම් කර 2016 ජනවාරි සිට දෙසැම්බර් දක්වාම බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.7 වගන්තිය හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සේවක අර්ථසාධක අරමුදලට අනුයුක්ත කර සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සේවා නියුක්ති ආදායම මත වූ උපයන විට බදු ගෙවීම් අදාල නිලධාරීන්ගෙන් අය නොකර සමාලෝචිත වර්ෂයේ දී රු. 17,571,467 ක් අරමුදල විසින් ගෙවා තිබුණි. උපයනවිට ගෙවීම් බදු අරමුදලින් ගෙවීම පිළිබඳව 2016 පෙබරවාරි 26 දිනැති රාජ්‍ය ගිණුම් කාරක සභාවේදී සාකච්ඡා කර තිබුණු අතර ඒ අනුව 2016 අයවැය ලේඛනයේ උපදෙස් හා රාජ්‍ය මුදල් චක්‍රලේඛවලට අනුකූල වන අන්දමින් ක්‍රමවේදයන් නිවැරදිව හා යාවත්කාලීන කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා සමඟ සාකච්ඡා කොට වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස දැන්වුවද 2017 ජුනි අවසන් වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදලේ පවතින රු. 176,748,000 ක් වූ පිරියත හා උපකරණවලට අදාල 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර එහි වාර්තා විගණනයට ඉදිරිපත්කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.175,926,965,000 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.156,937,279,000 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභයෙහි රු. 18,989,686,000 ක් වූ වැඩිවීම කෙරෙහි පොළී ආදායම් රු. 22,430,346,000 කින් වැඩිවී තිබීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012 වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලය රු.111,828,720,000 ක ශුද්ධ ලාභයක් වූ අතර එය අඛණ්ඩව වර්ධනය වී 2016 වර්ෂයේදී රු.175,926,965,000 ක් වී තිබුණි. සේවක පාරිශ්‍රමික, ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් හා ආදායම් බදු සැලකිල්ලට ගැනීමෙන් පසු 2012 වර්ෂයේදී රු.121,084,004,000 ක්ව තිබූ දායකත්වය 2016 දී රු.192,481,767,000 ක් දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවා නියුක්තයින් වෙත විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ අරමුණු පෙරදැරි කොට 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ මෙම අරමුදල පිහිටුවා තිබුණි.

ඉහත සඳහන් අරමුණ ඉටු කර ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2016 වර්ෂය අවසාන වනවිට පෞද්ගලික අංශයේ හා අර්ධ රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තිය ලෙස වාර්තා වී ඇති නිලධාරීන් 3,682,695 කින් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය ඇති සක්‍රීය සමාජික සංඛ්‍යාව 2,400,000 ක් හෙවත් සියයට 65 ක් විය. අනෙකුත් අනුමත අර්ථසාධක අරමුදල්වල සාමාජිකත්වය දරන සේවක සංඛ්‍යාව සියයට 11 ක් පමණක් වීමෙන් ඉතිරි සියයට 24 ක් වූ ප්‍රමාණය කිසිදු අරමුදලක දායකත්වයක් ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2016 වර්ෂය අවසාන වන විට සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයේ සක්‍රීය සාමාජික සංඛ්‍යාව සහ දායක මුදල් ගෙවන සේවා යෝජක සංඛ්‍යාව පිළිවෙළින් 2,500,000 ක් හා 77,842 ක් ලෙස වාර්තා වී තිබුණද සේවක අර්ථසාධක අරමුදලේ එම සංඛ්‍යාවන් පිළිවෙළින් 2,400,000 ක් හා 73,973 ක් වී තිබුණි. එය සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලයට වඩා අඩු අගයක් ගෙන තිබුණි. ඒ අනුව, සාමාජිකයින් 100,000 ක් හා සේවා යෝජකයින් 3,869 ක් ලියාපදිංචි කර ගැනීමට සේවක අර්ථසාධක අරමුදල අපොහොසත් වී තිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 වන විට අරමුදලේ මුළු වටිනාකම රු.බිලියන 1,841.5 ක්වූ අතර එය 2015 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව සියයට 11 ක වර්ධනයකි. කෙසේ වුවද, සාමාජික අරමුදල සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සේවක අර්ථසාධක අරමුදල් දායකය නොගෙවීම නිසා සේවායෝජකයින්ට එරෙහිව නඩු පවරා ගෙවීමට නියෝග ලබාගත් රු.මිලියන 10,979 ක් වූ මුදල 2016 දෙසැම්බර් 31 වන විටත් සාමාජික ගිණුම්වලට බැරවී නොතිබුණි. මෙම ශේෂය 2014 හා 2015 වර්ෂ අවසාන වනවිට පිළිවෙලින් රු.මිලියන 6,898 ක් හා රු.මිලියන 8,142 ක් වශයෙන් පැවතුණි. 2016 වර්ෂය තුළදී මෙම ගිණුමට රු.මිලියන 8,322.5 ක් ලැබී තිබුණද, ඉන් නිරවුල් කර තිබුණේ රු.මිලියන 5,485.5 ක් වූයෙන් ඉතිරි නිරවුල් නොවූ මුදල් මේ ආකාරයෙන් වාර්ෂිකව මෙම ගිණුමට එක්තු වී තිබුණි. මෙම සමුච්චිත ශේෂයට අදාල වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අරමුදල අපොහොසත් වුණි. 2013 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ අංක 7 (ii) ප්‍රකාරව මෙම මුදල් නිරවුල් කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට හැකි නව පරිගණක මෘදුකාංගයක් හඳුන්වාදීමේ කටයුත්තක නිරතව සිටින බව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් කමිටුවට දැන්වුවද, නිරවුල් නොවූ ශේෂය වාර්ෂිකව වර්ධනය වන තත්ත්වයක් දක්නට තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව 2015 සැප්තැම්බර් 01 සිට ආරම්භ කර ඇති නව සමානුපාතික ක්‍රමවේදය යටතේ පමණක් රු.මිලියන 278 ක මුදලක් "සී" වාර්තා 3,497 ක් මගින් සාමාජික ගිණුම් වලට බැර කර තිබුණු බව දන්වා තිබුණි.

(ii) අරමුදලට අදාලව ලැබෙන දායක මුදල් නිරවුල් කරනතුරු කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුමක රඳවා තබනු ලැබේ. ඒ අනුව 2016 වර්ෂය තුළ ලද රු. 240,214,000 ක මුදලක් ඊට එකතු වී ඇති අතර නිරවුල් කරන ලද මුදල රු. 107,753,000 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට තවදුරටත් නිරවුල් කිරීමට තිබූ ශේෂය රු. 356,422,000 ක් විය. එසේම 2016 වර්ෂය අවසානයට සාමාජික ගිණුම්වලට බැරවී නැති අඩුවැඩි දායක මුදල් ගිණුමේ සටහන් වී තිබූ දායක මුදල් ශේෂය රු. 1,538,465,000 ක් විය. ඒ සඳහා වයස් විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම ශේෂ පිළිබඳව 2013 වර්ෂයේ සිට දිගින් දිගටම

රාජ්‍ය ගිණුම් කාරක සභාවලදීද සාකච්ඡාකර අප්‍රමාදව නිරවුල් කරන ලෙස නියෝග කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව සේවායෝජකයන් විසින් අඩු පාඩු නිවැරදි කර එවන තුරු සාමාජික ගිණුම් වලට එම මුදල් බැර කිරීම්, පවතින වීධිවිධාන යටතේ කළ නොහැකි බවත්, 2016 වර්ෂයේදී අඩු වැඩි දායක මුදල් ගිණුමෙන් සාමාජික ගිණුම් වලට බැර කළ දායක මුදල රු. 679,000,000 ක් බවත් දන්වා තිබුණි.

(iii) අරමුදලේ සාමාජිකයින් විසින් අරමුදලින් ප්‍රතිලාභ ඉල්ලුම්කිරීමේදී අදාල ප්‍රතිලාභ ප්‍රමාණය ගණනය කර ඇතත්, එම ප්‍රතිලාභ කම්කරු කොමසාරිස්ගේ උපදෙස් පරිදි සාමාජිකයින්ට නොගෙවා රඳවාගත් ප්‍රතිලාභ හා හිමිකම් නොපෑ ප්‍රතිලාභ වශයෙන් 2016 දෙසැම්බර් 31 දිනට රු. 596,552,000ක් සාමාජික අරමුදල තුළ පැවතුණි. මෙම ශේෂයන්ගේ වයස් විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට අරමුදල අපොහොසත් විය. වාර්ෂිකව මෙම ගිණුම්වලින් නිරවුල් වන ශේෂයන්ට වඩා වැඩි ශේෂයක් එකතුවන බැවින් මේවා අප්‍රමාදව නිරවුල් කිරීමේ ක්‍රමවේදයක් සකස් කිරීම කෙරෙහි අරමුදලේ අවධානය යොමුවීම අත්‍යාවශ්‍ය කරුණක් බව නිරීක්ෂණය විය.

(ඇ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 14 වගන්තිය ප්‍රකාරව මුදල් මණ්ඩලය විසින් අරමුදලේ මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායමෙන් වර්ෂයකට සියයට දෙක හමාරකට නොඅඩු ගණනක පොලියක් අදාල වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් එක් සාමාජිකයින්ගේ පුද්ගලික ගණනෙහි තිබෙන ගණනට බැරකළ යුතුය. 2016 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල එලෙස ගෙවන ලද පොළී ප්‍රතිශතයන් 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා සියයට 13.75 සිට සියයට 10.5 ක් දක්වා ක්‍රමිකව පහත වැටී තිබුණද, ඉකුත් වර්ෂ දෙකකදී හා සමාලෝචිත වර්ෂයේදී එය සියයට 10.5 ක් බැගින් සමාන පොළී ප්‍රතිශතයක රඳවාගෙන තිබුණි. කෙසේ නමුත් සාමාජිකයන්ට සියයට 10.5 ක පොළී ප්‍රතිශතයක් ගෙවීම සඳහා වුවද ප්‍රමාණවත් ලාභයක් අරමුදල උපයා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ලාභ සමකිරීමේ සංචිතයෙන් රු. 250,000,000 ක් ලබාගෙන තිබුණි.

(ඉ) සමස්ථයක් ලෙස 2016 වර්ෂය තුළදී ආයෝජන කළඹ තුළ ප්‍රධාන මූලාශ්‍රය වන රජයේ සුරැකුම්පත්වල ආයෝජනයන් මෙම වාර්තාවේ 4.2.1 (අ) ඡේදයේ පෙන්වා දී ඇති පරිදි

පහළ බැසීම හේතුවෙන් ඉදිරි වර්ෂවලදී දිගුකාලීන වශයෙන් අරමුදලේ ආයෝජන ආදායම් අඩුවීමේ ප්‍රවණතාවයක් පැවතුණි. එබැවින් 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව අරමුදලේ සාමාජිකයන්ට ගෙවිය යුතුවන පොළී ප්‍රතිලාභ පෙර වර්ෂවල ගෙවන ලද සියයට 10.5 ක් ඉක්මවූ පොළී ප්‍රතිශතයක් අනාගතයේදී ගෙවීමේ හැකියාව පවත්වා ගැනීම පිළිබඳ අවදානමක් නොපවතීය යන්න බැහැර කළ නොහැකිවිණි.

(ඊ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 23 වන වගන්තිය අනුව අරමුදලෙහි සාමාජිකයෙකුගේ පෞද්ගලික ගණනෙහි අය පක්ෂයට ඇති මුළු ගණන හැකිතාක් ඉක්මණින් සාමාජිකයාට ගෙවිය යුතු වුවද, 2017 ජුනි 30 දිනට ප්‍රතිලාභ ඉල්ලුම්කර අවුරුදු 01 සිට අවුරුදු 15 දක්වා කාලයක් ගත වී තිබුණද ගෙවීම් සිදුකර නොතිබූ රු. 29,601,872 ක් වූ සාමාන්‍ය ප්‍රතිලාභ ඉල්ලුම්පත් 146 ක්ද රු. 7,759,608 ක් වූ මරණ ප්‍රතිලාභ ඉල්ලුම්පත් 30 ක්ද පැවති බව නියැදි පරීක්ෂාවකදී අනාවරණය වී තිබුණි.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

### 4.2.1 භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ ප්‍රධාන ආයෝජන මාර්ගයක් ලෙස සැලකෙන අවදානම් අඩු භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙළෙඳපොළ ආයෝජනයන් 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී සියයට 50 කින් අසාමාන්‍ය ලෙස අඩුවී තිබුණි. එමෙන්ම අරමුදල ද්විතියික වෙළෙඳපොළ ආයෝජනයන්ගෙන් 2016 මැයි මාසයෙන් පසුව සම්පූර්ණයෙන්ම ඉවත් වී තිබුණි. එබැවින් 2015 වර්ෂයේ දී රු.බිලියන 318 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කරවල මුළු ආයෝජනය 2016 වර්ෂය අවසන් වන විට රු.බිලියන 183 ක් දක්වා හෙවත් සියයට 42 කින් අඩු වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| | ප්‍රාථමික වෙළෙඳපොළ ආයෝජනය | | | ද්විතියික වෙළෙඳපොළ ආයෝජනය | | | භාණ්ඩාගාර |
|---|---|---|---|---|---|---|---|
| | පළමු අර්ධ වර්ෂය | දෙවන අර්ධ වර්ෂය | මුළු ආයෝජනය | පළමු අර්ධ වර්ෂය | දෙවන අර්ධ වර්ෂය | මුළු ආයෝජනය | බැඳුම්කර මුළු ආයෝජනය |
| | (රු.බි) | (රු.බි.) | (රු.බි) | (රු.බි) | (රු.බි.) | (රු.බි) | (රු.බි) |
| 2015 | 110 | 124 | 234 | 17 | 67 | 84 | 318 |
| 2016 | 57 | 60 | 117 | 66 | - | 66 | 183 |
| **අඩුවීම** | | | **117** | | | **18** | **135** |
| **අඩුවීමේ ප්‍රතිශතය** | | | **50%** | | | **21.4%** | **42%** |

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව 2015 වර්ෂයට සාපේක්ෂව 2016 දී පරිණත වූ බැඳුම්කරවල වටිනාකම අඩු මට්ටමක පැවතීමත් ශුද්ධ සාමාජික ලැබීම් විශාල ලෙස අඩු වීමත් බැඳුම්කර ආයෝජන අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණු බව දන්වා තිබුණි.

(ආ) 2016 මාර්තු 29 දින පැවති රු.මිලියන 40,000 ක බැඳුම්කර නිකුතුවේදී අරමුදල විසින් ප්‍රාථමික වෙළඳපොළට මිල ගණන් ඉදිරිපත් කිරීම් ඉතා අවම මට්ටමක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංකය(ISIN) | මිල ගණන් කැඳවූ මුළු වටිනාකම (Amount Offered ) | ඵලදා අනුපාතය | මිල ගණන් ඉදිරිපත්කරනලද මුළුවටිනාකම | පිළිගත් බැඳුම්කර වල මුළුවටිනාකම (Amount accepted) | සේවක අර්ථ සාධක අරමුදල | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මිල ගණන් ඉදිරිපත් කළ වටිනාකම (මුහුණත අගය) | පිළිගත් බැඳුම්කර වටිනාකම (මුහුණත අගය) | මිල ගණන් ඉදිරිපත් කල ප්‍රතිශතය | |
| | | | | | | | මිල ගණන් කැඳවූ බැඳුම්කර වටිනාකම අනුව | පිළිගත් බැඳුම්කර වටිනාකම අනුව |
| | රු.මිලියන | % | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | % | % |
| LKB00520E014 | 10,000 | - | 27,022 | 10,272 | - | - | - | - |
| LKB01025C157 | 10,000 | 13.35 | 36,915 | 21,475 | 1,000 | 1,000 | 10 | 4.66 |
| LKB01226F014 | 10,000 | 13.45 | 32,560 | 17,010 | 500 | 500 | 5 | 2.94 |
| LKB01530E152 | 10,000 | 13.65 } 13.70 | 45,925 | 28,975 | 1,000 | 1,000 | 10 | 3.45 |
| එකතුව | **40,000** | | **142,422** | **77,732** | **2,500** | **2,500** | **6.25** | **3.22** |

(i) උක්ත භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිල ගණන් කැඳවූ මුළු වටිනාකම (Amount Offered) සහ පිළිගත් මුළු බැඳුම්කර වටිනාකම සලකා බැලීමේදී (Amount accepted) අරමුදල විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 6.25 සහ සියයට 3.22 ක් වැනි ඉතාමත් පහළ අගයක් ගෙන තිබුණි. ඒ අනුව උක්ත භාණ්ඩාගාර නිකුතුවේදී අරමුදලේ දායකත්වය ඉතා අවම මට්ටමක පැවතිණි.

(ii) අරමුදල් කළමනාකරණ අංශයේ මධ්‍යම කාර්යාලයේ (middle office) නිර්දේශය අනුව බැඳුම්කර මිලදී ගන්නා දිනට එනම් 2016 අප්‍රේල් 01 දිනට ඇස්තමේන්තුගත මුළු මුදල් ශේෂය වූ රු.මිලියන 8,800 න් රු.මිලියන 4,000 ක් උක්ත බැඳුම්කර නිකුතුව සඳහා යොදා ගැනීමට නිර්දේශ කර තිබුණද සත්‍ය වශයෙන්ම ආයෝජනය කර තිබුනේ ඉන් රු.මිලියන 2,173 ක් පමණක් වුයෙන් අරමුදල එම බැඳුම්කර නිකුතුවේදී සත්‍ය වශයෙන්ම ආයෝජනය කළ වටිනාකම නිර්දේශිත මුදල් ශේෂයෙන් සියයට 50 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) 2016 අප්‍රේල් 01 දිනට අරමුදලේ දෛනික මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිල ගණන් කැඳවූ මුළු වටිනාකමින් (රු.මිලියන 40,000) සියයට 30 ක බැඳුම්කර ප්‍රමාණයක් මිලදී ගැනීමට තරම් ප්‍රමාණවත් රු.මිලියන 12,076 ක අතිරික්ත මුදලක් අරමුදල සතුව තිබියදීත් උක්ත වෙන්දේසියේදී භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමට වෙන්කර තිබුණේ රු.මිලියන 2,173 ක් පමණක් වීමෙන් මිල ගණන් කැඳවූ මුළු වටිනාකමින් සියයට 5 ක් වැනි අවම ප්‍රතිශතයක් සඳහා පමණක් මුදල් යොදවා තිබුණි. ඒ අනුව ඉහල එලදා අනුපාතයන් හෙවත් සියයට 12 ට වැඩි පොළී අනුපාතයන් යටතේ ප්‍රාථමික වෙළඳපොළ තුල ආයෝජනය කිරීමෙන් වැඩි ප්‍රතිලාභයක් අරමුදලට අත්කර ගැනීමේ අවස්ථාව කළමනාකරණය විසින් අහිමි කරගෙන තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව 2016 අප්‍රේල් 01 දිනට තිබූ රු.මිලියන 12,076 ක අතිරික්ත මුදල් දිගුකාලීන මුදල් ආයෝජනයට පමණක් නොව අරමුදලේ මුදල් රැස්කිරීමක් වනතුරු ප්‍රතිලාභ ගෙවීම, අරමුදල් පරිපාලනය සහ වෙනත් වියදම් දැරීම, ප්‍රතිපූරණය හා වෙනත් විකල්ප ආයෝජන සඳහා යොදවා ගත හැකි මුදල් ශේෂය වන අතර එදිනට

අරමුදල විසින් පුරෝකථනය කරන ලද ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය වුයේ රු.මිලියන 8,800 ක් බව දන්වා තිබුණි.

(iv) ඉහත 4.2.1 (ආ) (iii) ඡේදය අනුව ප්‍රාථමික වෙන්දේසියේදී වැඩි ඵලදා අනුපාතයක් යටතේ බැඳුම්කර මිලදී ගැනීමේ හැකියාව තිබියදීත් ඉහත බැඳුම්කර නිකුතුවේදී අඩු බැඳුම්කර ප්‍රමාණයක් මිලදී ගෙන ඉතිරි රු.මිලියන 9,903 සියයට 6.5 සිට සියයට 8 දක්වා වූ අඩු පොළී අනුපාතයක් යටතේ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්වල ආයෝජනය කර තිබුණි. අරමුදල වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවන් පස් දෙනෙකු හරහා මෙම ගනුදෙනු සිදු කර තිබූ අතර ඉන් ඉහළම ප්‍රතිශතයක් එනම් සියයට 61 ක් මතභේදයකට තුඩු දී තිබූ එක් පෞද්ගලික ආයතනයක් හරහා ප්‍රතිමිලදී ගැනීම් සිදුකර තිබුණි.

ඇ) තවද, 2016 අප්‍රේල් 01 දිනෙන් පසු 2016 අප්‍රේල් 12 දින දක්වා කාලසීමාව තුල දෛනික මුදල් ලැබීම් ද්විතියික වෙළඳපොළ හරහා බැඳුම්කර මිලදී ගැනීම හෝ වෙනත් ඵලදායී ආයෝජන මාර්ගයන්හි ආයෝජනය කිරීමක් සිදු නොකර අඩු පොළී ප්‍රතිශතයන් යටතේ එක් දිනයකින් කල් පිරෙන ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම්වල ආයෝජනය කර තිබුණි. එම ප්‍රතිමිලදී ගැනීම් ආයෝජනයන්ගෙන් ද සැලකිය යුතු ප්‍රතිශතයක් (සියයට 61 ත් 94 ත් අතර) මතභේදයකට තුඩු දී තිබූ ඉහත පෞද්ගලික ආයතනයෙන් ප්‍රතිමිලදී ගැනීම් සඳහා යොදවා තිබුණි.

ඈ) වැඩි පොළී ප්‍රතිශතයකට ප්‍රාථමික වෙළෙඳපොලෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිළදී ගැනීමේ හැකියාව තිබියදී එය නොසලකා මතභේදයකට තුඩු දී තිබූ පෞද්ගලික ආයතනයක ප්‍රතිමිලදී ගැනීම් සඳහා අරමුදල් විශාල වශයෙන් යෙදවීම තුළින් අරමුදලේ සාමාජිකයන්ට වැඩි ප්‍රතිලාභයක් අත්කර දීමේ අවස්ථාව මඟ හැර එය පෞද්ගලික ආයතනයකට ලබාදීම සම්බන්ධයෙන් පත්කර තිබූ විශේෂ ජනාධිපති කොමිසමක පවා ප්‍රශ්නකිරීම් වලට ලක්ව තිබුණි.

ඉ) අරමුදල විසින් උක්ත භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවේදී අරමුදලේ මුදල් ඉතා අවම වශයෙන් භාවිතා කර ඉතිරි මුදල් දිගින් දිගටම ප්‍රතිමිලදී ගැනීම් වල ආයෝජනය කරමින් සිට 2016 අප්‍රේල් 12 සිට අප්‍රේල් 25 දක්වා කාල සීමාව තුළ ද්විතියික වෙළෙඳපොළෙන් එම භාණ්ඩාගාර බැඳුම්කරම මිලට ගෙන තිබුණි. ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ

අංක LKB01530E152 දරන බැඳුම්කරයෙන් ප්‍රාථමික වෙළෙඳපොළෙන් ඉතා සුළු ප්‍රමාණයක් මිලට ගෙන එම බැඳුම්කරයෙන් රු.මිලියන 6,373 ක් වටිනා බැඳුම්කර සියයට 12.42 ත් සියයට 12.5 ත් අතර ඵලදා අනුපාතයකට එනම්, ප්‍රාථමික වෙළෙඳපොළට වඩා අඩු අනුපාතයකට මිලදී ගෙන තිබුණි. කෙසේ නමුත් ප්‍රාථමික වෙළෙඳපොළේ ඒ සඳහා සියයට 13.65 ත් සියයට 13.70 ත් අතර ඵලදා අනුපාතයක් ගෙවා තිබුණි. එසේම ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක LKB01226F014 දරන බැඳුම්කරය සඳහා ප්‍රාථමික වෙළෙඳපොළේ සියයට 13.45 ක් වූ ඵලදා අනුපාතයකට වඩා අඩු එනම් සියයට 12.2 ක ඵලදා අනුපාතයකට රු.මිලියන 93 ක් වටිනා බැඳුම්කර ද්විතියික වෙළෙඳපොලෙන් මිලට ගෙන තිබුණි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍ය අධිපතිවරයාගේ අදහස් දැක්වීම අනුව 2016 අප්‍රේල් 12 සිට අප්‍රේල් 25 දින දක්වා කාලපරිච්ඡේදය තුළ සිදුකර තිබූ භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළඳපොළ මිලදී ගැනීම් සඳහා අරමුදල විසින් මුහුණත අගය රු.මිලියන 8,050 ක් වූ භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළඳපොළේ විකුණා තිබුණු බව දන්වා තිබුණි.

(ඊ) 2016 වර්ෂය තුළදී සේවක අර්ථසාධක අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙළෙඳපොළ වෙන්දේසිවල සහභාගීත්වය හා එහි සාර්ථකත්වය පිළිබඳව පහත නිරීක්ෂණ කෙරේ.

(i) 2016 වර්ෂයේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා මිල ගණන් කැඳවූ සාර්ථක කාණ්ඩ අවස්ථා 62 ක් පැවති අතර ඉන් අවස්ථා 16 කදී අරමුදල විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමෙන් සම්පූර්ණයෙන් බැහැර වී තිබුණි.

(ii) අරමුදල විසින් අවස්ථා 19 කදී භාණ්ඩාගාර බැඳුම්කර සඳහා මිලගණන් ඉදිරිපත් කිරීමේදී අතීත අත්දැකීම්, අවබෝධය හා පළපුරුද්ද මත මිල ගණන් ඉදිරිපත් නොකර තර්කානුකූල නොවන ඉහළ ඵලදා අනුපාතයන් යටතේ මිල ගණන් ඉදිරිපත් කිරීම හේතුවෙන් එම මිල ගණන් ප්‍රතික්ෂේප වී තිබුණි.

(ඉ) **ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු**

-----------------------------------

2008 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අරමුදල විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් සහ ද්විතියික වෙළෙඳපොළෙන් මිලදීගත් භාණ්ඩාගාර බැඳුම්කර පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ප්‍රාථමික වෙළෙඳපළ මිලදී ගැනීම් - සෘජු මිලදී ගැනීම් (රු.මිලියන) | ප්‍රාථමික වෙළෙඳපළ මිලදී ගැනීම් - වෙන්දේසි මඟින් මිලදී ගැනීම් (රු.මිලියන) | එකතුව (රු.මිලියන) | මුළු හා.බැ.මිලදී ගැනීම් වල ප්‍රතිශතයක් ලෙස (%) | ද්විතියික වෙළෙඳපළ මිලදීගැනීම් (රු.මිලියන) | මුළු හා.බැ.මිලදී ගැනීම් වල ප්‍රතිශතයක් ලෙස (%) | මුළු හා.බැ. මිලදීගැනීම් (රු.මිලියන) |
|---|---|---|---|---|---|---|---|
| 2008 | 196,634.0 | 5,350.0 | 201,984.0 | **95.20** | 10,184.5 | **4.80** | 212,168.5 |
| 2009 | 228,379.2 | 5,750.0 | 234,129.2 | **98.55** | 3,450.0 | **1.45** | 237,579.2 |
| 2010 | 190,642.5 | 18,766.7 | 209,409.2 | **97.92** | 4,450.0 | **2.08** | 213,859.2 |
| 2011 | 275,063.1 | 23,300.0 | 298,363.1 | **98.91** | 3,300.0 | **1.09** | 301,663.1 |
| 2012 | 320,769.2 | 45,831.8 | 366,601.0 | **99.88** | 450.0 | **0.12** | 367,051.0 |
| 2013 | 333,966.7 | 111,285.0 | 445,251.7 | **92.96** | 33,730.7 | **7.04** | 478,982.5 |
| 2014 | 223,572.0 | 12,000.0 | 235,572.0 | **84.28** | 43,933.1 | **15.72** | 279,505.1 |
| 2015 | 30,796.1 | 186,583.3 | 217,379.4 | **74.19** | 75,631.0 | **25.81** | 293,010.5 |
| 2016 | - | 123,836.0 | 123,836.0 | **65.50** | 65,150.0 | **34.50** | 188,986.0 |

ඉහත තොරතුරු අනුව, සේවක අර්ථසාධක අරමුදල විසින් ප්‍රාථමික වෙළෙඳපොළෙන් භාණ්ඩාගාර බැඳුම්කර මිලදී ගැනීමට විකල්පයක් ලෙස ද්විතියික වෙළෙඳපල හරහා වෙනත් ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් බැඳුම්කර මිලදී ගැනීම් 2013 වර්ෂයේ සිට වැඩි වන

ප්‍රවණතාවයකට නැඹුරුව තිබුණි. එනම් 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සියයට 5 ටත් වඩා අඩු ප්‍රතිශතයක වූ ද්විතියික වෙළෙඳපොළ මිලදී ගැනීම්, 2016 වර්ෂයේ දී සියයට 35 දක්වා වර්ධනය වී තිබුණි.

### 4.2.2 භාණ්ඩාගාර බිල්පත් ආයෝජනය

එමෙන්ම සේවක අර්ථසාධක අරමුදල විසින් 2016 වර්ෂයේදී භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙළෙඳපොල ගනුදෙනු වලට සහභාගී වීමද ඉතා අවම මට්ටමක පැවතිණි. ශ්‍රී ලංකා මහ බැංකු සන්නිවේදන දෙපාර්තමේන්තු තොරතුරු අනුව, 2016 වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 47 ක් පවත්වා තිබූ අතර ඉන් අරමුදල සහභාගී වී තිබුණේ වෙන්දේසි 07 ක් සඳහා පමණි. 2016 මැයි 20 සහ ඔක්තෝබර් 17 දිනැති මුදල් මණ්ඩලයේ තීරණයන් මගින් ප්‍රාථමික වෙළෙඳපොල ගනුදෙනුවලට ප්‍රමුඛතාවය දිය යුතු බව අවධාරණය කර තිබියදීත් හා ක්‍රියාකාරී ලෙස එම ගනුදෙනු වලට සහභාගිවීමට ප්‍රමාණවත් මුදල් අරමුදල සතුව තිබියදීත් අරමුදල විසින් භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසිවලට අවම මට්ටමින් මිල ගණන් ඉදිරිපත් කිරීම මතභේදාත්මක වී තිබුණි.

### 4.2.3 මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 මැයි 20 දිනැති මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ රැස්වීම් අංක 15/2016 දරන සටහනේ නිර්දේශයන්ට අනුව අරමුදල අඩු ඵලදා අනුපාතයක් ලබාදෙන ද්විතියික වෙළෙඳපොළ ආයෝජනයන් අවම කර සාධාරණ ඵලදා අනුපාතිකයක් ලබාදෙන ප්‍රාථමික වෙළෙඳපොළට ප්‍රමුඛතාවයක් ලබා දිය යුතු බවට නියෝගයක් දී තිබුණි. මුදල් මණ්ඩලයේ ඉහත තීරණය අනුව ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු සීමා කිරීමට නිර්දේශ නිකුත් කර තිබුණද, භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සඳහා වන ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු වලින් සම්පූර්ණයෙන් බැහැර වීම සඳහා අනුමැතිය ලබා දී තිබුණේ ඉන් මාස 5 කට පසු එනම් 2016 ඔක්තෝබර් 17 දිනැති රැස්වීම් අංක 31/2016 දරන මණ්ඩල සටහන මගිනි. කෙසේ නමුත් ඊට පෙර 2016 මැයි 20 දිනෙන් පසු අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු වලින් සම්පූර්ණයෙන්ම ඉවත් වී තිබීම ගැටළු සහගත වී තිබුණි.

(ආ) 2016 මැයි 20 දිනෙන් පසු අරමුදල විසින් භාණ්ඩාගාර බැඳුම්කර ද්විතියික වෙළෙඳපොළ ගනුදෙනු වලින් සම්පූර්ණයෙන්ම ඉවත් වීමේ තත්ත්වය තුළ අරමුදලේ දෛනික මුදල් ශේෂයන් ආයෝජනය කළ යුතු විකල්ප ආයෝජන මාර්ගයන් පිළිබඳව ගැටළුකාරී තත්ත්වයක් ඇතිවී තිබුණි. 2016 මැයි 20 දිනෙන් පසුව පැවති භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රාථමික වෙළෙඳපොළ වෙන්දේසි අවස්ථා 9 කදී රු.මිලියන 116,000 ක් සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණද, එමගින් සාර්ථකත්වයක් ලබා ගත හැකි වූයේ රු.මිලියන 72,000 ක් සඳහා පමණි. එසේම 2016 සැප්තැම්බර් 29 සිට 2016 දෙසැම්බර් 27 දක්වා කාලසීමාව තුළ භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි මගින් ප්‍රාථමික ගනුදෙනුකරුවන්ට බැඳුම්කර නිකුත් කර නොතිබීම හේතුවෙන් 2016 නොවැම්බර් හා දෙසැම්බර් මාස වලදී සේවක අර්ථසාධක අරමුදලට භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනයන් සිදුකිරීමට නොහැකි වී තිබුණි.

### 4.2.4 සමාගම් කොටස්වල ආයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2015 වර්ෂයන්හිදී පිළිවෙලින් රු. මිලියන 79,874 ක් හා රු. මිලියන 83,573 ක් සමාගම් කොටස්වල අරමුදල් ආයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| | 2016 (රු. මිලියන) | 2015 (රු. මිලියන) |
|---|---|---|
| (i) <u>ලාභාංශ ආදායම</u> | | |
| සාමාන්‍ය කොටස් - ලැයිස්තුගත | 2,104 | 2,361 |
| - ලැයිස්තුගත නොකළ | 2,029 | 1,014 |
| වරණීය කොටස් - ලැයිස්තුගත | 130 | 137 |
| (ii) <u>ප්‍රාග්ධන ලාභ/(අලාභ)</u> | | |
| විකිණීමට තබා ඇති සාමාන්‍ය කොටස් | 461 | 527 |
| සාමාන්‍ය කොටස් - සාධාරණ අගයට ලාභ හො අලාභ තුළින් | (9) | 26 |
| (iii) ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වලින් ලත් ශුද්ධ ආදායම - ලැයිස්තුගත කොටස් | (258) | (237) |
| (iv) හානිකරණ අලාභ(ලයිස්තුගත හා ලැයිස්තුගත නොකළ) | (5,232) | (2,957) |

| | | |
|---|---|---|
| | (775) | 871 |
| (v) විකිණීමට ඇති මූල්‍ය වත්කම් වල ශුද්ධ අලාභ | (3,364) | (5,181) |
| | **(4,139)** | **(4,310)** |
| | ===== | ===== |
| **මුළු කොටස් ආයෝජනය** | 79,874 | 83,573 |

අරමුදලේ කොටස් ආයෝජනයෙන් 2016 හා 2015 වර්ෂයන්හි දී පිළිවෙලින් රු. මිලියන 4,139 ක් හා රු. මිලියන 4,310 ක විශාල පාඩුවක් දරා තිබුණි. ඒ අනුව 2016 වර්ෂයේදී රු. මිලියන 79,874 ක් හා 2015 දී රු. මිලියන 83,573 ක් වූ අරමුදලේ මුළු ආයෝජන වෙනුවෙන් කිසිදු දායකත්වයක් අරමුදලට ලැබී නොතිබූ අතර අරමුදලේ සංචිත තවදුරටත් අඩුවීමට කොටස් ආයෝජනයෙන් සිදු වී ඇති අලාභයන් දැඩි ලෙස බලපා තිබුණි.

(ආ) අරමුදල විසින් දිගුකාලීනව මුදල් ආයෝජනය කර තිබුණු සමාගම් 06 ක කොටස් වෙළඳපොළ මිල එහි පිරිවැයට සාපේක්ෂව ප්‍රමාණාත්මකව අඩුවීම නිසා රු. මිලියන 5,232 ක හානිකරණ අලාභයක් 2016 වර්ෂයේදී අරමුදලට සිදුවී තිබුණි. ඉන් සියයට 36 ක්ම එක් සමාගමක කොටස් මිල පහළයෑමෙන් සිදුවූ අලාභයක් විය. එසේම එක් සමාගමක සිදු කර තිබූ ආයෝජනයේ සාධාරණ අගය ප්‍රමාණාත්මකව එනම් සියයට 56 කින් පමණ අඩු වී තිබුණද හානිකරණය යටතේ එය හඳුනාගෙන නොතිබුණි.

**4.3 ප්‍රමාද වූ ව්‍යාපෘති**

------------------

අරමුදල වෙනත් රාජ්‍ය ආයතන දෙකක් සමඟ එක්ව රු.බිලියන 12 ක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් යටතේ අලුතින් ඉදිකිරීමට නියමිත හෝටල් සංකීර්ණයක ආයෝජන කටයුත්තකට සම්බන්ධ වී තිබුණ අතර 2013 වර්ෂය අවසානයේදී අරමුදලෙන් රු.බිලියන 5 ක් ඒ සඳහා යොදවා තිබුණි. ඒ වෙනුවෙන් 2013 ජූනි 04 දින අත්සන් කරන ලද කොටස් හිමියන්ගේ ගිවිසුම අනුව මෙම සමාගමේ කොටස් 2015 අවසන් වීමට පෙර කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත කිරීමට තීරණය වී තිබුණත්, ඉදිකිරීම් ප්‍රමාදවීමෙන් එම කටයුතු 2017 ජූනි අවසන් වන විටත් අවසන් වී නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 හා 2015 වර්ෂයන්ට අදාලව අරමුදලේ ඒක සේවක පිරිවැය පහත දැක්වේ.

| | 2016 වර්ෂය | | 2015 වර්ෂය | |
|---|---|---|---|---|
| | කම්කරු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහ බැංකුව | කම්කරු දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා මහ බැංකුව |
| වැටුප් පිරිවැය (රු'000) | 385,175 | 477,974 | 342,558 | 405,941 |
| තථ්‍ය සේවක සංඛ්‍යාව | 281 | 184 | 244 | 154 |
| ඒක සේවක පිරිවැය (රු'000) | 1,364 | 2,598 | 1,404 | 2,636 |
| ශ්‍රී ලං. ම. බැංකුවේ ඒ.සේ.පි. වැඩිවීම (%) | 90 | | 88 | |

සේවක අර්ථසාධක අරමුදලේ කම්කරු දෙපාර්තමේන්තුවේ ඒක සේවක පිරිවැය සමඟ සසඳා බලන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් අංශයේ ඒක සේවක පිරිවැය 2016 වර්ෂයේදී සියයට 90 කින්ද, 2015 වර්ෂයේදී සියයට 88 කින් ද, වැඩිවීමක් සිදුව තිබුණි. මීට ප්‍රධාන වශයෙන් කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වැටුප් අතර පවත්නා වැටුප් විෂමතා බලපා තිබුණි.

(ආ) 2016 වර්ෂය අවසානය වනවිට අරමුදලට අදාලව කම්කරු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු 76 ක් පැවති අතර එය මාණ්ඩලික ශ්‍රේණියේ 18කින් හා මාණ්ඩලික නොවන ශ්‍රේණියේ 58 කින් සමන්විත විය. ජ්‍යෙෂ්ඨ තනතුරුවල පුරප්පාඩු පැවතීම අරමුදල් නිරවුල් කිරීම්, නීතිමය ක්‍රියා මාර්ග ගැනීම් ප්‍රමාද වීම කෙරෙහි ඍජුවම බල නොපෑවේය යන්න බැහැර කළ නොහැකිවිණි.

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 විගණන කමිටු

අරමුදලට අදාලව විගණන කමිටු රැස්වීම් කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතන හා එක්ව පවත්වනු ලැබේ. ඊට අමතරව කම්කරු දෙපාර්තමේන්තුව යටතේ වෙනම විගණන කමිටුවක් පැවැත්වුවද, ඊට අරමුදලේ මූල්‍ය පරිපාලන කටයුතු සිදු කරනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුව හා එහි අභ්‍යන්තර විගණකයින්ගේ සහභාගිත්වයක් නොතිබුණි. රුපියල් බිලියන 1,811 ක් පමණ වූ අරමුදලක් වෙනුවෙන් වෙනම විගණන කමිටුවක්, අරමුදලේ කටයුතු සඳහා අනුයුක්ත කර සිටින කම්කරු දෙපාර්තමේන්තුවේ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කල යුතුව ඇත.

5.2 නොවිසඳී ඇති විගණන ඡේද

රාජ්‍ය ගිණුම්කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වර්තමාන තත්ත්වය පහත දැක් වේ.

| නිර්දේශ අංකය | නිර්දේශය හා වර්තමාන තත්ත්වය |
| --- | --- |
| 2014 අගෝස්තු 19 අංක 07 (03) | සමාගමක් ඈවරකරණයේදී එම සමාගමින් අයවිය යුතු සේවක වන්දි අයකර ගැනීමට ප්‍රමුඛත්වයක් දීම සඳහා පවතින නීතිය සංශෝධනය කිරීමට දෙන ලද උපදෙස් ප්‍රකාර, අදාල කටයුතු සඳහා නීති කෙටුම්පත් දෙන ලද සම්පාදකගෙන් අනුමැතිය ලැබී ඇතිබව කමිටුවට දැන්වුවද, සංශෝධිත පනත 2017 අගෝස්තු අවසන් වන විටත් අනුමත වී නොතිබුණි. |
| 2016 පෙබරවාරි 26 අංක 08 | සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා සියලු ආයතන ඒකාබද්ධව ඉදිරි වසර 10 සඳහා විධිමත් සැළැස්මක් සකස් කලයුතු බවට උපදෙස් ලබා දුන්නද එම කටයුතු 2017 අගෝස්තු අවසන් වනවිටත් නිම වී නොතිබුණි. |

| | |
|---|---|
| 2016 පෙබරවාරි 26 අංක 09 | අරමුදලේ තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව හා මහ බැංකුව සම්බන්ධ වී එක් පරිගණක වැඩසටහනක් සකස් කිරීමේ හැකියාව පිළිබඳව වාර්තාවක් 2016 මාර්තු 23 දිනට පෙර කාරක සභාවට යොමු කරන ලෙස උපදෙස් ලබා දුන්නද එවැනි වාර්තාවක් 2017 අගෝස්තු අවසන් වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

**5.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

අරමුදලේ පරිපාලන කටයුතු සිදුකරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 08 ක් හා තථ්‍ය සංඛ්‍යාව 06 දෙනෙකුට සීමාවී තිබුණි. දෙපාර්තමේන්තුව සතුව ප්‍රාදේශීය කාර්යාල 57 ක් පැවතීම හා සිදුවන ගනුදෙනුවල ප්‍රමාණය අනුව අනුමත සංඛ්‍යාව ප්‍රමාණවත් නොවිනි. දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනය ශක්තිමත් කළයුතු බවට 2013 වර්ෂයේ සිට දිගින් දිගටම රාජ්‍ය ගිණුම්කාරක සභා රැස්වීම් වලදී සාකච්ඡා කර තිබුණද, ඒ අනුව ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කර විගණනයක් සිදු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති පාලන වල අඩුපාඩු කම්කරු කොමසාරිස් ජනරාල් සහ ශ්‍රී ලංකා මහ බැංකු අධිපති වෙත වරින් වර දන්වන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මෙහෙයුම් පාලනය | (i) අරමුදලේ සාමාජිකයන්ගේ පෞද්ගලික ගිණුම්වලට මේ දක්වා බැරවී නොමැති දායක මුදල් ඔවුන්ගේ ගිණුම්වලට කඩිනමින් බැරකිරීමට හා රඳවාගත් ප්‍රතිලාභ අදාල හිමිකරුවන්ට අප්‍රමාදව ගෙවීමට වැඩ පිළිවෙලක් සකස් නොකිරීම. |

(ii) අරමුදල වෙනුවෙන් වෙනම විගණන කමිටුවක් නොපැවැත්වීම

| | |
|---|---|
| (ආ) ආයෝජන පාලනය | සැමවිටම අරමුදලට හා සාමාජිකයන්ට ඉහළ ප්‍රතිලාභයක් ලැබෙන පරිදි අරමුදල් ආයෝජනය නොකිරීම. |
| (ඇ) අභ්‍යන්තර විගණනය | අභ්‍යන්තර විගණනයට ප්‍රමාණවත් හා සුදුසුකම් ලත් කාර්ය මණ්ඩලයක් බඳවා නොගැනීම හා සියළුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනය සිදු නොකිරීම. |

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති